# ඉස්ලාම් ශිෂ්ටාචාරය



## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

### 13 ශ්‍රේණිය

ආගම් දෙපාර්තමේන්තුව
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ඉස්ලාම් ශිෂ්ටාචාරය

13 ශ්‍රේණිය

**ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය**

(2010 සිට 13 ශ්‍රේණිය සඳහා)

ආගම් දෙපාර්තමේන්තුව,
විෂයමාලා සංවර්ධන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය,

© ජාතික අධ්‍යාපන ආයතනය

පළමුවන මුද්‍රණය 2010

**ඉස්ලාම් ශිෂ්ටාචාරය**
13 ශ්‍රේණිය

ආගම් දෙපාර්තමේන්තුව,
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

*මුද්‍රණය*

# පෙරවදන

නිපුණතා පාදක විෂයමාලාව පාසල් පද්ධතියට හඳුන්වාදීමේ කාර්යය 13 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හඳුන්වා දීමත් සමඟ සම්පූර්ණ වේ. 12 වන හා 13 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පවතින දැඩි තරගයට ගොදුරුවීම නිසා නිරන්තරව ම යම් තරමක පීඩනයකට යටත් වේ. නව විෂයමාලාව ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙ.) සඳහා යොදා ගැනෙන විට මෙම පීඩනය තවත් දැඩි වේ. එවැනි අවස්ථාවක ඔබ අතට පත්වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ තරමට ම ගුරුවරුනට වැදගත් වන්නේ ය. මෙහි මූලිකව ම ගුරුවරයා සැලකිල්ලට ගත යුතු පැති තුනක් ඇත. එනම් ගුරු මාර්ගෝපදේශ, විෂය නිර්දේශය හා පූර්ණව ගැළපී තිබීම, විෂයමාලාවේ අනපේක්ෂිත නිපුණතා පාදකව විෂයමාලාවේ දර්ශනය හා දැක්ම මුල්කොට ගෙන සකසා තිබීම හා 12 - 13 ශ්‍රේණිවල දරුවාගෙන් අපේක්ෂිත සාධන මට්ටම මෙනෙහි කොට සකසා තිබීම. එහෙයින් මෙය හොඳින් පරිශීලනය කිරීම ගුරුවරයාට අත්‍යවශ්‍ය කාර්යයක් හා වගකීමක් වන්නේ ය.

ජාතික අධ්‍යාපන ආයතනය ඉහත කී කරුණු තුන ම ඔබගේ අවධානයට ගෙන ඒම සඳහා 13 වන ශ්‍රේණිවල ඉගැන්වීම් කරන සියලුම ගුරුවරුනට ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සඳහා ද ක්‍රියාත්මක වී සිටී. නිරන්තරව පැවැත්වෙන මෙම පුහුණු සැසිවලට අදාළ ගුරුවරුන් සහභාගී වීම අතිශයින් ම අවශ්‍ය කරුනක් වන්නේ මෙහි දැක්වෙන ඉගෙනුම් - ඉගැන්වීම් මූලධර්ම හා ක්‍රියාදාම වටහා ගැනීමට පුහුණුව බෙහෙවින් ඉවහල් වන නිසා ය. විශේෂයෙන් ම පාසල් පාදක ඇගයීම් ක්‍රියා, නිපුණතා වර්ධනය සඳහා ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. විෂය කරුණුවලට පමණක් ඉගැන්වීම යටත්වීමට නොදී සිසුනගේ කුසලතා ඔප ගැන්වීමේ අභිලාෂය ඉටුකරදීමට මේ සියලු මැදිහත්වීම් අවශ්‍ය බව අධ්‍යාපන හා ඇගයීම් කාර්යයේ නියැලෙන අප සියලු ම දෙනා වටහා ගත යුතු වේ.

ගුරු මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ අතිශය වෙහෙසකාරී කාර්යය ඉටුකරලීමට මැදිහත් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම ශාස්ත්‍රීය අංශවල නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා බාහිරව ඒ සඳහා දායක වූ විද්වත් හැම දෙනාට ම ද මාගේ විශේෂ ස්තුතිය හිමි වේ.

**මහාචාර්ය උපාලි එම්. සේදර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංදේශය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන් හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. මෙහි දැක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදී ම සාක්ෂාත් කර ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම්විට ඒ සඳහා බොහෝ කලක් ගතවිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැළසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම්ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම් ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන් ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත්පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිත ව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලී වීම අවශ්‍ය වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගෙනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිළි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේනම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දෙශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ශණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මගේ ස්තූතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදුකර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වෙමි.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, ආගම්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

# ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශනය** | **:** | ආචාර්ය උපාලි එම්. සේදර<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විමල් සියඹලාගොඩ මයා<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ආගම්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **අධ්‍යක්ෂණය** | **:** | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>අධ්‍යක්ෂ (ආගම්) ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විෂය උපදේශකත්වය** | **:** | ආචාර්ය එම්. ඒ.එම්. ෂුක්රි,<br>අධ්‍යක්ෂ, නලීමියා ඉස්ලාමීය ආයතනය, බේරුවල.<br>අෂ්ෂේක්, ඒ. සී. අගාර් මුහම්මද්,<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නලීමියා ඉස්ලාමීය ආයතනය,බේරුවල.<br>එම්. අයි. එම්. අමීන්<br>හිටපු අරාබි ඉස්ලාමීය ශිෂ්ටාචාර දෙපාර්තමේන්තුව,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>මව්ලවි එම්. එච්. එම්. ලාෆිර්,<br>නියෝජිත, ජම්ඉය්යතුල් උලමා සභාව |
| **සම්බන්ධීකරණය** | **:** | එස්. එම්. ආර්. සුදීන්<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **ලේඛක මණ්ඩලය** | **:** | අෂ්ෂේක් එම්. එස්. අබ්දුල් බාරි<br>එම්. එච්. එම්. නාලිර්<br>අෂ්ෂේක් එම්. එච්. එම්. බුහාරි<br>එස්. එම්. ආර්. සුදීන්<br>එම්. එස්. එම්. අනස්<br>එම්. එස්. එම්. බුසරි |
| **සංස්කරණය** | **:** | එස්. එම්. ආර්. සුදීන්<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>අෂ්ෂේක් එම්. එච්. එම්. බුහාරි |
| **පරිවර්තනය** | **:** | එස්. ඒ. සී. එම්. කරාමත්<br>ආචාර්ය එම්. එම්. එම්. නාජිම්<br>එම්. එච්. එම්. යාකූත් |
| **භාෂා සංස්කරණය** | **:** | එම්. එච්. එම්. යාකූත්<br>ආචාර්ය එම්. එම්. එම්. නාජිම් |
| **පරිගණක සැකසුම** | **:** | නිල්මිණි බටවල |
| **පිටකවරය** | **:** | එම්. ඩබ්ලිව්. ඒ. අසාර් |

# 1.0 හැඳින්වීම

මිනිසා සමාජානුයෝජනය කරන සාධක අතරෙන් අධ්‍යාපනයට ප්‍රධාන තැනක් හිමි වේ. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ආගමට වැදගත් තැනක් ලැබේ. එහෙයින් ආගම හා අධ්‍යාපනය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවී ක්‍රියා කරයි.

ඉස්ලාම් ජීවන ක්‍රමයක් ලෙස, මුස්ලිම්වරුන්ගේ ජීවිතය ගොඩනැගීම කෙරෙහි ද, ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද, සංවිධානය කිරීම කෙරෙහි ද පූර්ණ බලපෑමක් ඇති කරයි. එය විෂයයක් ලෙස සැලකූව ද, ජීවිතය සඳහා වූ මඟ පෙන්වීමක් ලෙස ඉගැන්විය යුතු ය. පොදුවේ මිනිස් සමාජය ද විශේෂයෙන් තරුණ පරම්පරාව ද ආගම බැහැර කරමින් ජීවත් වන අද වැනි යුගයක ආගමේ අවශ්‍යතාව ද, වැදගත්කම ද, සිසුන්ගේ සිත් තුළ ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා සකස් කර ඇති මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ දායකත්වය කාර්යක්ෂම වීම අවශ්‍ය ය. මෙය සිද්ධාන්තමය වශයෙන් පමණක් නොව ක්‍රමවේද, ආදර්ශ වැනි ක්‍රම මගින් ද ඉදිරිපත් විය යුතු ය.

බහු වාර්ගික සමාජයක සුළුතර සමාජයක් ලෙස ජීවත්වන අපට ඉස්ලාම් විෂය උපදේශනය ඉස්ලාමයේ අනන්‍යතාව රකින අතර අන් ආගම් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් ජීවත් වීමට මඟපාදන එකක් ද විය යුතු ය. ඒ නිසා බහුවාර්ගික සමාජ පිළිබඳ ව දැනගැනීමට අවස්ථාවක් මෙම විෂය නිර්දේශය තුළින් ලබා දී ඇත.

ආගම, කලා විෂය ධාරාවට අයත් විෂයයක් ලෙස සලකනු ලැබූව ද ජීවිතයට සෘජුව සම්බන්ධ වන කරුණු එහි ඇතුළත් හෙයින් සියළු අංශවල සිසුන් ආගම විෂයය කෙරෙහි, විශේෂයෙන් ඉස්ලාම් විෂය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ඉස්ලාම් උගන්වන ගුරුවරුන්ගේ කැපවීමත් නොමසුරු වෑයමත් මේ සඳහා අවශ්‍ය වන්නේ ය. ඒ අනුව විෂයය උගන්වන ගුරුවරුන්ගේ පූර්ණ කැපවීමත් දායකත්වයත් අපේක්ෂා කෙරේ.

මෙම විෂයය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුළුල් ලෙස ගවේෂණ කාර්යයේ යෙදිය යුතු අතර සිසුන්ගේ දැනුම කුසලතා ආකල්ප සහ ක්‍රියා කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරන ක්‍රියා මාර්ග භාවිතා කළ යුතු වේ. මෙමඟින් ඉස්ලාමීය දැනුම, පුහුණුවෙන් හෙබි සිසු පරපුරක් ඇති කිරීමට හැකි වන අතර රටට වැඩදායී පුරවැසියන් ලෙස ඔවුන් බිහි කර ගැනීමටත් හැකි වේ යැයි අප තරයේ විශ්වාස කරමු.

# පටුන

පිටුව


- පෙරවදන
- සංඥාපනය
- ග්‍රන්ථ ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය
- හැඳින්වීම
- ලේඛක මණ්ඩලය
- විෂය කරුණු අවබෝධ කර ගැනීමට අත්වැලක්
- පාසල් පාදක ඇගයීම - හැඳින්වීම
- පාසල් පාදක ඇගයීම් උපකරණ

**නිපුණතාව 7.0** : **ඉස්ලාමයට පෙර යුගයේ පැවති සමාජ, සංස්කෘතික, දේශපාලන තත්ත්ව හඳුනා ගනිමින් ජාහිලියියත්වයෙන් වැලකී ක්‍රියා කරයි.**

**නිපුණතා මට්ටම 7.1** : නබි (සල්) තුමා නුබුව්වත් ලැබීමට පෙර පැවති අරාබි රටේ ආගමික, සාමාජයීය, ආර්ථික, දේශපාලන තත්ත්වය ඓතිහාසික ව ගවේෂණය කරයි.

**කාලය** : කාලච්ඡේද 30

**ඉගෙනුම් ඵල** :
- ඉස්ලාමයට පෙර සමයේ අරාබි ජනතාවගේ ජීවන ක්‍රමය විස්තර කර ලියා දක්වයි.
- ජාහිලිය්යාවරුන්ගේ අනිසි ජීවිතයට හේතු හඳුනාගෙන කථා පවත්වයි.
- නූතන ජීවිතයට පටහැනි දෑ දැන ඉන් වැලකී සිටියි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### අරාබි දේශයේ භූගෝලීය ඉතිහාසය

- **භූගෝලය**
  - ලෝක සිතියමේ උපකාරනේ එදා පැවති අරාබි දේශය හඳුනා ගැනීම
    * අරාබි දේශයේ සීමාවන්, භූගෝලීය තත්ත්වය, විවිධ ප්‍රදේශ (හිජාස්, යමන්, නජීද්, උම්මාන්, හලරමවත්)
    * අන්‍ය සංස්කෘතීන් ඇතුළුවීම වළක්වනු වස් ඇති කළ තහනම් සීමාවන් හා දේශගුණය පිළිබඳ විචාරාත්මක විස්තරය
    * උතුරු අරාබියේ හා දකුණු අරාබියේ භූගෝලීය විෂමතා
- **ඉතිහාසය**

  අරබා යන සෙමිතිය භාෂාවේ කාන්තාරය ද, හීබ්‍රෑ භාෂාවේ වනාන්තරය ද, අරාබි භාෂාවේ කථිකත්වය ද හඳුන්වයි. ලොව ජීවත්වන සියලු මිනිසුන්ට වඩා උසස් කථිකත්වයක් තමන්ට ම හිමි වී ඇතැයි අරාබිවරු ආඩම්බර වූහ. එබැවින් අරාබිවරු යැයි තමන් ව හැඳින්වූහ.

  - නූහ් (අලෛ) පුතා වන සාම් නැමැත්තාගේ පරම්පරාවෙන් පැවැතෙන්නන් සාමියුන් නම් වේ. සෙමිතියා (Semitic) වරුන් ලෙස හඳුන්වන්නේ ද සාමියුන් වරුන්ම ය.
  - සෙමිතියාවරු අරාබි දේශයේ ජීවත් වූහ. අනතුරු ව ජීවන පහසුකම් ඌන බැවින් උතුරු නැගෙනහිර ප්‍රදේශ කරා සංක්‍රමණය වූහ. අරාබි දේශයේ ආදිවාසීන් වන්නේ ඔවුන් ය. අරාබිවරු ජනාවාස වූ කාලවකවානුවට අනුකූල ව කොටස් තුනකට වෙන් කර දක්වයි.

    (අ) අරබුල් බාඉදා (පෞරාණික අරාබිවරු)

    ආද්, සවුද්, අමාලිකා, ජීදිස්, හුහ්ම් යන කණ්ඩායම් මෙහි අන්තර්ගත වේ. ඉඩෝරය, දුර්භික්ෂය, අක්‍රමිකතා හේතූන් හා කුෂරුල් අහ්මර් යන අයගේ හමුදා මෙහෙයුමක් නිසාද මොවුන් විනාශ විය.

(ආ) අරබුල් ආරිෆා (පාරම්පරික අරාබිවරු)

යුප්‍රටීස් නදියේ නැගෙනහිර දෙසින් පැමිණ යමන්, හලරමව්ත් යන ප්‍රදේශවල පදිංචි වූහ. කහ්තාන් කණ්ඩායම ද මෙයට අයත් වේ. නූහ් (අලෛ) තුමාගේ මී මුණුබුරා වන තහ්දූන්ගේ පුත් යරබ්, ඔහුගේ පුතාවන සබා, සබාගේ පරපුර සාබියූන් ලෙස හැඳින්වේ. යරබ් ගේ තවත් පුතෙකු වන්නේ ජුර්හම් ය. මොවුන් හිජාසයේ පදිංචි වූහ. අනෙක් පුතා වන්නේ හිමියර් ය. මොහුගේ පරම්පරාව යේමනයේ පදිංචි වූහ. මොවුන් හිමියාරිවරු ලෙස හැඳින්වේ.

(ඉ) අරබුල් මුස්තඃරිකා (පසුව පදිංචි වූ අරාබිවරු) ඉස්මාඊල් (අලෛ) ගේ පරපුරට මොවුන් අයත් වේ. පලස්තීනයේ සිට පැමිණි ඉස්මාඊල් (අලෛ) තුමා ජුර්හුම් ගෝත්‍රයේ සර්දා නම් කාන්තාව හා විවාහ විය. කුරෙයිෂ්, හුදෙයිල්, කිනානා යන ගෝත්‍ර මේ කොටසට අයත් වේ.

- ඉස්මාඊල් (අලෛ) තුමාගේ පදිංචිය ද පසුව පියා වූ ඉබ්රාහිම් (අලෛ) තුමා හා එක් ව මක්කා කැඛබතුල්ලාහ් ව පුනර්නිර්මාණය කිරීම එතුමාව නායකත්වයට සුදුස්සකු කළේය.
- නබි (සල්) තුමාගේ 11 වන පරපුර වූ ෆිහ්ර් බින් මාලික් නැමැත්තා, ව්‍යාපාරිකයෙකු වූ බැවින් කුරෙයිෂ් නැමැති ගෞරව නාමයෙන් අමතන්නට විය. මොහු ක්‍රි.ව. තුන්වන සියවසේ පළමු දශකයේ ජීවත් විය. මොහුගේ පරපුර කුරෙයිෂිවරු නම් විය. මොහුගේ පරපුරේ බිහිවූ කුංසෙයිබින් කිලාබ් (398 - 480) මක්කාවේ පරිපාලන ක්‍රමයක් බිහිකොට කැඛාව පාලනය කළ අතර, සමාජය ද මෙහෙයවූහ. මෙය නබි (සල්) තුමාගේ සීයා වූ අබ්දුල් මුත්තලිෆ්ගේ යුගය දක්වා පැවැතිණි.

**සමාජ ආර්ථික තත්ත්වය**

- **සමාජය**

  - ඉස්ලාමයට පෙර සිටි ජාහිලියියා සමාජය ගෝත්‍ර වශයෙන් බෙදී සිටියහ. එය බිඳුණු වීදුරුවකට සමාන කෙරේ. ගෝත්‍ර හා පවුල් පැවති නමුත් එහි සමාජය හා ජාතිකත්වයක් දක්නට නොලැබිණි යැයි පැවසේ. අරාබි දේශයේ භෞතික පරිසරය මේ සඳහා බලපා ඇතැයි පැවසිය හැකිය. සම්පත් හිඟය (සතුන්ට අවශ්‍ය තණ හා ජලය සෙවීම) එය ලබා ගැනීම සඳහා තරග කිරීමට සිදුවීම, සතුරන්ගෙන් ආරක්ෂා වීම යනාදිය මෙවැනි තත්ත්වයක් මතු කළේය. ඉන්පසු මෙය වෛරයක් බවට පරිවර්තනය වී සටන් බිහි කළේය.
  - මිනිසුනේ, නිශ්චිත වශයෙන් අප එක් පිරිමියෙකුගෙන් හා කාන්තාවකගෙන් ඔබව මැව්වෙමු. ඔබ එකිනෙකා හඳුනා ගැනීම සඳහා පවුල් වශයෙන් (ෂුඋබ්) යනුවෙන් ගෝත්‍රවල (කබාඉල්) බිහිවීම පිළිබඳ ව අල්කුර්ආන් පවසන්නේ ය.
  - තනි පුද්ගලයන් එක්වී පවුල් වශයෙනුත්, පවුල් එක් වී ෂුඋබ් වශයෙනුත්, ෂුඋබ් එක් වී කබාඉල් වශයෙනුත් විස්තාරණය වී තමන්ව බලවත් කරගන්නා ලදී. උදාහරණ වශයෙන් කුරෙයිෂ් කබීලාහි හාෂිම්, උමයියා, සුහ්රා, අසාද්, අතී, තෙයිම් යනාදී ෂුඋබ් පැවැතිණි.
  - ගෝත්‍ර වශයෙන් පැවැති බැඳීම පසුකලක දී එය හැඟීමක් බවට වර්ධනය විය. මෙය අසබියා යනුවෙන් පැවසේ. සෑම අවස්ථාවකදී ම කොන්දේසිවලින් තොර ව තම ගෝත්‍රයට විශ්වාසවන්තව සිටීම අසබියා ලෙස හැඳින්වේ. ලේ ඥාතීත්වය සෘජු ලෙස ආරක්ෂා කිරීම යන හැඟීමෙන් අසබියා බිහි වූ බවත්, තනි පුද්ගලයා ගෝත්‍රයත්, ගෝත්‍රය තනි පුද්ගලයාවත් ආරක්ෂා කිරීම සඳහා අසබියා බිහි වූ බවත්, අර්ථ දැක්වේ. ඔබේ ගෝත්‍රය කෙරෙහි විශ්වාසවන්ත ව සිටිනු. එහි සාමාජිකයන් කෙරෙහි ගෝත්‍රයට ඇති අයිතිය සැමියෙකු තම බිරිඳ අත්හැරීමට සලස්වන තරම් බලවත් වේ.

- ගෝත්‍ර හා ගෝත්‍රික හැඟීම වර්ධනය වීමේ දී නායකත්වයක් බිහි විය. ගෝත්‍ර නායකයා ෂෙයික් නම් වුනි. මොහු දැනුම, අත්දැකීම්, වීරත්වය, ආධිපත්‍යය, ධනය හා දන්දීම වැනි යහ ගතිගුණවලින් යුක්ත පුද්ගලයන්ගෙන් තෝරාගන්නා ලදී. ඔහු මලඋ නම් සභාවේ සාකච්ඡා කර තීරණ ගනී.

- තණබිම් ආරක්ෂා කිරීම, කඳවුරු බැඳීම, ගැටලු නිරාකරණය, වන්දි ලැබීම ආදී කටයුතු කළේය.

- ආරක්ෂාව උදෙසා බිහි වූ ගෝත්‍ර ක්‍රමය භෞතික පරිසරය හේතුවෙන් සටන්කාමී සමාජ ක්‍රමයක් දක්වා පරිවර්තනය විය. මේ නිසා සටන් ප්‍රධාන කරුණක් බවට පත් විය. වසර 50 ක් තුළ සටන් 132 ක් පැවැති බවට සංඛ්‍යාලේඛන දක්වයි. සුළු කරුණක් වෙනුවෙන් දීර්ඝ කාලයක් සටන් කිරීම ඊට හේතු විය. ඔටුවකුට තුවාල කිරීම හේතු කොටගෙන බක්ර් - තක්ලබ් ගෝත්‍රිකයන් අතර වසර හතලිහක් බසුස් යුද්ධය පැවැතිණි. අශ්ව තරඟ කොන්දේසි කඩකිරීම හේතුවෙන් අබස් - සුෆියාන් ගෝත්‍රිකයන් අතර වසර 40 ක් දාහිස් යුද්ධය පැවතිණි. නින්දිත වචන භාවිතය හේතුවෙන් කිනානා - නිකයිස් ගෝත්‍ර අතර ෆුජ්ජාර් යුද්ධය වසර 10 ක් පැවැතිණි. සටන් සඳහා ම පිරිමින් මෙන් ම සමහර විට ගැහැණුන් ද පුහුණු කරන ලදී. අනිවාර්ය වූ හමුදා සේවයක් පැවතිනි. වීර හැඟීම වර්ධනය කරන ලදී. “අපේ කිසිම නායකයකු නාසයෙන් මරණයට පත්වන්නේ නැත. පළිගැනීමෙන් තොර ව ඝාතනයට ලක් වන්නේ ද නැත” යනුවෙන් ඔවුන්ගේ කාව්‍යයක් පවසයි. සටනක දී ප්‍රාණය ඉවත් වන්නේ නාසයෙන් නොව තුවාලයෙන් බව ඔවුන්ගේ හැඟීමයි. සාමය ඇති කිරීම සඳහා කිසිදු ආයතනයක් නොමැති තත්ත්වයක් තුළ පළිගැනීම විසඳුම විය. අසාධාරණයට ලක් වූ ගෝත්‍රයකට එම අසාධාරණයට මූලික වූ ගෝත්‍රය සටනට කැඳවීම සඳහා ෂෙයික් හෙවත් නායකයාගේ අනුමැතිය අවශ්‍ය වේ. ප්‍රතිවාදී ගෝත්‍ර නායක අනුමැතිය නොදුන් විට පළිගැනීම ක්‍රියාත්මක වේ. දකුණු සේනාංක, වම් සේනාංක, ඉදිරි සේනාංක, පසු සේනාංක, මැදි සේනාංක යනුවෙන් විවිධ හමුදා සේනාංක පවතී. කවියන් විසින් තම ගෝත්‍රයේ උසස් බව විදහා දක්වමින් මදීන් (කීර්තිය) වඩවන කවි කීමත් ප්‍රතිවාදී ගෝත්‍රවල පහත් තත්ත්වය විදහා පාමින් හිජා (වස්කවි) කීමත් සිදුවේ. කාන්තාවන් ඝෝෂා නගමින් උද්‍යෝගිමත් කරයි.

- සටනේ දී අත්අඩංගුවට පත්වන පිරිස වහලුනන් බවට පත් කෙරේ. සටන්වල දී කාන්තාවන් හා දරුවන් දැවීම, ගර්භනියන්ගේ බඩ පැලීම, පුහුණුවීම උදෙසා කුඩා දරුවන් හීයෙන් විද මැරීම, මෘතදේහයන්ට දරුණු ලෙස සැලකීම, ගස් කැපීම, ගොඩනැගිලි විනාශ කිරීම යනාදී දරුණු ක්‍රියාවන් සිදුවිය.

- සමාජය තුළ මත්පැන් භාවිතය, සොරකම, මංකොල්ල කෑම, පළිගැනීම, සූදුව, අනාචාරය වැනි ක්‍රියා ප්‍රචලිත විය. මේවා වැරදි ක්‍රියාවන් ලෙස නොව, ගෞරවාන්විත ක්‍රියා ලෙස සලකන ලදී.

- භාෂා නිපුණත්වය, නිදහස් හැඟීම, වීරත්වය, ආගන්තුක සත්කාර, පොරොන්දු කඩ නොකිරීම, චාම්බව යනාදී යහගුණාංගයන් ද දක්නට ලැබිණි.

- ක්‍රමානුකූල පවුල් ව්‍යූහයක් දක්නට නොලැබිණි. කාන්තාවන්ට පහත් අයුරින් සලකන ලදී. ධනයෙන්, රූපශ්‍රීයෙන් යුත් උසස් කුලයෙන් හෙබි කාන්තාවන්ට සමාජය ගරු කළේය. දර එකතු කිරීම, ජලය රැගෙන ඒම, කිරි දෙවීම, ආහාර පිසීම, රෙදි වියීම, ගිතෙල් හිඳීම, යනාදිය ඔවුන් විසින් ඉටුකරන ලදී. විවාහ වීමේ අයිතිය, දික්කසාද වීමේ අයිතිය, දේපළ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය යනාදිය අහිමි විය.

- විවිධාකාර විවාහ ක්‍රම පැවතිණි. උසස් පුද්ගලයෙක් පිළිපැදි ගිවිසුම් සහගත විවාහය (නිකාහ් අස්සහිහ්) හැර වෙනත් විවිධ විවාහ ක්‍රමයන් පැවතිණි. පිරිමි දරුවන් නොමැති පුද්ගලයන් හොඳ දරු සම්පතක් සඳහා තම බිරිඳන් අන් පිරිමෙන් වෙත යැවීම, 10කට අධික පිරිමින් හා ලිංගික වශයෙන් සම්බන්ධ වී දරුවා බිහිකිරීමෙන් අනතුරුව, මව විසින් ස්ව කැමැත්තෙන් පියා කවරේදැයි තීරණය කිරීම, මුහුණුවර සමාන පිරිමියා පියා ලෙස තීරණය කිරීම, වැඩිමලාගේ බිරිඳ සමඟ බාලයන් කම්සැප විඳීම, බිරිඳ මාරුකොට කම්සැප විඳීම, පියවරුන් විසින් ගැහැණු දරුවන් මාරුකොට විවාහ කරගැනීම, ගෝත්‍රික නායකයා වූ පිරිමියාගේ ඉල්ලීම අත්හළ නොහැකි බැවින් සම්බන්ධ වීම, පියාගේ අනෙකුත් බිරිඳන් ඔහු මියයාමෙන් පසු පුතා විසින් විවාහ කර ගැනීම යනාදිය ඉන් සමහරකි.

- ගැහැණු දරුවෙකු ඉපැදුණු විගස වැළලීමේ චාරිත්‍රය මුලර්, තමීම්, කුලාආ යන ගෝත්‍රවල පැවතිණි. සතුරු ගෝත්‍රවල පීඩාවන්ගෙන් ආරක්ෂාවීම, සටන්වල දී වහලුන් බවට පත්වීම වැළැක්වීම, ඔවුන් රැගෙන තැනින් තැනට යාමේ (අභිගුණ්ඨික ජීවිතය) දුෂ්කරතාවෙන් මිදීම, දුප්පත්කම යනාදිය මෙයට හේතුවන බව පැවසේ. එනමුත් කාන්තාවන් ගරු කිරීමේ චාරිත්‍රය ද පැවතිණි. ඔබලාට ගෞරවාන්විත මාතාවක් ලබා දුන් බව දරුවන්ට පැවසීම, මලාඉකාවරුන් අල්ලාහ්ගේ ගැහැණු දරුවන් ලෙස රූගත කොට දැක්වීම, කාන්තා රූපයට අනුකූලව පිළිම නිර්මාණය කිරීම යනාදිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

- **ආර්ථිකය**

  - අරාබි දේශයේ භූගෝලීය තත්ත්වය එහි ආර්ථිකය කෙරෙහි බලපෑවේ ය. දක්ෂිණ අරාබියාව හා කාන්තාර ක්ෂේම භූමි, වගාබිම් වුණි. වසන්ත කාලයේ වාදී නමින් හඳුන්වන වනගත ප්‍රදේශවල තණකොළ වැවී පශු සම්පත්වල අවශ්‍යතා සපුරණ භූමියක් බවට පරිවර්තනය වේ.

    අරාබියේ උතුරු දෙස හිජාසයේ - රටඉඳි ද, යේමනයේ තිරිඟු හා බාර්ලි, උම්මාන් හි වී නිෂ්පාදනය වේ. තායිෆ් හි එළවළු, ඇපල්, දොඩම්, මිදි, කෙසෙල්, ඇප්රිකොට්, දෙළුම් යන පළතුරු ද නිපදවන ලදී.

  - මක්කා නගරය ශුද්ධ වූ ස්ථානයක් ලෙසත්, වෙළඳ මාර්ග හමුවන කේන්ද්‍රික ස්ථානයක් ලෙසත් පැවැති බැවින් උසස් කුලයේ විශේෂයෙන් වෙළෙඳ කටයුතුවල නිරත වූහ. කඃබාවේ පරිපාලකයන් වූ කුරෛෂිවරුන් උසස් ව්‍යාපාරිකයන් ලෙස වැජඹුණු අතර විදේශ වෙළඳාමේ විවිධ සහනයන් ද ලබා තිබිණි. වර්ෂා කාලයේ යෙමනයටත්, ගිම්හානයේ ෂාම් දේෂයටත් අරාබිවරුන්ගේ වෙළෙඳ කණ්ඩායම් (කරවාන්) ගමන් කළහ. කරවානයේ 2500 ට අධික ඔටුවන් ද, 300කට අධික වෙළෙඳුන් ද වූහ. උක්කාල්, මජන්නා, දුල්මජාස් යන ස්ථානවල වාර්ෂික වෙළෙඳ පොළ පැවැත් වූහ. කාන්තාවන් ද ව්‍යාපාරික කටයුතුවල යෙදුනාහ. කරවානය ආරක්ෂා කිරීම, මගපෙන්වීම, ජලය සැපයීමෙන් උදව් කිරීම වැනි උප රැකියාවන්හි බොහෝ පිරිසක් නිරත වූහ. මත්පැන් නිෂ්පාදනය, රෙදි විවීම, හම් පදම් කිරීම යන හස්ත කර්මාන්තවල ද තායිෆ් වාසීන් නිරත වූහ. පොලී වෙළෙඳාම, ගණිකා වෘත්තිය, කොල්ලකෑම, මසුන් මැරීම, කුකුළු පාලනය යනාදී රැකියාවල ද සමහරු නිරත වූහ. ග්‍රාමීය (බදවි) අරාබිවරු එළුවන් හා ඔටුවන් රැකබලා ගැනීමෙහි බොහෝ විට නිරත වූහ.

- **අරාබි භාෂාව හා සාහිත්‍යය**

  - මේ යුගයේ අරාබි භාෂාව බොහෝ දුරට කථික භාෂාවක් පමණක් විය. ලිඛිත භාවිතය ඉතා දුර්ලභ විය. මේ නිසා මොවුන් උම්මියූන් නමින් අමතන ලදහ. පද්‍ය සාහිත්‍ය (නල්ම්) වර්ධනය වූ තරමට අරාබි ගද්‍ය සාහිත්‍යය (නස්ර්) වර්ධනය නොවීය. සාක්ෂර දැනුම හා

හැකියාව නොමැති වීම මෙයට හේතු විය හැකිය. වනපොත් කිරීමේ හැකියාව පද්‍ය සාහිත්‍ය වර්ධනයට හේතු විය. එලිසම සහිත පද ව්‍යවහාරයන් භාවිතයේ පැවතිණ. විවිධ භාෂාවන් ව්‍යවහාර භාෂාවේ මිශ්‍රව පැවතින. ඓතිහාසික සිදුවීම් පදනම් කොට එය සිදුවිණි. පසු කාලයේ අස්මාඋල් අරබ් (බුෆල්ලල් බින් සලාමා) මජ්මඋල් අම්සාල් (මස්තානි) යනාදිය ප්‍රස්ථාපිරුළු වල ගොනු ලෙස ලැබිණි. එමෙන් ම රුවන් වැකි ද භාවිතයේ පැවතිණි. කුස්ඉබ්නු සාකිදා, අක්සම් බින් සෙයිද්, යන ශ්‍රේෂ්ඨ කථිකයන් ද සිටියෝ ය. මොවුන්ගේ දේශනයන් (කුත්බා) සුප්‍රසිද්ධ ය.

- අරාබි පද්‍ය සාහිත්‍යය කවදා ආරම්භ වූයේ දැයි පැවසිය නොහැක. නමුත් මේ යුගයේ පද්‍ය සාහිත්‍ය වර්ධිත තත්ත්වයේ පසුවිය. ආරම්භයේ තනි කවි වශයෙන් බිහිවී අබ්දුල් මුත්තලිෆ් ගේ යුගයේ කසීදාවන් බිහි වූ බවත් පැවසේ.

- නිමා වූ හා නිමා නොවූ වශයෙන් කාව්‍ය වර්ග දෙකක් ඇත. වනපොත් පහසුවන අයුරින් හා ශබ්ද රසය හා කෙටි පද සහිත කාව්‍යයන් ලෙස සජ්උ වර්ගයේ කාව්‍ය විය. මේවා පද 3 හෝ 4 කින් යුක්ත තාලය සහිතව ගායනය කළ හැකි ලෙසින් තිබිණි.

- සජ්උ හි දියුණු වූ රටාව රේස් නම් වේ. මෙම රටාව පසු කලෙක මුඅල්ලකාත්, මුබ්ලේයාත්, හමෂා යන නමින් ගොනු කරන ලදී. ක්‍රි.ව. 6 වන සියවසේ ජීවත් වූ මුහල්හිල් නැමැත්තා විසින් රජ්ස් වර්ගයේ කාව්‍ය හඳුන්වා දුන් බව පැවසේ.

- තෑගි ලැබීමේ අරමුණෙන් කසීදාවන් ගයන ලදී. මේවා පේලි (අබියාත්) 20 - 100 ක් සමන්විත විය. ඉබ්නු කුස්සුම් ගේ කාව්‍යයන් පේළි 1000 ක් සමන්විත විය. අද එහි පේළි 100 ක් පමණක් දක්නට හැකිය. කසීදාවන් සටන්, ආදරය, කාන්තාර, ඔටුවන් වැනි ඒවා තේමා කොට නිර්මාණය කර ඇත.

- අරාබි සමාජ ක්‍රමය තුළ කවියන්ට වැදගත් තැනක් හිමි විය. සමාජයේ ඔවුනට විශේෂ වූ තත්ත්වයන් ලැබුණි. දේවත්වයේ ආත්මයක් ඔහු තුළ ගැබ් වී ඇති බවට විශ්වාස කළෝය. කවියන් බිහි වූ ගෝත්‍රය එය උත්සව පවත්වා සැමරුවේ ය. මද්හ් (පැසසුම් කවි) හා හිජා (වස් කවි) කීමට ඔහු අවශ්‍ය විය. කවියා ප්‍රචාරකයෙකු ලෙස ක්‍රියා කළේය.

- කාව්‍යත්වය වර්ධනය කරනු වස් එම සමාජය කවීන් අතර විවිධ තරග පැවැත්වීය. වන්දනා සමය ආසන්න වන විට උක්කාල් වැනි වෙළෙඳ පොළෙහි කාව්‍ය තරග පැවැත්වූහ. ජය ලබන කවියන්ට උපහාර පිදීය. උක්කාල්හි ජයගත් කවි ඊජිප්තු සේද රෙදිවල රනින් ලියා කැඩබාහි එල්ලන ලදී. මෙම කාව්‍යයන් ලද කාව්‍යයන් පසුකලෙක සබඅ මුඅල්ලකා නමින් හම්මාද් අල් රාවියා (ක්‍රි.ව. 772) නැමැත්තා විසින් ගොනු කරන ලදී. ඉම්රුඋල් කෙස් (කිතොකෝන්) තරබා (බක්ර්), අමර් ඉබ්නු කුල්සුම් (තක්ලිබ්) අන්තරා (අබස්), සුහෙයිර් (මුජන්නා), ලබීද් (ජඃබර්), සන්බරා (අජීද්), යනාදීන් මුඅල්ලකාහි ලේඛකයන් වේ. මේවා අභිමානය, වීරත්වය, ආදරය, පැසසුම්, දොස්, විවරණ, අසරණ බව යනාදිය ගෙනහැර පෑවේය.

- "කුරෙයිෂිවරුන්ට කාව්‍යයෙන් ප්‍රතිපහර දෙන්න. මන්ද යත් එය ඔවුන්ට හීයටත් වඩා මුවහත්ය." (මුස්ලිම්) යන නබි (සල්) තුමාගේ හදීසයක් "කාව්‍යයක් අරාබි ජනතාවගේ ජීවන සටහනකි" යන උමර් (රළි) තුමාගේ ප්‍රකාශයත්, ඒ යුගයේ කාව්‍යයන්ට හිමි වූ තත්ත්වය ගෙනහැර පාන්නේය.

- ආගම හා සදාචාරය

  - මේ යුගයේ ජීවත් වූ මිනිසුන් අල්ලාහ් ගැන දැන සිටියහ. (නබිවරයාණෙනි) ඔවුන් මවන ලද්දේ කවුරුන් විසින් දැයි විමසූ විට අල්ලාහ් බව ඔවුන් පවසයි. (43:87) අහසත්, පොළොවත් මවා ඉර හඳ වශීකර දුන්නේ කවරෙක් දැයි විමසූ විට, අල්ලාහ් යනුවෙන් නිශ්චිතව ම පිළිතුරු දෙයි. යන අල්කුර්ආන් වැකි මගින් මෙය පෙන්වා දෙයි. යේමනයෙන් සොයාගන්නා ලද සෙල් ලිපි (ක්‍රි.ව. 378, 465, 512) මෙය සනාථ කරයි.

    ඒ යුගයේ කවීන්ගේ කාව්‍යවලත් මේ අදහස් දක්වා ඇත. "ඔබේ සිතේ පවතින රහස් අල්ලාහ්ට වසන් නොකරන්න." යනුවෙන් සුහෙයිර් නැමැති කවියා ගායනා කර ඇත. මිනිසුන්ගෙන් ඉල්ලන දේ ප්‍රතික්ෂේප විය හැකි ය. අල්ලාහ්ගෙන් ඉල්ලන දේ ප්‍රතික්ෂේප නොවේ යනුවෙන් උබෙයිද් නැමැති කවියා ගායනා කර ඇත. බිස්මිල්ලාහුම්ම යනුවෙන් ආරම්භ කිරීමේ පුරුද්ද ඔවුන් අතර තිබිණි. පිළිම විසින් අපව අල්ලාහ්ට සමීප කර තබන බව ඔවුන් පවසන්නේ ය යනුවෙන් අල්කුර්ආන් (39:3) සඳහන් කරයි.

  - එදින හුනෆා නමින් වූ කොටසක් ජීවත් විය. ඔවුන් ඉබ්‍රාහීම් (අලෛ) තුමාගේ ආගම පිළිපදින බව පැවසූහ. පිළිම වන්දනයෙන් ඉවත් ව සිටියහ. මරණයට පත් හා බිලිදුන් සතුන්ගේ මාංශ අනුභවයෙන් වැළකී සිටියහ. ගැහැණු දරුවන් පණපිටින් වැළලීමට එරෙහි වූහ. උබයිදුල්ලා බින් ජෂ්හ්ෂ්, උස්මාන් බින් අබී සුවෙයිරිද්, සෙයිද් බින් අම්ර්, වරකා බින් නව්ෆල්, කුස්බිස් සාඉදා යනාදීන් ඔවුන් අතර සඳහන් කළයුතු සමහර පුද්ලයන්ය. මොවුන්ගෙන් මුල් සතර දෙනා මුෂ්රික්වරුන්ගේ වන්දනයෙන් මිදී තමන් අතර ගිවිසුම් ඇතිකර ගත් පුද්ගලයන් ය. තමන් කිසිදු ආගමක නොමැති බව පවසා සත්‍ය වූ දහමක් සොයමින් පසුවිය.

  - රෝම හා ග්‍රීක සංස්කෘතියේ බලපෑමට ලක් වූ යුදෙව් ආගම අරාබි දේශයට හඳුන්වා දෙන ලදී. ක්‍රි.ව. 44 දී රෝම අධිරාජ්‍යයා විසින් පලස්තීනයේ පැවැති යුදෙව් පැලනය බිඳහෙලූ අවස්ථාවේ යුදෙව්වරු කෛබර්, බිදක්, යස්රිබ් යන ප්‍රදේශවල පදිංචි වූහ. ඔවුන්ගෙන් කෙරුකා, නුලෙයිර්, කුරෙයිලා යන ගෝත්‍ර තුන විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

  - අරාබි රටේ දේශ සීමාවේ ජීවත්වන ලක්ම්, ජහ්ම් යන ගෝත්‍රත්, නජ්ද් හි තෛ ගෝත්‍රයත්, මක්කාවේ අසද් ගෝත්‍රයත්, දක්ෂිණ අරාබියෙහි නාජ්රාන් ප්‍රදේශයේ වැසියනුත් කිතුනුවන් ලෙස ජීවත් විය.

    උතුරු අප්‍රිකාව යටපත් කරගත් රෝම අධිරාජ්‍ය අබිසීනියාව හරහා දකුණු අරාබියට පිවිසීම නිසා එහි ක්‍රිස්තියානි ආගම පැතිරුණි. ෂාම් ප්‍රදේශයට යාබද අරාබි ප්‍රදේශය, බයිසාන්තියේ පාලනයට යටත් ව පැවති නිසා එහි ද කිතුනු දහම පැතිරුණි.

  - පර්සියාවේ පැවැති සෞරස්ට්‍රිය ආගමේ දියුණු ආකාරය වන මජුසියන්වරු, අරාබියේ පර්සියාවේ සීමා ප්‍රදේශයේ දක්නට ලැබිණි. බනු තම්මිවරු මෙය අනුගමනය කළහ. මොවුන් අග්නි (ගින්දර) වන්දනාවේ යෙදුණාහ.

  - මේ හැර අල්ලාහ් විශ්වාස කළ රිසාලතය ප්‍රතික්ෂේප කළ තාරකාව ලාංඡනය කොටගත්, ඉර, බුද, බ්‍රහස්පති, යනාදී ග්‍රහලෝකවලට වැඳුම් පිදුම් පැවැත් වූ සාබිඊන් නමින් හඳුන්වන ධාර්මිකයන් දකුණු අරාබියාවේ ජීවත් විය. "නිශ්චය වශයෙන් ම විශ්වාසය කළා වූ ඔවුන්වත්, යුදෙව්වන් වශයෙන් සිටියා වූ ඔවුන්වත්, සාබිඊන්වරුන්, ක්‍රිස්තියානුවන්, මජුසිවරුන්, අල්ලාහ්ට සමකළවුන් වෙත නිසැකව ම අල්ලාහ් පරලොවදී විනිශ්චය දෙන්නේ ය." (22:17) යන ආයතය ඉහත සඳහන් ආගම් හඳුන්වා දෙන්නේ ය.

එනමුත් අරාබීන් අතර පිළිම වන්දනය ප්‍රචලිත විය. මුහම්මද් (සල්) තුමාණන්ට වසර 400 කට පෙර ජීවත් වූ, පරලොව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ, කෑබාවේ භාරකාර ලෙස කටයුතු කළ අම්ර්බිනු දුහයි අල්කුසාම් නැමැත්තා විසින් මක්කාවේ පිළිම වන්දනය හඳුන්වා දෙන ලදී. ෂාම් දේශයට ව්‍යාපාර කටයුතු උදෙසා ගිය ඔහු, එහි පැවැති පිළිම වන්දනය නිරීක්ෂණය කොට හුබයිල් නැමැති පිළිමය රැගෙන විත් කෑබාවේ තැන්පත් කළේය. ඔහු රැගෙන ආ පිළිමය වන්දනාමාන කිරීමට අකැමැති වූ අනෙකුත් ගෝත්‍රිකයන් තමන් වෙනුවෙන් එකිනෙක පිළිමයන් ගෙනැවිත් තැන්පත් කළහ. මේ නිසා කෑබාව වටේ පිළිම 360 ක් තිබිණි. එකිනෙක ගෝත්‍රයන්ට වෙන් වූ කුල දෙවිවරුන් බිහි කරන ලදී.

| උදා : | පිළිමය | කුලය | ස්ථානය |
|---|---|---|---|
| | ලාත් | සකීබ් | තායිබ් |
| | උස්සා | කුරෙයිෂ් | මක්කාව |
| | මනාත් | අවුස් කස්රජ් | මදීනා |
| | වත් | කල්ජ් | තුමතුල්ජන්දල් |
| | යකූස් | මද්හජ් | යමන් |

පිළිමයන් පමණක් නොව ගල්, අනෙකුත් මැවුම්, කිසිවක් නොමැති විට ආහාර ද්‍රව්‍ය පවා වන්දනය සඳහා පිළිගෙන තිබිණි. ඔවුන් පිළිමවලට වන්දනාමාන කළෝය. භාරහාර තබන ලදී. ඒ වෙනුවෙන් බිලිදුන්හ. ඒවායින් නිමිති ඇසූහ.

- තව්හීදයේ කේන්ද්‍රස්ථානය වූ කෑබාව මේ යුගයේ පිළිම වන්දනය උදෙසාම වෙනස් විය. වන්දනා සමය ශුද්ධ වූ මාස ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. විවිධ රටවල වන්දනාකරුවන් එහි පැමිණියහ. පිරිමින් දිවා කාලයේත්, කාන්තාවන් රාත්‍රී කාලයේත් නිරුවතින් එය වටා ගියහ. එහි තිබූ පිළිමවලට බිලිදුන්හ.
- ඔවුන් විවිධාකාර මිථ්‍යා විශ්වාසයන්ගෙන් යුතු වූහ. සතුන්ගේ හා පක්ෂීන්ගේ නාදවලට කල්පිත අදහස් ඉදිරිපත් කළහ. ඝාතනය කළ කෙනෙකු වෙනුවෙන් පලිගැනීම් නොකළහොත්, ඔහුගේ ප්‍රාණය බස්සෙක වී අස්තීනි, අස්තීනි (මාගේ පිපාසය සන්සිඳුවන්න) යනුවෙන් හඬ නඟන බවට විශ්වාස කළහ. වර්ෂාව නොලැබෙන විට අශ්වයාගේ වලිගයේ ගිනි පන්දම් දල්වා කන්දක් මතට දක්කන්නට විය. ඉල්ලීම් සපුරාගනු වස් සතුන්, නර බිලි දුන්හ.
- මෙවැනි සමාජ සංස්කෘතික තත්ත්වය, එම කාලවකවානුව ජාහිලියියා යුගය නමින් ඇමතීමට හේතු විය. ජාහිල් යන පදයට අඥාණයා යනුවෙන් අර්ථ දැක්වේ. සමහරුන් විසින් එය දැනුමෙන් තොර කාලය නොව යහ ගුණාංගයන්ගෙන් තොර වූ කාලය ලෙසත් සඳහන් කරති. සමස්ථයක් ලෙස ඉස්ලාමීය විශ්වාසයන් හා ජීවන ක්‍රමය දක්නට නොමැති යුගයක් ලෙස එම කාලය පැවැති බැවින් ජාහිලියියා කාලය ලෙස විස්තර කළ බව ද පැවසේ.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : ඉස්ලාමයට පෙර කාල වකවානුව, අයියාමුල් ජාහිලියියා ලෙස හැඳින්වීමට හේතු කෙටියෙන් දක්වන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා,

i. අරේබියාවේ භූගෝලීය ඉතිහාසය
ii. ආර්ථික තත්ත්වය
iii. අරාබි බස හා සාහිත්‍යය
iv. ආගම හා සාහිත්‍යය

ආදී මාතෘකා යටතේ තොරතුරු ගොනු කිරීමට යොමු කරන්න.

පියවර 3 : ගොනුකළ තොරතුරු පන්ති කාමරයේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 4 : සමාලෝචනය කර ලියා දැක්වීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. අමීන් එම්. අයි. එම්. - අරාබිවරුන්ගේ ජීවනය (1999) (දෙමළ)
අල්හසනාත් ප්‍රකාශන, හෙම්මාතගම.

2. අබුබක්කර ඒ. එම්. ඉස්ලාමීය ඉතිහාසය (1998) (දෙමළ) - I කොටස

**නිපුණතාව 7.0** : **ඉස්ලාමයට පෙර යුගයේ පැවැති සමාජ සංස්කෘතික, දේශපාලන තත්ත්ව හඳුනා ගනිමින් ජාහිලියත්වයෙන් වැළකී ක්‍රියා කරයි.**

**නිපුණතා මට්ටම 7.2** : නුබුව්වත් ලැබීමට පෙර නබි (සල්) තුමාගේ යහපත් ජීවන ක්‍රමය විස්තර කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල** :

- නබි (සල්) තුමාගේ මුල් අවුරුදු 40 ක ජීවිතය විස්තර කරයි.
- එම කාල සීමාව නුබුව්වතය සඳහා වූ පුහුණු කාලය බව හඳුනා ගනී.
- නබි (සල්) තුමාගේ පූර්වාදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- නබි (සල්) තුමාගේ උපතේ සිට නුබුව්වතය දක්වා නබි (සල්) තුමාගේ පරම්පරාව
- පියා අබ්දුල්ලාහ්, ඔහුගේ පියා අබ්දුල් මහාෆ්, ඔහුගේ පියා හුසයි, ඔහුගේ පියා කිලාබ්, ඔහුගේ පියා මුර්රත්, ඔහුගේ පියා කඅෆ්, ඔහුගේ පියා ලුවයි, ඔහුගේ පියා කාලිෆ්, ඔහුගේ පියා ෆිහ්ර්
- මොවුන් අතුරෙන් ෆිහ්ර් යන අය කුරෙෂ් නම් විය. කුරෙෂ් කුලය ඇරැඹෙන්නේ මොහුගෙන්ය. කුසයි (398 - 480) යන අය මක්කාවේ පරිපාලන රටාවක් පිහිටුවූයේ ය. හාසිම් කුරෙෂිවරු වෙළඳාම් කිරීමට පහසුකම් සැලැස්සුවේ ය. අබ්දුල් මුත්තලිෆ් වල් බිහි වී තිබූ "සම් සම්" ළිඳ සොයාගෙන වන්දනාකරුවන්ට ජල පහසුකම් සැලැස්සුවේය. මොහුගේ කාලයේ දී අබ්රහා යන යෙමන් දේශයේ පාලකයා කෑබාව බිඳ දැමීම සඳහා අලි ඇතුන් සමඟ මහා සේනාවක් රැගෙන ආවේය. මෙය ඇත් හමුදා ආක්‍රමණය නම් වේ. මෙය සිදු වූ වසර ආලමුල් ෆීල් නම් වේ. නබි (සල්) තුමා ඉපදුනේ (ක්‍රි.ව.570/571) මෙම වසරෙදී ය.
- අබිසීනියානු රජයෙන් නියෝජිතයා ලෙස අබ්රහා යමන් ප්‍රදේශය පාලනය කළේය. වන්දනා කරුවන්ගෙන් මක්කාව ලබන ප්‍රසිද්ධිය සම්පත් දැක ඔහු ඊර්ෂ්‍යා කළේය. තම රටේ දේවස්ථානයක් ඉදිකර එයට වන්දනා කිරීම සඳහා පැමිණෙන ලෙස ඇරයුම් කළේය. කෑබාව තිබෙන තුරු වන්දනාකරුවන් එහි නොපැමිණෙන බව දැනගත් ඔහු කෑබාව බිඳ දැමීම සඳහා සූදානම් විය. ඔහුගේ ඇත් හමුදාව අබාබීල් යන පක්ෂීන් විසින් අල්ලාහ් විනාශ කළේය. සූරතුල් ෆීල් හි මෙය විස්තර කෙරේ.
- නබි (සල්) තුමාගේ උත්පත්තියට කලින්ම අබ්දුල්ලාහ් මෙලොවින් සමු ගත්තේය. ඉපදී වයස අවුරුදු හයේ දී මව ද මළාය. අරාබිවරුන්ගේ සිරිතට අනුව හලීමා යන කිරි මව විසින් පෝෂණය කරනු ලැබූහ. ගැමි, භෞතික හා සංස්කෘතික පරිසරය නබි තුමාගේ ශරීර සෞඛ්‍යයටත් කථන හැකියාවන්ටත් මනා පෝෂණයක් ලබා දුන්නේය. මවගේ වියෝවෙන් පසු සීයා වූ අබ්දුල් මුත්තලිෆ් විසින් හදාවඩා ගනු ලැබූහ.

  මෙම වකවානුවේ දී නබි (සල්) තුමාට එතුමාගේ සීයා මාර්ගයෙන් මනා නායකත්ව පුහුණුවක් ලැබුණි. ඔහුගේ මරණයත් සමඟ මහප්පා වූ අබුකාලිෆ් විසින් එතුමා හදාවඩා ගනු ලැබූහ. දුප්පත් වුව ද ඔහු ගරුත්වයෙන් යුතු අයෙකු වූයේය. ඔහු මගින් නබිතුමාට වෘත්තීය පුහුණුව ලැබුණි. ගවයන් රැකබලා ගත්හ. වෙළෙඳ කටයුතුවල යෙදුණහ. අරාබි දේශයට බැහැර රටවලට වෙළඳ ගමන්වල යෙදුණහ. මෙම අවස්ථාවේ දී ක්‍රිස්තියානි පූජකවරුන් විසින් අනාගත නබිවරයා ලෙස හඳුන්වා දෙනු ලැබූහ.

මෙම කාලවකවානුවේ දී නබි (සල්) තුමාට විශේෂ සිද්ධීන් තුනකට සහභාගී වූහ.

1. කිනානා හා කෙස් ගෝත්‍රිකයන් අතර සිදු වූ හර්බුල් ෆුජ්ජාර් යන යුද්ධයට නබි (සල්) තුමා සහභාගී වූහ. එහිදී අරාබි යුධ ක්‍රමය ගැන මනා අත්දැකීමක් ලදහ. සතුරන් විසින් විදින හී අහුලා දීමේ රාජකාරිය එතුමාට භාර දී තිබුණි.
2. යෙමනයෙන් පැමිණි සුබයිස් යන වෙළෙන්දාගෙන් භාණ්ඩ මිල දී ගත් අල් ආස් බින් වාඉල් නැමැත්තා මුදල් නොගෙවා සැඟවී ගියේය. යෙමන් වෙළෙන්දා අබී හුබයිස් කන්දට නැඟ පැමිණිලි කළේය. කෝපයට පත් සුබයිර් බින් අබ්දුල් මුත්තලිෆ් සමඟ නබි (සල්) තුමා ද එක් ව ඉබ්නු ජුන් ආන් යන අයගේ නිවසෙහි ඔහුට උදව් කිරීම සඳහා ප්‍රභූන්ගෙන් යුත් සමත මණ්ඩලයක් එක්රැස් කළහ. මෙය හිල්ෆුල් ෆුලුල් නම් වේ. ෆිජාර් යුද්ධයේ දී දුටු හිංසා පීඩා තවදුරටත් සිදු නොවීම සඳහා මෙම සමත මණ්ඩලය රැස්කරනු ලැබූ බව සමහර ඉතිහාසඥයින් කරුණු දක්වති.

   අද වුව ද එවැනි ගිවිසුමක් සඳහා මා කැඳවනු ලැබුවා නම් එයට යෑමට සූදානමින් සිටිමි යැයි පසු කාලයේ දී නබි (සල්) තුමා පවසා තිබුණි.
3. හර්බුල් ෆුජ්ජාර් හි තම පියා අහිමි වූ වැන්දඹු වූ කදීජා (රළි) තුමිය තම ව්‍යාපාරික කටයුතු කරගෙන යෑම සඳහා නියෝජිතයෙකු සෙවීය. එම අවස්ථාවේ දී අල් අමීන් යැයි ජනයා විසින් ප්‍රශංසා කරනු ලැබූ නබි (සල්) තුමා ඒ සඳහා තෝරාගනු ලැබූහ. පසුව නබි (සල්) තුමාගේ සැදැහැවත් ගතිගුණවලට හිත් බැඳුණු කදීජා තුමිය දෙපාර්ශවයේ ම කැමැත්තෙන් එතුමා හා විවාහ වූවාය.

   මෙම විවාහය නබි (සල්) තුමාගේ පෞද්ගලික ජීවිතයේ ද, පවුල් ජීවිතයේ ද, සමාජ ජීවිතයේ ද විවිධ වෙනස්කම් ඇති කිරීමට තරම් විය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම**

පියවර 1 : නබි (සල්) තුමාගේ නුබුව්වතය තෙක් ජීවිතය කෙටියෙන් දක්වන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා නුබුව්වතයට පෙර නබි (සල්) තුමාගේ ජීවිතය සැලසුම් කරන ලද්දක් ද, සැලසුම් නොකරන ලද්දක් ද යන්න පිළිබඳ විවාදයක් පැවැත්වීමට යොමු කරන්න.

පියවර 3 : එක් එක් කණ්ඩායමෙන් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන් පස් දෙනෙකුට විවාද කිරීමට යොමු කරන්න.

පියවර 4 : වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. සෙය්යික් අබූ බක්කර් සිරාජුදීස් (මාර්ටින් ලිංග්ස්) මුහම්මද් (සල් ) 1989
2. සයිබුර් රහුමාන් මුබාරක් පූරි අර් රහීක් දාරුල් හුදා - චෙන්නයි - 1979
3. අබූබක්කර් ඒ. එම්. - ඉස්ලාමීය ඉතිහාසය I කොටස, ඉස්ලාමීය පර්යේෂණ සංගමය, සායින්ද මරුදු - 05
4. අමීන් එම්. අයි. එම්. - මුහම්මදුර් රසූලුල්ලාහ් (2002) අල් හසනාත් ප්‍රකාශන, හෙම්මාතගම

**නිපුණතාව 8.0 : නබි මුහම්මද් (සල්) තුමාගේ පැමිණීමේ අරමුණ හා එතුමන්ගේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ කටයුතු වටහා ගෙන කුලෆාඋර් රාෂිදීන් කාලයේ දී පැවති සමාජ, දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳවත් දැන ඒවා පූර්වාදර්ශ කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.1** : නබි (සල්) තුමාට නුබුව්වත් ලැබුණු පසුබිම හා ඉන් පසු එතුමා මුහුණදුන් අභියෝග හඳුනා ගනියි.

**කාලය** : කාල පරිච්ඡේද 25

**ඉගෙනුම් ඵල** :

- නබි (සල්) තුමාගේ කැඳවීම් කිරීමේ (දැවා) කාර්යය පිළිබඳ විස්තවර කරයි.
- කැඳවීම් කරන්නා මුහුණදෙන අභියෝග හඳුනා පවසයි.
- නබි (සල්) තුමාණන්ගේ පූර්වාදර්ශී කැඳවුම්කරුවා බව ඔප්පු කර පෙන්වයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### නබි (සල්) තුමාගේ කැඳවුම් කාර්යය හා මුහුණ දුන් අභියෝග

- නබි (සල්) තුමා වයස අවුරුදු 40 ආසන්න වන අවස්ථාවේ දී නිතර නිතර හිරා ගුහාවට යෑමත්, තනිව සිටිමින් අල්ලාහ් පිළිබඳ සිතුවිල්ලේ යෙදී සිටීමත්, පුරුද්දක් කරගෙන සිටියහ. ජාහිලියතයෙන් ජනයා මුදාගත යුතු ය යන උනන්දුව එතුමා සතු විය. මෙම කාල වකවානුවේ දී එතුමා සැබෑ සිහින දුටුහ. ජිබ්රීල් (අලෛ) තුමාගේ රුව දැක බියට පත් ව සිටියහ. එතුමාට ප්‍රථම වහී ලැබුණේ මෙම පසුබිමෙහි ය. ඒ පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් එතුමාට නොවීය. එවිට බිරිය වූ කදීජා තුමියගේ යෝජනාව අනුව වරකා බින් නව්ෆල් යන අය මුණගැසී පැහැදිලි කර ගත්හ. ඉන්පසු "අවවාද කර අනතුරු හඟවන "ලෙස (74:2) වහී පහළ විය.
- එතුමන්ගේ දූත මෙහෙවර ප්‍රථමයෙන් කදීජා තුමිය විසින් පිළිගන්නා ලදී. අබුබක්කර් (රළි), අලි (රළි), සෙද් (රළි) ආදී සමීප ඥාතීන් හා සගයින් එතුමන්ගේ දූත මෙහෙවර පිළිගත්හ. තවද නෑදෑයින් ද, සමාජයේ සිටින විවෘත චින්තනය ඇති ධර්මිෂ්ඨ අය ද එතුමා පිළිගත්හ. නෑදෑයින් හා මිතුරන් අතර එතුමාගේ ආගමික ප්‍රචාර ක්‍රියා රහසේ සිදු විය. එතුමා පිළිම වන්දනාව සෘජුව ම ප්‍රතික්ෂේප නොකළ නිසා ඔවුන් හනීෆ්වරු ලෙස සැළකූහ. එහෙත් කුරයිෂිවරුන් එයට විරුද්ධ වූහ. එතුමන්ගේ දූත මෙහෙවර පිළිගත් විශ්වාසවන්තයන් සෆා කඳු පාමුල වූ දාරුල් අර්කම් හි පුහුණුව ලදහ.

  ප්‍රසිද්ධියේ දූත මෙහෙවරෙහි යෙදෙන ලෙස අල්ලාහ්ගේ අණ ලැබුණු විට සෆා කඳුගැටය මත නැඟ ජනයාට දුනුම් දී, දේශනා පවත්වන්නට වූහ. ජනයා එක්රැස් වූ විට තමා අල්ලාහ් විසින් යවනු ලැබූ (දූතයා) නබී බව ද තමා අනුගමනය කරන ලෙස ද ආරාධනා කළහ. මෙම අවස්ථාවේ දී සියල්ලන් ම නිහඬව විසිර ගියහ. නබි (සල්) තුමාගේ මහප්පා අබූලහබ් විරුද්ධ විය. ඉන් පසු නෑදෑයින් භෝජන සංග්‍රහයට කැඳවූ එතුමා තම දූත මෙහෙවර දන්වා සිටියහ. එම අවස්ථාවේ ද අබූලහබ් විරුද්ධත්වය දැක්වීය. එම අවස්ථාවේ ද නබි (සල්) තුමා ට සහාය දක්වන බව අබුතාලිබ් තුමා පොරොන්දු විය.

මෙයින් පසු පිරිසක් නබි තුමා පිළිගෙන එතුමාට උදව් කිරීමට ඉදිරිපත් වූහ. ඒ අතර තවත් පිරිසක් එතුමාගේ දූත මෙහෙවර ප්‍රතික්ෂේප කරමින් එතුමාට තාඩණ පීඩණ කරන්නට ඉදිරිපත් වූහ. මුලදී කවියා, හූනියම් කාරයා, පිස්සා යැයි කියමින් අපහාස කළහ. පසුව නබි ලෙස පත්කරනු ලැබීමට නුසුදුසු අයෙකැයි කරුණු ඉදිරිපත් කරන්නට වූහ. එය ද අසාර්ථක වූ විට එතුමාට හිංසා කරන්නට ඉදිරිපත් වූහ. අබුලහබ්ගේ පවුලේ අය එයට මූලිකත්වය දුන්හ. ගල්ගසා තුවාළ සිදු කළහ. දරුවන් නැති අයෙකැයි අපහාස කළහ. ඇඳුම් ඉරා දැමූහ. බෙල්ල පයින් පෑගූහ. බෙල්ලට ලණුවලින් තොණ්ඩු දැමූහ. නරක් වූ බඩවැල කරෙහි පැළඳවූහ. එතුමා මරා හිස රැගෙන එන්නාට තෑගි දෙන බව ප්‍රසිද්ධ කළහ.

අබූ තාලිබ් වෙත ගොස් තම ක්‍රියාවන්ට බාධා නොකරන ලෙස ඉල්ලා සිටියහ. විරුද්ධ ව සටන් කරන බව බිය ගැන්වූහ. ඉමාරත් බින් වලීද් යන තරුණයා ලබා ගෙන තමාට නබි වරය බාරදෙන ලෙස ද ඉල්ලා සිටියහ. පසුව නබි (සල්) තුමාට විවිධ පොරොන්දු දෙමින් නම්මවා ගන්නට වෑයම් කළහ. එය ද අසාර්ථක වූ විට තර්ජනය කරන්නට සූදානම් වූහ. දිගින් දිගටම කේවල් කරන්නට වූහ. වාද විවාදවලින් නම්මවා ගන්නට වෑයම් කළහ. පොරොන්දුවලට කැමති කරවා ගැනීමට ද වෙර දැරූහ. මෙම වෑයම් සියල්ල අසාර්ථක වූ විට බනූ හාසිම්, බනූ මුත්තලිෆ් ගෝත්‍රවලට සම්බාධක පනවමින් සමාජයෙන් කොන් කරන්නට සූදානම් වූහ. අබුතාලිබ් ගේ හා කදීජා (රළි) තුමියගේ අභාවයෙන් පසුව මෙම තත්ත්වය තවදුරටත් දරුණු විය. මෙම තාඩණ පීඩණ ඉවසාගත නොහැකි වූ නබි තුමා තායිෆ් නගරයට ගියහ. එහි ද දුක් කරදරවලට භාජනය කරනු ලැබ ආපසු පැමිණියහ.

මේ අතර ඉස්ලාමය වැළඳ ගත් ජනයා ද කරදර කම්කටොළුවලට මුහුණ දුන්හ. සමහරුන් පවුලේ අය විසින් පීඩනවලට ලක් කෙරිණි. (සල්මාන්, තල්හා, සඅද්, මුස් අබ්) වහලුන් තම ස්වාමිවරුන් විසින් දරුණු වද බන්ධනවලට පමුණුවනු ලැබූහ. (බිලාල්, හෆ්හාෆ්, යාසිර්, ලුබානා) තවත් සමහරු පොදුවේ හිංසාවන්ට ලක්කරනු ලැබූහ. (අබුදර්, අබුබක්කර්) ඉවසා සිටින ලෙස උපදෙස් දීම හැර නබි (සල්) තුමාට කළ හැකි අන් යමක් නොවීය.

දිගින් දිගට ම දුක් වේදනාවලට ලක් වූ අය අබිසීනියාවට පිටත් කරනු ලැබූහ. වැරදි තොරතුරු ලැබූ නිසා ඔවුන්ගෙන් කොටසක් ආපසු හරවා යවනු ලැබූහ. එම ස්ථානයත් තම දූතයන් යැවූ කුරෛෂිවරු ඔවුන් පිටමං කරන ලෙස ඉල්ලා සිටියහ. එහෙත් එය සාර්ථක වූයේ නැත. නජ්ජාසි මුස්ලිම්වරුන්ට රැකවරණය දුන්න ද එහි දීර්ඝ කාලයක් රැඳුනේ කිහිප දෙනෙකු පමණි. නුබුව්වතයෙන් 10 වන වසරෙන් පසු නබි (සල්) තුමා ඉස්ලාමීය ප්‍රචාරය සඳහා තවත් ස්ථානයක් සෙවූහ. තායිෆ් ගමනේ බලාපොරොත්තුව වූයේ මෙයයි. එහෙයින් සංචාරකයින්ට ඉස්ලාමය ප්‍රචාරය කර නව ප්‍රදේශ සෙවීමේ කාර්යයේ එතුමා යෙදුනහ. ෆුආස් සටනේ දී පරාජයට පත් කස්රජ්වරු ආධාර පතා කුරෛෂිවරු වෙත පැමිණියහ. බලාපොරොත්තු නොවූ ආකාරයට නබි (සල්) තුමා මුණගැසුණු ඔවුන් ඉස්ලාමය වැළඳ ගත්හ.

- **අකබා ගිවිසුම හා හිජ්රතය**

හිජ්රි දහයේ දී යත්රිබයෙන් පැමිණි හය දෙනෙක් බලාපොරොත්තු නොවන අයුරින් නබි (සල්) තුමාට අකබා නම් ස්ථානයේ දී මුණගැසුණාහ. ඔවුනට ඉස්ලාමය හඳුන්වා දුන් විට එවකට යුදෙව්වන්ගෙන් ඉස්ලාම් පිළිබඳ ව අසා දැන සිටි ඔවුන් වහා ඉස්ලාමය වැළඳ ගත්හ. ඊළඟ වසරේදී 12 දෙනෙක් අකබාහි දී නබි (සල්) තුමා හමු වී ඉස්ලාමය වැළඳ ගත්හ. ඔවුන් සමඟ බෛඅත් යන පොරොන්දුවකට එළඹෙන ලදී. අල්කුර්ආනයේ 60:12 හි සඳහන් කරුණු හය පිළිගෙන ඔවුන් බෛඅත් කළහ. ඔවුන් සමඟ මදීනාවේ දී ඉස්ලාමය ප්‍රචාරය කිරීම සඳහා මුස්අබ් ඉබුනු උමෛර් (රලි) යන සහාබිවරයා යවා තබන ලදී. එතුමා මදීනාවේ ජීවත් වූ ප්‍රධානීන් හමුවී ඉස්ලාමය හඳුන්වා දුන්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊළඟ වසරේ දී 72

දෙනෙක් අකබාහි දී නබි තුමා හමු වූහ. නබි (සල්) තුමා යත්රිබයට කැඳවීම ඔවුන්ගේ අරමුණ විය. එහෙත් එය සාර්ථක වූයේ නැත. කලින් වතාවට වඩා වැඩි පිරිසක් එකතු කර තම ජීවිත පරිත්‍යාගයෙන් නබි තුමා ආරක්ෂා කරන බවට ඔවුන් එකඟ වූහ. ඉන්පසු අල්ලාහ්ගේ අවසරය ලැබූ විට මදීනාවට පැමිණෙන බව නබි (සල්) තුමා පොරොන්දු වූහ. එතෙක් මුහාජිරීන්වරු එවන බව පැවසූහ. එදා පටන් කුඩා කණ්ඩායම් වශයෙන් මුහාජිරීන්වරු කුරෙෂිවරුන්ට නොදැනෙන සේ මදීනාවට යන්නට වූහ. සමහරු කුරෙෂීන් විසින් අල්ලා ගනු ලැබ දඬුවම් පමුණුවනු ලැබූහ. තවත් සමහරු ආපසු හරවා යවනු ලැබූහ.

මෙසේ මුස්ලිම්වරු මදීනාවට හිජ්රත් කරන බව දැන ගත් කුරෙෂිවරු මතු දිනක දී නබි (සල්) තුමා ද මදීනාවට යන බව සිතා බිය වූහ. දාරුන් නද්වාහි රැස්වූ ඔවුන් සාකච්ඡා කර එතුමාගේ ගේ වටා රැක සිට සලාතය සඳහා පිටත්වීමේ දී එක් ව ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කළහ. අල්ලාහ් මේ බව නබි තුමාට දැන්විය. නබි (සල්) තුමා තම ඇඳෙහි අලි (රලි) තුමා නිදාගන්නට සලස්වා සිය නිවසින් පිටව අබූබක්කර් (රළි) තුමාගේ නිවසට ගියහ. එහි එවකට සියලු දෑ සූදානම් කර තිබුණි. පළමුව යෙමන් දෙසට ගොස් දින තුනක් තව්ර් ගුහාවේ රැඳී සිට පසුව මදීනාවට හිජ්රත් යෑමට සූදානම් කර තිබුණි. මේ අනුව හිජ්රත් යනු හදිස්සියෙන් සිදු වූ සිද්ධියක් නොව මනාව සැළසුම් කළ සිද්ධියකි.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම**

පියවර 1 : නබි (සල්) තුමාගේ නුබුව්වතයේ සිට පළමුවන හිජ්රතය තෙක් ජීවන ක්‍රමය අධ්‍යයනය කර පැමිණෙන ලෙස දැනුම් දෙන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා නබි (සල්) තුමා රිසාලතය ඉදිරිපත් කළ අවස්ථාවේ මුහුණදුන් ගැටලු සහ එතුමා එම ගැටලුවකට ප්‍රවේශ වූ ආකාරය හා එහි ප්‍රතිඵල නම් මාතෘකාව යටතේ සාකච්ඡා කිරීමට යොමු කරන්න.

පියවර 3 : සාකච්ඡා කළ කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 4 : වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. මව්ලානා අබූ සලීම් අබ්දුල් හයි - අන්නල් නබි තුමාගේ අලංකාර ජීවිතය , (1998) ඉස්ලාමීය ආයතනය ට්‍රස්ට්, චෙන්නයි 600012 (දෙමළ)
2. අමීන්, එම්. අයි. එම්. - මුහම්මද් රසූල්වරයා, (2002) අල්හසනාත් ප්‍රකාශනය, හෙම්මාතගම. (දෙමළ)
3. අබුබක්කර් ඒ. එම්. , ඉස්ලාම් ඉතිහාසය කොටස - 1 (1998) ඉස්ලාමීය පර්යේෂණ කේන්ද්‍රය, සායින්ද මරුදු
4 සෙයියිද් අබු බක්කර් - මුහම්මද් සල්, මාරින් ලින්ක්ස්
5. සෙෆුර් රහ්මාන් මුබාරක් පූරි - අර්රහීක් (1979) දාරුල් හුදා, චෙන්නයි - 01

**නිපුණතාව 8.0 : නබි මුහම්මද් (සල්) තුමාගේ පැමිණීමේ අරමුණ හා එතුමන්ගේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ කටයුතු වටහා ගෙන කුලෆාඋර් රාෂිදීන් කාලයේ දී පැවති සමාජ, දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳවත් දැන ඒවා පූර්වාදර්ශ කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.2 :** නබි (සල්) තුමාණන් මදීනා ජීවිතයේ සිදුකළ කටයුතුවල විධික්‍රම හා ජයග්‍රහණ විස්තර කරයි.

**කාලය :** කාල පරිච්ඡේද 30

**ඉගෙනුම් ඵල :**

- නබි (සල්) තුමාණන් මදීනාවට හිජ්රත් යාමට හේතු වූ කරුණු හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- මදීනාහි සමාජයක් බිහිකරන ලද ආකාරය පියවරෙන් පියවර ලියා දක්වයි.
- සමාජය ආරක්ෂා කිරීමෙහිලා රජයේ දායකත්වය විස්තර කර ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### මස්ජිදුන් නබවි

නබි (සල්) තුමා හිජ්රත් ගිය පසු මදීනාවේ දී මුලින් ම ඉටුකළ කාර්යයන් අතර මස්ජිදුන් නබවි නිර්මාණ කාර්යයත් එකකි. මක්කා ජීවිතයේ දී මස්ජිද් ඉදි කළේ නැත. කඃබාවේ අවට පරිසරය සලාතය සඳහා භාවිත කළහ. හිජ්රතයේ දී ජුම්ආ සහ ජමාඅත් සලාත පැනවීම මස්ජිද් නිර්මාණයට හේතු වූවා යැයි සැලකිය හැකිය. එනිසා කුබා වේ මස්ජිද් තක්වා සහ මදීනාවේ මස්ජිදුන් නබවි නිර්මාණය කරන ලදී. ආරම්භයේ දී රටඉඳි කඳන්වලින් හා රටඉඳි කොළවලින් ඉතා චාම් අන්දමට නිර්මාණය කරන ලදී.

මස්ජිදුන් නබවි ඉදිකිරීමට සමාජීය හේතු ද විය. නබි (සල්) තුමා මක්කාවේ දී ගොඩනැගීමට නොහැකි වූ සමාජයක් මදීනාවේ දී නිර්මාණය කිරීමට සූදානම් වූහ. එයට මස්ජිද් අවශ්‍ය විය. ජනයා එක්රැස් කිරීමට අදාන් ද එක්රැස් කරන ස්ථානය ලෙස මස්ජිදය ද යොදා ගැනුණි. අදාන් හඬ අසා මස්ජිදයට පැමිණි අය ජමාඅත් ලෙස සලාතයේ යෙදුනහ. එම සලාතය තුළින් සමාජ සුහදතාවයට හා සාමූහික ක්‍රියාකාරීත්වයට පුහුණුව ලැබූහ. නායකයා තෝරා ගැනීම නායකයාට අවනත වීම, නායකයාගෙන් වරදක් සිදුවූ විට එයින් ඉවත් වීම, සමාජයේ සාමාජිකයන් එකමුතු වීම, නායකයාට මගපෙන්වීම, සහෝදරයින් සමඟ සුහදව කටයුතු කිරීම, උදව් කිරීම වැනි පුහුණු එම නව සමාජයට ජමාඅත් සලාතය මගින් උගන්වන ලදී.

නබි (සල්) තුමා මස්ජිදය අධ්‍යාත්මික ක්‍රියා සඳහා වූ ස්ථානයක් මෙන් ම ලෞකික කටයුතු සඳහා වූ ස්ථානයක් ලෙස ද යොදා ගත්හ. එහි ඉගැන්වීම් සිදු කෙරුණි. නිත්‍ය සාමාජිකයන් ලෙස අස්හාබුස්සුෆ්ෆාවරු සිටියහ. කුත්බා පැවැත්විණි. ජනතාවගේ ප්‍රශ්න, ගැටලු, අවශ්‍යතා ආදිය සාකච්ඡා කෙරුණි. නඩු විසඳන ලදී. අමුත්තන් පිළිගනු ලැබූහ. බෛතුල්මාල් ක්‍රියාත්මක විය. සමහර අවස්ථාවල දී යුධ කඳවුර ලෙස ද ක්‍රියාත්මක විය. නායක මුහම්මද් (සල්) තුමා නැවැතී සිටියේ එහි ය. එතුමා සොයා එන්නන් එතුමා මස්ජිදයේ දී බැහැදැකීමට අවස්ථාව ලැබී උසස් කුලයක් ලෙස සලකනු ලැබූ කුරෛෂීන් මදීනාවේ ස්වදේශිකයන් ඉස්ලාමය යටතේ එක්රැස්වීමේ අවස්ථාව මස්ජිදුන් නබවි මගින් ලැබුණි.

**ගිවිසුම්**

- අරාබි ගෝත්‍රිකයන් තමනතර ගිවිසුම් ඇති කරගෙන සමූහ වශයෙන් ජීවත් වීමේ රටාවක් එදා දක්නට ලැබුණි. නබි (සල්) තුමා එම පාරම්පරිකත්වය තම කටයුතුවල ඉලක්කයක් කර ගත්හ. මදීනාවේ අව්ස් කස්රජ් යන ගෝත්‍රිකයන් කාලාන්තරයක් තිස්සේ සතුරන් ලෙස දිවි ගෙවූහ. මදීනාවට ගිය නබි (සල්) තුමා එම ජනයා සමාදාන කළහ. එලෙසින් ම මක්කාවෙන් පැමිණි මුහාජිරීන්වරු ද මදීනාවේ ජීවත් වූ අන්සාරිවරු ද සහෝදරයින් ලෙස එකමුතු ව ජීවත් වූහ.
- මෙයට අමතර ව යුදෙව්වන් හා මුස්ලිම්වරු අතර සාමය උදා කිරීම සඳහා ඇති කළ ගිවිසුම් වඩා වැදගත් ය. මදීනාවාසී අන්සාරිවරු තම මාර්ගෝපදේශකයා ලෙස නබි (සල්) තුමා පිළිගත්හ. එහෙත් යුදෙව්වන් වෙනත් අරමුණකින් නබි (සල්) තුමා සහ මුස්ලිම්වරු පිළිගත්හ. අරමුණු දෙකක් සහිත ව පිළිගනු ලැබීම පසුකාලයේ ගැටලු රැසක් ඇති කරන බව නබි (සල්) තුමා වටහා ගත්හ. තම ජනයා අතර අවසාන නබිවරයා පහළ නොවීම නිසා ඊර්ෂ්‍යාවට පත් ව සිටි යුදෙව්වන්ගෙන් ප්‍රශ්න ඇතිවන බව නබි (සල්) තුමා දැන සිටියහ. එනිසා පෙර සූදානමක් ලෙස යුදෙව්වන් සමඟ ගිවිසුම් ඇති කර ගත්හ. එහි දේශපාලන වැදගත්කම නිසා පසුව එය "මදීනා ප්‍රඥාප්තිය" ලෙස හඳුන්වන ලදී. මෙමගින් නබි (සල්) තුමාට මදීනාවේ ගත කළ මුල් අවධිය සාමකාමී ව ගතකිරීමට අවස්ථාව ඇති විය. බද්ර් යුද්ධයෙන් පසුව තිගැස්මකට පත් යුදෙව්වන් අගල් යුද්ධයේ දී ගිවිසුම කඩ කළහ. මේ නිසා කෛබර් යුද්ධය කිරීමේ තත්ත්වයට පත් වූහ. මෙය සටනට කලින් ඇති වූ ගිවිසුම වන්නේ ය.
- ඊළඟ වැදගත් ගිවිසුම ලෙස හුදයිබියා ගිවිසුම සැලකිය හැකිය. මෙය බද්ර්, උහද්, අහ්සාබ් සටන්වලින් පසුව ඇති කරගන්නා ලද ගිවිසුම වන්නේ ය. නබි (සල්) තුමා ද මුහාජිරීන්වරු ද මදීනාවට හිජ්රත් ගිය පසු කුරෛෂිවරු විවිධ ආකාරයෙන් කරදර කරන්නට වූහ. ගොවිපල් සතුන් පැහැර ගත්හ. වතුවලට ගිනි තැබූහ. උම්රා කිරීමට පැමිණෙන අයට තාඩන පීඩන කිරීම, මදීනාවේ ජීවත් වූ මුනාෆික්වරු උසිගන්වා මුස්ලිම්වරු මදීනාවෙන් පිටමං කිරීමට සැලැස්වීම වැනි විවිධ ක්‍රියාවල නිරත වූහ. එමගින් තමා බලාපොරොත්තු වූ සිද්ධීන් ඉටු නොවන බව දුටු ඔවුන් අම්ර් ඉබ්නු අල්රම්ගේ ඝාතනය හා අබූ සුෆ්යාන්ගේ තවලම කොල්ලකෑම මුල් කරගෙන යුද්ධයට සූදානම් වූහ. බද්ර්, උහද්, අහ්සාබ් වැනි යුද්ධවල දී ජීවිත හානි හා දේපළ හානි ලදහ. එහෙයින් කුරෛෂිවරු සාමය පතා කටයුතු කළහ. සිය ආත්ම ගෞරවය නිසා ඒ සඳහා ඔවුන් ඉදිරිපත් වූයේ නැත. ඒ අතර විශාල යුද්ධ තුනකින් ම ජය ලැබූ මුස්ලිම්වරුන්ට අලුත් සතුරන් වූ යුදෙව්වන්ට මුහුණදීමට සිදුවිය. උතුරින් කෛබර් පෙදෙසින් යුදෙව්වන් ද, දකුණේ මක්කාවේ සිට කුරෛෂිවරු ද පහර දෙනු ඇතැයි නබි තුමා බිය වූහ. එවිට මුස්ලිම්වරුනට දෙදිශාවකින් යුද්ධ කිරීමට සිදුවනු ඇත. එහෙයින් එක් දිශාවකින් එන පහරදීම නතර කිරීමේ අරමුණින් එතුමා හුදයිබියා ගිවිසුම ඇති කරගත් බව අබ්දුර් රහ්මාන් මාවර් පවසති.
- මූලික කොන්දේසි හතරක් ඇතුළත් මෙම ගිවිසුමෙහි මතුපිටින් බැලූ විට කුරෛෂිවරුන්ට පක්ෂ වූවක් ලෙස පෙනුණි. මෙය දැක මුස්ලිම්වරු පවා කෝපයට පත් වූහ. එහෙත් එහි ප්‍රතිඵල කුරෛෂිවරුනට අපක්ෂපාත ව තිබෙනු දැක කුරෛෂිවරු ගිවිසුම කඩ කළහ.

  මෙම ගිවිසුම මගින් ඉස්ලාම් ව්‍යාප්ත වීමට අවස්ථාව උදා විය. මුස්ලිම්වරු උම්රා ඉටු කිරීමේ නිදහස ද ලදහ. යුදෙව්වන් සමඟ යුද්ධ කොට ජය ගැනීමේ අවස්ථාව ද උදා විය. අරාබි දේශයෙන් බාහිර ලෝකයේ සිටි සුළු රජවරුනට ද මහා රජවරුනට ද ඉස්ලාමය වැළඳ ගන්නා ලෙස ඇරයුම් ලිපි යැවීමේ ධෛර්යය ලැබුණි. අල්කුර්ආනය සුප්‍රසිද්ධ ජයග්‍රහණය ලෙස මෙය හුවා දක්වන්නේ ඒ නිසා ය.

**සටන්**

නබි (සල්) තුමා සහ මුස්ලිම්වරු මක්කාවේ සිට මදීනාවට හිජ්රත් ගිය පසු කුරෙෂිවරු පළමුව රහසිගත ව හිංසා පීඩා කරන්නට වූහ. එය වැළැක්වීම සඳහා නබි (සල්) තුමා ෂරියියා යන කුඩා භට කණ්ඩායම් සකස් කළහ. එම භට කණ්ඩායම් මක්කම හා මදීනාවේ දේශ සීමාවල සංචාරය කරන්නට සැලැස්වූහ. මෙම කණ්ඩායම් යවන ලද්දේ සතුරන්ගේ ගමන් බිමන් පිළිබඳව සොයා බලා දැනුම් දීමට ය. එහෙත් බලාපොරොත්තු නොමැති ආකාරයට අබ්දුල්ලාහ් ඉබ්නු ජහ්ෂ් (රළි) තුමාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම අබු ඉබ්නු හාල්රමිගේ නායකත්වයෙන් යුත් මක්කාවේ සීමාවේ එවන ලද කණ්ඩායම සතුරු කණ්ඩායමට පහර එල්ල කිරීම නිසා සටන ඇවිලෙන්නට විය. අබුසුෆ්යාන්ගේ නායකත්වයෙන් යුත් කුරෙෂිවරුන්ගේ තවලම ෂාම් දේශයට වෙළඳාම සඳහා ගොස් ආපසු පැමිණෙමින් සිටියහ. මෙම කණ්ඩායමට මුස්ලිම්වරු පහර දෙන්නට යන බව කතා පැතිරෙන්නට විය. ඒ නිසා අබුජහල් ඇතුළු පිරිස මුස්ලිම්වරු හා සටනට පැමිණ බද්ර් හි කඳවුරු බැඳගත්හ. මේ නිසා මුස්ලිම්වරුනට එහි යෑමට සිදුවිය. හිජ්රි දෙවන වසරේ දී සිදු වූ මෙම යුද්ධය මුස්ලිම්වරු හා කුරෙෂිවරු අතර සිදුවූ ප්‍රථම යුද්ධය විය. බද්ර් යුද්ධයෙන් පරාජයට පත් කුරෙෂිවරු හිජ්රි 3 දී උහද් යන ස්ථානයට හමුදාව ගෙන ආහ. මෙම සටනේ දී මුස්ලිම්වරු පරාජයට පත් වූහ. එහෙත් කුරෙෂිවරුනට පූර්ණ ජයග්‍රහණයක් ලැබුණේ නැත. තවත් ගෝත්‍ර රැසක් හා යුදෙව්වන් ද එක්කර ගත් කුරෙෂිවරු හිජ්රි 5 දී මදීනාව වටකළහ. මුස්ලිම්වරු අගල් හාරා මදීනාව ආරක්ෂා කළහ. මෙම යුද්ධයේ දී කුරෙෂිවරු පරාජයට පත් වූහ.

- කුරෙෂිවරුන්ගේ එකම අරමුණ වූයේ ඉස්ලාමය හා මුස්ලිම්වරු නැති කිරීමයි. ඔවුන් සටන් කළේ ඒ සඳහා ය. තම නායකත්වය ආරක්ෂා කර ගැනීමට ඔවුනට අවශ්‍ය විය. ඒ සඳහා තම හමුදා ශක්තිය ඔවුන් වැඩි කළහ. මේ සඳහා ඔවුන් වියහියදම් කළහ. මුස්ලිම්වරු සමඟ සිදුවූ සෑම යුද්ධයකදී ම කුරෙෂිවරුන්ගේ හමුදා ශක්තිය හැම විටම වැඩි විය. අනෙක් අතට මුස්ලිම්වරු ඉස්ලාමය රැකගැනීම සඳහා සටන් කළ අතර සෑම විටම ඔවුන්ගේ හමුදා ශක්තිය අඩු විය. එහෙත් ඔවුන්ගේ ධෛර්යයත්, වීරත්වයත් අල්ලාහ්ගේ උදව්වත්, නබි (සල්) තුමාගේ නායකත්වයත් මඟපෙන්වීමත් මුස්ලිම්වරුන්ගේ ජයග්‍රහණයට හේතු විය. ඒ නිසා අගල් හෙවත් අහ්සාබ් සටනෙන් පසු කුරෙෂිවරු යුද්ධයට ඉදිරිපත් වූයේ නැත. අනෙක් අතට මුස්ලිම්වරු ඊළඟ වසරේ දී උම්රාවට ගොස් හුදයිබියියා ගිවිසුම ඇති කර ගත්හ.
- මෙයින් පසුව මුස්ලිම්වරු හා යුදෙව්, ක්‍රිස්තියානින් අතර ද සටන් ආරම්භ විය. උහද් අගල් යුද්ධවල දී මදීනාවේ ජීවත් වූ යුදෙව්වන් කලින් කරන ලද ගිවිසුම කඩකළ නිසා මදීනාවෙන් පිටමං කරනු ලැබූහ. මොවුන් මදීනාවේ සිට සැතපුම් 100 දුරින් වූ කෛබර් නම් ස්ථානයේ පදිංචි වූහ. කෛබර් යුදෙව්වන්ගේ බලකොටු පිහිටා තිබූ ශක්තිමත් ස්ථානයක් විය. ඔවුන් මදීනාවට පහර දීමට පැමිණෙන බව තොරතුරු ලැබුණි. නබි (සල්) තුමා මදීනාවේ සිට කෛබරයට හමුදාව මෙහෙයවූහ. දින ගණනක සටනෙන් පසුව කෛබර් ජයගන්නා ලදී.
- මෙසේ හිජ්රි හත්වන වසරේ දී යුදෙව්වරු යටපත් කර ජයග්‍රහණය කළ පසු හිජ්රි 8 දී බෛසාන්ත්‍රියාවේ දී ක්‍රිස්තියානීන්ට විරුද්ධව යුද්ධ කිරීමට සිදුවිය. හුදයිබියා ගිවිසුමෙන් පසුව නබි (සල්) තුමා අධිරාජ්‍යයන්ට ඉස්ලාමීය කැඳවුම් ලිපි යවන්නට වූහ. රෝමයේ මහ රජතුමාටත්, ලිපි ගෙනගිය හාරිස් බින් උමෛර් හුරහිරිල් අල් හසානි විසින් ඝාතනය කරනු ලැබූ විට එයට පළිගැනීමේ අදහසින් හිජ්රි 8 හි මුඃතා නම් ස්ථානයට හමුදාවක් යවා තබන ලදී. මුස්ලිම් සෙන්පතිවරු තුන් දෙනෙක් ම ෂහීද් වූහ. හතරවන සෙන්පතිවරයා වූ කාලිද් බින් වලීද් යුද්ධයෙන් ජය අත්පත් කරගත්තේ ය.

**මක්කා ජයග්‍රහණය**

- හුදයිබියා ගිවිසුම කුරෛෂිවරුන් විසින් කඩකරන ලදී. එය අලුත් කිරීමට පැමිණි කුරෛෂිවරුන් විසින් නබි (සල්) තුමා විසින් ඉදිරිපත් කළ කොන්දේසි දෙක පිළිනොගන්නා ලදී. එම නිසා නබි (සල්) තුමා මක්කාව තම පාලනය යටතට ගෙන ඒම සඳහා සුදුසු කටයුතුවල රහසේ ම යෙදුනහ. මෙම කුරෛෂිවරුන්ගේ ගමට ඔවුන් නොදැනුවත් ව ඇතුළුවන තෙක් සියලු තොරතුරු ඔවුනට රහසක් ව ආරක්ෂා කරන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළහ. ජනයා නොමඟ යැවීම සඳහා විවිධ දිශාවලට හමුදා භට පිරිස් යවනු ලැබූහ. එහෙත් හාතිබ් යන පුද්ගලයා මක්කාවට කාන්තාවක් මාර්ගයෙන් පණිවිඩ යවා තැබුවේය. එය වහා සොයා ගන්නා ලදී. තොරතුරු හෙළිනොවන සේ වළක්වන ලදී. 10,000 පමණ පිරිසක් සමඟ ගිය නබි (සල්) තුමා මක්කාවේ සීමාවේ මර්රුල් ලහ්මාන් යන ස්ථානයේ නැවතී කඳු ගැටයක් මත ගිනි අවුලුවන ලෙස සැලැස්වූහ. අතිවිශාල හමුදාවක් පැමිණ ඇති බව බිය ගැන්වීම එහි අරමුණ විය. බියට පත් කුරෛෂි නායක අබු සුෆ්යාන් නබි තුමා බැහැදැකීමට පැමිණියේය. ඔහු නැවතීමට සලස්වා සිය අදහස වෙනස් කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. ඊළඟ දින උදයේ එතුමා ඉස්ලාම් ධර්මය පිළිගත්තේය. මක්කාවට ගොස් ජනතාවගෙන් යටත් වන ලෙස ඉල්ලා සිටියහ. මුස්ලිම් හමුදාව සටන් නොකොට මක්කාවට ඇතුළුවීමට සැලසුවේය. එක් ස්ථානයක පමණක් ගැටුමක් ඇති විය. මුස්ලිම් හමුදාව සටනකින් තොරව කෑබාවට පිවිසියහ. නබි (සල්) තුමා සහ මුස්ලිම්වරු කෑබාව තවාෆ් කළහ. මක්කා වාසීන් සියල්ලන් ම සමාව දෙනු ලැබූහ.

  මෙමගින් කුරෛෂි නායකත්වය නැති විය. මුළු අරාබිකරයෙහිම ඉස්ලාමයට විරුද්ධවාදීහු කිසිවෙකු නොමැති විය. නිදහසේ උම්රා, හජ් ආදිය ඉටු කිරීමට අවස්ථාව උදා විය. අරාබි ගෝත්‍රිකයන් තමන් ම ඉදිරිපත් වී ඉස්ලාමය වැළඳ ගත්හ. හිජ්රි 9 දී මුස්ලිම්වරු හජ් වගකීම ඉටු කළහ. හිජ්රි 10 දී නබි (සල්) තුමා අවසාන හජ් ඉටු කළහ. සහාබාවරු 124,000 මධ්‍යයේ තම අවසන් හජ් හා සමුගැනීමේ දේශනාව පැවැත්වූහ. තමා කළ දෑවා කාර්යය මුස්ලිම්වරුන්ට බාර කළහ.

**මදීනා රජය හා එහි පරිපාලන රටාව**

- නබි (සල්) තුමාගේ හිජ්රතය සඳහා හේතු පහදන්නන් එතුමා රාජ්‍යයක් පිහිටුවීම සඳහා හිජ්රත් කළ බව පවසති. මක් නිසාද යත් ඉස්ලාම් වනාහි ලෝක අවසානය තෙක් පැවැතිය යුතු දහමකි. ඒ සඳහා දේශපාලන, සමාජ, ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික, පවුල්, ආධ්‍යාත්මික, සදාචාරාත්මක කටයුතු පිළිබඳ මඟපෙන්වීම් සියල්ල පෙන්වා දීමේ වගකීම නබි (සල්) තුමාට තිබුණි. පෞද්ගලික ඉබාදත්, ඉමාරත්, කිලාෆත් වගකීම් හා මගපෙන්වීම් ලබා දීමේ අවශ්‍යතා ද විය. එනිසා එතුමා රජයක් මගින් ඒ සඳහා වන මඟපෙන්වීම් ලබා දුන්හ.

  මිනිසා එක් ව ජීවත් වීමේ දී ගැටලු ඇති වන්නේ ය. එම ගැටලු නිරාකරණය කිරීමට හා නීතිය හා සාමය පවත්වාගෙන යාමටත් ආයතනයක් අවශ්‍ය වන්නේ ය. එම ආයතනය, රජය වන්නේය. නබි (සල්) තුමා මදීනාවේ සමාජයක් නිර්මාණය කිරීමටත්, අධීක්ෂණය කිරීමටත් රජයයක් බිහි කළහ. පරිසරයෙන් ඉටු කළ නොහැකි ඒවා රජයකින් ඉටු කළ හැකි වන්නේ ය. මෙම අදහස රජයේ ආධිපත්‍යය ගෙන හැර දක්වයි. රටක නායකයා ද වූයේ ය. එනිසා හමුදාවක් ඇති කිරීමට ද එතුමාට හැකි විය. තම දූතයා ගස්සානිය යුව රජු මරා දැමීම වෙනුවෙන් පළි ගැනීමට ද හැකි විය.

- එනිසා එතුමා මදීනාව අග නගරය කරගෙන එහි නගර පාලනයක් ඇති කළහ. මස්ජිදුන් නබවි රජයේ කේන්ද්‍රස්ථානය කළහ. පරිපාලන සීමාව පුළුල් වූ විට නයීබ්වරු පත් කළහ. ලිපි ලිවීමටත්, ගිවිසුම් ඇති කර ගැනීමටත් ලේඛනාදිය ආරක්ෂා කිරීමටත් කාතිබ්වරු පත් කරනු ලැබූහ. විටෙක ස්ථිර පදනමින් ද තවත් විටෙක තාවකාලික පදනමින් ද ඔවුන් පත් කරනු ලැබූහ. සාමාන්‍යයෙන් කාතිබ්වරු 46 දෙනෙක් ලේඛන 246 ක් සකස් කළ බව සොයාගෙන ඇත. බිලාල් (රළි) තුමා නබි (සල්) තුමාගේ පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කළහ. විවිධ රටවලට පණිවිඩ ගෙන යෑම සඳහා රුසුල් යන අය පත් කරනු ලැබූහ. හුදයිබියා ගිවිසුම සඳහා රුසුල්වරු තිදෙනෙක් කුරෂෛවරු වෙතට යවනු ලැබූහ. රුසුල්වරු ඉස්ලාමීය කැඳවුම් ලිපි රජවරු වෙත රැගෙන ගියහ. හිජ්රී 6 වන වසරෙන් පසුව දුර ප්‍රදේශ පාලනය කිරීම සඳහා වලි යන අය පත් කරනු ලැබූහ. වාලිද් ඉබ්නු ජබල් (රලි) යෙමන් ප්‍රදේශයේ වලි ලෙස පත් කරන ලදී. මුදල්, නීතිය, පරිපාලනය ආදී වගකීම් ඔහුට පවරා තිබුණි. උස්මාන් බින් අබුල් ආස් (තාඉෆ්) අදාබින් ආසිෆ්, මක්කා, ආදීන් ද වලි ලෙස සේවය කර ඇත. සාමාන්‍යයෙන් වලිවරු 32 දෙනෙක් වූ බව ගණනය කොට ඇත. ගෝත්‍රික නායකයන් වූ නකීබ්, රුආසා යන නම්වලින් පත් කරන ලද මෙම අය මධ්‍යම රජයෙන් බදු අයකිරීම සඳහා නිළධාරීන් නොගිය අවස්ථාවල ගෝත්‍රයේ බදු අයකර මදීනාවට එවන ලද්දේ මෙම අය විසිනි. නීතිය හා පරිපාලනය සඳහා සේවකයන් පත් කරනු ලැබූහ. උමර් (රළි), අලි (රළි), මුආද් (රළි), ඉබ්නු මස්ඌද් (රළි), අබු මුසා අල්අෂ්ෂරි (රළි), සෙද් ඉබ්නු සාබිත් (රළි) ආදීන් කාලිවරු ලෙස කටයුතු කළහ. පොළවල්වල වෙළෙඳ කටයුතු අධීක්ෂණය සඳහා සාහිබුල් සූක් යන අය පත්කර තිබුණි. මක්කාවේ සඊත් ඉබ්නු සඊත් අල්ආස් මදීනාවේ උමර් (රළි) තුමා ආදීන් මෙම කටයුතු සඳහා පත්කර සිටියහ. මෙය නබි (සල්) තුමා තම පාලනය ඉතා යහපත් තත්ත්වයන් පවත්වාගෙන යාම සඳහා සහායකයින් රැසක් පත් කළ බවට ඇති හොඳ සාධකයකි. මෙම ආරම්භ පියවරවල් උමර් (රළි) තුමාගේ කාලයේ දී පළාත් පාලන ක්‍රමයක් බිහිකිරීම දක්වා ව්‍යාප්ත වූ බව පැවසිය හැකිය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම**

පියවර 1 : නබි (සල්) තුමාගේ මක්කා ජීවිතයෙන් මදීනා ජීවිතය කෙසේ වෙනස් වන්නේ දැයි සෙවීම සඳහා තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් තුනකට බෙදා පහත මාතෘකා යටතේ සාකච්ඡා කිරීමට යොමු කරන්න.

i. දැඩවා ක්‍රමය
ii. පුද්ගලයින් හා සමාජය
iii. විරුද්ධවාදීන් කෙරෙහි කටයුතු කළ ආකාරය

පියවර 3 : සාකච්ඡා කළ කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 4 : වැදගත් කරුණු සටහන් කරගැනීමට සලස්වන්න.

**අමතර කියවීම සඳහා**


1. අබුබක්කර් . එම්. - ඉස්ලාමීය ඉතිහාසය (1998) ඉස්ලාමීය පර්යේෂණ සංගමය, සායින්ද මරුදු (දෙමළ)
2. සයිබූර් රහ්මාන් මුබාරක් පූරි අර්රහීක් (1979) දාරුල් හුදා. වෙන්නයි
3. එම්. එච්. එම්. නාලීර් (1983) ඉස්ලාමීය සංස්කෘතියේ බිහිවීම හා වර්ධනය හා පිරිහීම
4. එම්. ඒ. එම්. අමීන් රචනා කළ අස්සහ්රාක් , කාන්තා විදුහල, ඔට්ටමාවඩි

**නිපුණතාව 8.0 : නබි මුහම්මද් (සල්) තුමාගේ පැමිණීමේ අරමුණ හා එතුමන්ගේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ කටයුතු වටහා ගෙන කුලෆාඋර් රාෂිදීන් කාලයේ දී පැවති සමාජ, දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳවත් දැන ඒවා පූර්වාදර්ශ කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.3 :** ඉස්ලාමීය කිලාෆත් මූලධර්මය ක්‍රියාත්මක වූ ආකාරය ඓතිහාසික දෘෂ්ටිකෝණයෙන් විමසයි.

**කාලය :** කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල :**

- කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්ෂණ හඳුනාගෙන ලියා දක්වයි.
- පෞරුෂ ලක්ෂණ හා යහ පාලනය අතර සම්බන්ධතාව තර්කානුකූලව ගෙනහැර දක්වයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- **කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්ෂණ**

නබි (සල්) තුමාගෙන් පසුව මුස්ලිම් සමාජයට නායකත්වය දුන් අය කලීෆාවරු නම් වෙති. පළමු කලීෆාවරයා වූ අබූබක්කර් (රළි) තුමා ජනතාව විසින් කලීෆාවරයා ලෙස තෝරා පත්කළ විට කලීෆතුල්ලාහ් රසූලුල්ලාහ් ලෙස තමා හඳුන්වා ගත්තේ ය. එතුමාගෙන් පසුව කලීෆා තනතුරට පත් වූ උමර් (රළි) තුමාව කලීෆතුර් රසූලුල්ලාහ් යැයි හඳුන්වා දුන්නේ ය. මෙහි තේරුම නබි (සල්) තුමාගේ නියෝජිතයා යන්න ය. පහසුව සඳහා මෙම නම කලීෆා යැයි කෙටිකොට සඳහන් වේ. එනම් නබි (සල්) තුමා කළ ඉමාමත් යන සමාජයට නායකත්වය දැරීමේ කාර්යය එතුමන්ගේ නියෝජිතයා ලෙස සිටිමින් ක්‍රියාකරන බව මෙහි අදහසයි. මේ අනුව කලීෆාවරයා විසින් පවත්වනු ලබන පාලනය කිලාෆත් පාලනය නමින් හැඳින්වේ. මෙයත් වෙනත් පාලනවලින් වෙනස් වූ පාලන ක්‍රමයකි. අබූබක්කර් තුමාගේ කිලාෆත් දේශණය කිලාෆත් සඳහා වන සීමා, ඉතා පැහැදිලි ව ගෙන හැර දක්වයි.

- කලීෆා වශයෙන් පත් කරනු ලැබුවේ කලීෆා රාජකාරිය ඉටු කිරීමට සුදුසුකම් ඇති අය පමණි. ඉස්ලාමය කෙරෙහි ස්ථිර විශ්වාසය හා පැහැදිලි දැනුම ඇති නබි (සල්) සමඟ සමීප ව ජීවත් වූ අය අතුරෙන් කලීෆාවරු තෝරාගනු ලැබීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. ඒ සියලු දෙනාම තම වගකීම ඉතා හොඳින් ඉටු කළා යන්න සියල්ලන් ම පිළිගන්නා කරුණකි.
- කලීෆා අබූබක්කර් (රළි) තුමා කුරේෂි කුලයේ කයිම් යන ගෝත්‍රයට අයත් වූහ. ක්‍රි.ව. 572 දී උපත ලද මෙතුමා ජාහිලියා කාලයේ ගුණාංගවලින් මිදුනු අයෙකි. අබ්දුල් කෑබා යනු එතුමාගේ නියම නම වන්නේ ය. ඉස්ලාමය වැළඳ ගත් පසු එතුමා අබ්දුල්ලාහ් යැයි සිය නම වෙනස් කර ගත්තේය. එනමුත් අබූබක්කර් යන අන්වර්ත නමකින් එතුමා හඳුන්වනු ලැබුවේය. සිද්දීක්, අතීක් යන වෙනත් නම් ද එතුමාට ඇත. හිජ්රි 11 සිට 13 දක්වා වූ වසර දෙකක කාලයක් එතුමා කලීෆා තනතුරේ සිටියේ ය.
- දෙවන කලීෆා වූ උමර් (රළි) තුමා, කුරෙෂි කුලයේ අතී නම් ගෝත්‍රයට අයත් වූයේ ය. ක්‍රි.ව.583 දී උපන් එතුමා, අබූ හෆ්ස්, ෆාරුක් යනුවෙන් ද හඳුන්වනු ලැබුවේ ය. හිජ්රි 13 සිට 23 දක්වා වසර 10 ක පමණ කාලයක් එතුමා කලීෆා තනතුර දැරුවේ ය. ඔහුගෙන් පසුව කලීෆා තනතුරට පත් වූ උස්මාන් (රළි) තුමා කුරෙෂි කුලයේ උමෙයා ගෝත්‍රයේ උපත ලැබුවේ ක්‍රි.ව. 575 දී ය. දුන්නූරයින්, ජාමිඋල් කුර්ආන් යන සුවිශේෂ නම් ද එතුමාට තිබුණි. හිජ්රි 23 පටන් 35 දක්වා මෙතුමා කලීෆා තනතුර දැරුවේ ය. වැඩිකලක් කලීෆා තනතුර දැරීමේ ගෞරවය මෙතුමාට හිමි ය.

හතරවන කලීෆා ලෙස තෝරා පත්කර ගත් අලි (රළි) තුමා කුරෙෂි කුලයේ හාෂිම් ගෝත්‍රයේ ක්‍රි.ව.599 දී උපත ලැබුවේ ය. අබුතුරාබ්, හෛදර් යන සුවිශේෂ නම් මෙතුමාට හිමි විය. හිජ්රි 36 පටන් හිජ්රි 40 දක්වා වසර පහක් මෙතුමා කලීෆා තනතුර දැරුවේ ය.

- ඉස්ලාමය වැළඳ ගත් පළමු පිරිමියා අබුබක්කර් (රළි) ය. ඉස්ලාමය වැළඳගත් ප්‍රථම ළමා වියේ පුද්ගලයා අලි (රළි) තුමා ය. ඉස්ලාමය වැළඳ ගත් ප්‍රථම දසදෙනා අතර උස්මාන් (රළි) තුමා ද විය.

  ප්‍රථමයෙන් ඉස්ලාම් විරෝධී ව සිට පසුව ඉස්ලාම් වැළඳ ගත්තේ උමර් (රළි) තුමා පමණි. නුබුව්වත් 5 වන වසරේ දී නබි (සල්) තුමාගේ ප්‍රාර්ථනයේ ප්‍රතිඵලයක් වශයෙන් එතුමා ඉස්ලාමය වැළඳ ගත්තේ ය. ඉස්ලාමය වැළඳගත් මේ සියලු දෙනාම පොදුවේ මුෂ්රික්වරු වූ ඥාතීන් හා අන් අය විසින් තාඩන පීඩනවලට ගොදුරු කරනු ලැබූහ. එහෙත් ඒ සියල්ල ඉවසා දරා ගනිමින් ඉස්ලාමයේ දැඩි ව සිටියහ. ඒ අතර ඉස්ලාමයේ උන්නතිය උදෙසා ද ආරක්ෂාව උදෙසා ද වර්ධනය උදෙසා ද අතිමහත් සේවයක් ඉටු කළහ. තම ජීවය, දේපළ ශක්තිය, කාලය, බලතල යන සියල්ල ඉස්ලාමය වෙනුවෙන් කැප කළහ. නබි (සල්) තුමා ද ඉස්ලාමය ද සියල්ලට ම වඩා උතුම් කොට සැළකූහ. ඉතාමත් චාම්, භක්තිමත්, පූර්වාදර්ශී ජීවිතයක් ඔවුන් ගත කළහ. අවංකත්වය, සත්‍ය බව, යුක්තිය, සාධාරණත්වය, ඉවසීම, දානපතිත්වය, තක්වා, අමානත් වැනි යහගුණ ඔවුන් සතු විය. මුස්ලිම් සමාජයේ යහපත කෙරෙහි ඔවුන්ගේ පූර්ණ අවධානය යොමු වී තිබුණි. උම්මි සමාජයක උපත ලද ඔවුන් ලිවීමට කියවීමට දත් හා සමාජ තත්ත්වයක් ඇති අය වූහ.

  ප්‍රථම කලීෆාවරු දෙදෙනා තම දූවරු වන ආයිෂා (රළි) සහ හෆ්සා (රළි) නබි (සල්) තුමාට විවාහ කර දී තිබූ අතර, අනෙක් කලීෆාවරු දෙදෙනා නබි (සල්) තුමාගේ දූවරුන් වන රුකයියා (රළි), උම්මු කුල්තූම් (රළි) හා ෆාතිමා (රළි) සමඟ විවාහ වී සිටියහ. එසේ ඔවුන් අතර දැඩි නෑදෑ බන්ධනයක් විය.

- **ආගමික හා සමාජ සේවාවන්**

නබි (සල්) තුමා දීර්ඝ කාලීන ජීවන ක්‍රමයක් ලොවට හඳුන්වා දුන්හ. ශතවර්ෂ 1/4 කාලයක් තුළ එය සිදුවිය. එහෙත් සංවර්ධනය වෙමින් පවතින සමාජයටත් ශිෂ්ටාචාර දියුණුවටත් ගැලපෙන සේ එය වැඩිදියුණු කර ගැනීම සමාජයට බාර දී ඇත. එය නබි (සල්) තුමාගේ අවසාන හජ් දේශණය වන හජ්ජතුල් විදා හි ඉතා පැහැදිළි ව සඳහන් කළහ.

එහෙත් ඉමාමත් (සමාජයේ නායකත්ව වගකීම භාරගත්) කලීෆාවරුනට රිසාලත් කාර්යය තවදුරටත් සොයා බලන්නට සිදු විය.

- නබි (සල්) තුමා වෆාත් වූ විට එතුමා කෙරේ දැඩි බැඳීමක් සහිත වූ අය එතුමා වෆාත් වූයේ නැතැයි සැලකීමටත්, කීමටත් පෙළඹුනහ. අන් අය මෙන් එතුමා ද මරණයට පත්විය හැකි අයෙකැයි යන සත්‍යය අබුබක්කර් (රළි) තුමා තහවුරු කළහ.
- අල්ලාහ්ගේ දූතයාණන්ගේ පෞරුෂය කෙරෙහි විශ්වාසය තැබූ ග්‍රාමීය අරාබිවරු එතුමා පිළිගත්හ. එහෙත් ආත්මාර්ථකාමී ගෝත්‍රික නායකයන් තමා ද නබි යැයි ප්‍රකාශ කළ විට අඥාණය නිසා ඔවුන්ට අවනත ව මුර්තද් වූහ. මෙම මුතනබ්බිවරුන්ට සහ මුර්තද්වරුන්ට විරුද්ධව කලීෆා අබුබක්කර් (රළි) තුමා සටන් ප්‍රකාශ කළහ.

  නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසු zසකාත් නොදෙන බව සමහර ගෝත්‍රිකයන් දන්වා සිටි අතර, zසකාතයෙන් තමා නිදහස් කරන ලෙස කරුණු ඉදිරිපත් කළ විට, අබුබක්කර් (රළි) තුමා එය ප්‍රතික්ෂේප කරමින් දැඩි ලෙස ක්‍රියා කළහ.

අල්කුර්ආනය වනපොත් කර තිබූ හාෆිල්වරු යමාමා යුද්ධයේ දී වැඩි වශයෙන් අභාවයට පත් වූ අවස්ථාවේ දී එසේ සිදුවන අයහපත් ඵල ගැන සළකා ද උමර් (රළි) තුමා, අබුබක්කර් (රළි) තුමා හමු වී පැමිණිලි කළහ. එවිට අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ කාර්යයට එතුමා අණ කළහ. මුස්හෆ් යන පිටපත ලියා එය ආරක්ෂා කළහ. උස්මාන් (රළි) තුමාගේ කාලයේ දී කුරෙෂිවරුන්ගේ භාෂා රටාවට අල්කුර්ආනය ලියනු ලැබූ අවස්ථාවේ දී අබුබක්කර් (රළි) තුමාගේ කාලයේ ලියන ලද පිටපත ඒ සඳහා යොදා ගන්නා ලදී.

- සමාජයේ නායකයා ලෙස, සමාජ ගැටලු ගෙන ආ අවස්ථාවේ දී, එම ගැටලුවලට මුහුණ දෙන්නේ කෙසේ ද ? ඒවාට විසඳුම් ලබා දෙන්නේ කෙසේ ද යන්නට අබුබක්කර් රළි තුමා පූර්වාදර්ශ සැපයූහ. සහාබාවරු එක් වී අල්කුර්ආන් හා සුන්නාහි පදනමින්, විසඳුම් ලබා දුන්හ. පසුව උමර් (රළි) තුමා මෙම කාර්යයන් සඳහා සහාබාවරු පත් කළහ. මෙහි වර්ධනය වූ අවස්ථාවක් ලෙස ඉජ්තිහාද් යන ක්‍රමය බිහි වී වර්ධනය විය.
- බද්ර් යුද්ධයේ සිරකරුවන් ළමුන්ට ලිවීමට කියවීමට ඉගැන්වීම සඳහා යොදාගත් ක්‍රියා පිළිවෙළ, උමර් (රළි) තුමාගේ පාලන සමයේ ළමා පාසල් බවට පරිවර්තනය විය. අල්කුර්ආනය සහ සුන්නාව අරාබිවරු පමණක් නොව අජමිවරු පවා (සිරකරුවන් ඇතුළුව) ඉගෙන ගැනීමේ අවස්ථාව මෙයින් උදා විය.
- නීති ක්ෂේත්‍රය දැඩි අවධානයෙන් යුක්තව යොමු කළ උමර් (රළි) තුමා ජනයා නීති ක්ෂේත්‍රයට අදාළ වූ දැනුම ලබා ගත යුතු බව අවධාරණය කළහ. වෙළෙඳපොළ විස්තර නොදැන වෙළෙඳුන් පොළට යායුතු බව එතුමා අණ කළහ. මුස්තහිබ් යන නිරීක්ෂකවරු ඒ සඳහා පත් කළහ. අපරාධ සිදුනොවෙන පරිසරයක් ඇති කළ පසු අපරාධවලට (විභාග කර) දඬුවම් පමුණුවීමට ඉදිරිපත් වූහ.
- උස්මාන් (රළි) තුමා හා අලි (රළි) තුමා පෙර කලීෆාවරුන්ගේ මාර්ගයේ ම යමින් තම පාලන කාලයේ ඇති වූ ගැටලු ඉතා සන්සුන්ව ද, සියුම් ලෙස ද අවධානයට යොමු කළහ. එමගින් ඉස්ලාමයේ යථාර්ථය රැක ගත්හ. සමාජ අවශ්‍යතා සපුරාලූහ.
- කලීෆාවරුන්ගේ සමාජ කාර්යයේ වඩාත් වැදගත් කාර්යය වූයේ සමාජය එක්සේසත් කිරීමය. නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසුව ෂකීෆා බනී සාඉදා හි එක්රැස් වූ මුහාජිරීන්වරුන් සහ අන්සාරිවරු අතර ඇති වූ නායකත්වය සඳහා වූ තර්කය සමාජය භේද භින්න කිරීමට හැකි තත්ත්වයට ගිය විට අබුබක්කර් (රළි) තුමා ඉදිරිපත් වී, දෙපාර්ශවය ම සනසා සාමාන්‍ය තත්ත්වයට ගෙන ආහ.
- අල් කුර්ආනය පහළ කරනු ලැබූවේ කුරෙෂිවරුන්ගේ ව්‍යවහාර භාෂාවෙන් වුව ද, ඒ ඒ අයගේ ව්‍යවහාර භාෂාවෙන් ලිවීමට හා උසුරීමට අවසර ලැබුණි. පසුව මෙසේ විවිධ ව්‍යවහාර භාෂාවලින් උසුරූ අය, පළාත්වලට ගොස් අල්කුර්ආනය ඉගැන්වූ විට, විවිධ ප්‍රදේශවල අය විවිධ ආකාරයට අල්කුර්ආනය උසුරීමට පටන් ගත්හ. මෙය හුදයිෆා (රළි) විසින් අවධානය යොමු කර පසු යහපත ගැන සළකා මෙය කළීෆාවරයාගේ අවධානයට යොමු කළහ. ඒ නිසා කලීෆා උස්මාන් (රළි) තුමා අල්කුර්ආනය කුරෙෂිවරුන්ගේ ව්‍යවහාර භාෂාවෙන් කියවීමටත් ලිවීමටත් කටයුතු සැලැස්වූහ. මෙය ද සමාජය බේද භින්නවීමෙන් වළකා ගත් තවත් එක් ක්‍රියාවකි.
- උමර් (රළි) තුමාගේ පාලන සමයේ ඉස්ලාමය බෙහෙවින් ව්‍යාප්ත වූ විට. අජමිවරුන්ගේ සංඛ්‍යාව වැඩි විය. අරාබිවරු සහ අජමිවරු අතර ගැටලු මතු නොවන සේ උමර් (රළි) තුමා බෙහෙවින් පරීක්ෂාකාරී විය.

  දිම්මිවරුන්ගේ කටයුතු කෙරෙහි එතුමා දැක් වූ සැලකිල්ල මෙයට මනා සාක්ෂි දරයි.

- කලීෆාවරු හතර දෙනා සමාජයේ ජීවත් වූ දුබලයින් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළහ. ඔබ අතර සිටින ප්‍රබලයා මා ඉදිරියේ දුබලයා ය යන අබූබක්කර් (රළි) තුමාගේ කිලාෆත් දේශනයෙන් එළි දැක්වෙන්නේ මෙයයි.

  දුගී දුප්පතුන්, අනාථයින්, වැන්දඹුවන්, රෝගීන්, වයෝවෘද්ධයින් වැනි දුර්වල අය බයිතුල්මාල් හි කොටස්කරුවන් ලෙස සලකන ලදී. පෞද්ගලිකව ද කලීෆාවරයා ලෙස ද ඔවුහු සියලු දෙනා සමඟම දයාවෙන් කරුණාවෙන් කටයුතු කළහ.

  උමර් (රළි) තුමා බයිතුල්මාල්හි වස්තුවලින් දුබල අයගේ කොටස නිවැරදි ව ගණන් බලා ඔවුනට උදව් උපකාර කළහ. ඔවුන්ගේ අපහසුතා, අවශ්‍යතා දැනගැනීම සඳහා විවිධ උපක්‍රම යෙදූහ. තජ්ලා ගඟ අසබඩ එළු පැටියෙකු දුකට පත් වුව ද මම එයට වගකිව යුතු ය යන දැඩි අවධානය ඔවුන් සතු විය.

- උස්මාන් (රළි) තුමා මහත් ධනවතෙකි. එහෙයින් කලීෆාවීමට පෙර සමාජ සුභසාධන කටයුතුවල යෙදුනාහ. මදීනාවේ බිඃරු රූමා යන පොදු ළිඳ මිල දී ගෙන වක්ෆු කිරීමේ සිද්ධියෙන් මෙය තහවුරු වන්නේ ය. කලිෆා තනතුරු දැරූ කාලයේ දී හරම් දෙකම විස්තීර්ණ කළහ. ඒ සඳහා ඉඩම් මිලදී ගත්තේ ය. මස්ජිද අළුත්වැඩියා කළේය.

- උමර් (රළි) තුමාගේ කාලයේ දී මහාමාර්ග ඉදිකරන ලදී. පාලම් ඉදිකරන ලදී. සෙවන ගස් සිටුවන ලදී. නැවතීම් ශාලා ඉදිකරන ලදී. ළිං හාරන ලදී. ඇලවල් ඉදිකරන ලදී. මේවා සමාජ සුභසාධන සේවාවන් ය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : කලීෆාවරුන් බවට පත්වන්නන් සතුවිය යුතු ගුණාංග කෙටියෙන් දක්වන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා කලීෆාවරුන් හතර දෙනාගේ ගුණාංග පිළිබඳ සාකච්ඡා කිරීමට යොමු කරන්න.

පියවර 3 : සිසුන් නැවත කණ්ඩායම්කර කලීෆාවරුන්ගේ එම යහ ගුණාංග, ඔවුන්ගේ පාලනයේ කෙසේ දායක වූවා දැයි සාකච්ඡා කිරීමට යොමු කරන්න.

පියවර 4 : පියවර 3 හි සාකච්ඡා කළ කරුණු පන්ති කාමරයේ ඉදිරිපත් කිරීමට සලස්වන්න. වැදගත් කරුණු සටහන් කර ගැනීමට සලස්වන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- මුහම්මද් තම්බි - අබූබක්කර් (රළි)
  උමර් (රළි)
  උස්මාන් (රළි)
  අලි (රළි)
- අබූබක්කර් ඒ. එම්. ඉස්ලාමීය ඉතිහාසය - I කොටස (1998), ඉස්ලාමීය පර්යේෂණ සංගමය (දෙමළ)
- ඉබ්රාහිම් සෙයියිද් - කලීෆාවරු හතරදෙනා (1965) වලර්මදි ප්‍රකාශනය, චෙන්නායි (දෙමළ)
- අමීන් එම්. අයි. එම්. - අබූබක්කර් (රළි) (...........) අල්හසනාත් ප්‍රකාශනය, හෙම්මාතගම (දෙමළ)

**නිපුණතාව 8.0 : නබි මුහම්මද් (සල්) තුමාගේ පැමිණීමේ අරමුණ හා එතුමන්ගේ විවිධ ක්ෂේත්‍රවලට අදාළ කටයුතු වටහා ගෙන කුලෆාඋර් රාෂිදීන් කාලයේ දී පැවති සමාජ, දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳවත් දැන ඒවා පූර්වාදර්ශ කර ගනියි.**

**නිපුණතා මට්ටම 8.4 :** කිලාෆතයේ ව්‍යාප්තිය හා පරිපාලන ක්‍රම කාල වකවානු වශයෙන් වෙන්කොට අගයයි.

**කාලය :** කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල :**

- කිලාෆතය බිහි වූ ආකාරය සාකච්ඡා කර ප්‍රකාශ කරයි.
- කිලාෆතය ව්‍යාප්ත වීමට හේතු හඳුනාගෙන දක්වයි.
- කුලෆාඋර්රාෂිදීන්වරුන්ගේ සමයේ ප්‍රාන්ත පාලන ක්‍රමයේ උන්නතිය සංසන්දනාත්මක ව ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

**පරිපාලන ව්‍යාප්තිය**

- නබි (සල්) තුමා හුදයිබියා ගිවිසීමෙන් පසු අරබිය අවට තිබූ කුඩා රජවරුන්ට සහ අධිරාජ්‍යයන්ට යැවූ කැඳවුම් ලිපි, එක්තරා ආකාරයෙන් රාජ්‍යය විස්තීරණය කිරීමට හේතු විය. බෙසන්දිය රජු වෙත ගිය දූතයා ගස්සානිය සුළු රජ විසින් ඝාතනය කරනු ලැබූ විට, එහි විරුද්ධ ව ක්‍රියා කිරීම ලෙස හිජ්රි 8 හි දී මූතා යුද්ධය ඇවිළුණි. හිජ්රි 9 දී තබූකය වෙත ගියහ. හිජ්රි 11 දී උසාමා (රළි) ගේ නායකත්වය යටතේ හමුදා සේනාංකයක් සකස් කරන ලදී. එය පිටත් වීමට පෙර නබි (සල්) තුමා වෆාත් වූහ.

- අබූබක්කර් (රළි) තුමා උසාමා (රළි) තුමාගේ නායකත්වයෙන් යුත් හමුදා සේනාංකය යවා තැබූහ. එය ආපසු පැමිණි පසු බෙසාන්තිවරු මූර්තද්වරුන්ට සහාය දැක්වීමෙන් කිලාෆතයේ කටයුතුවලට ඇඟිලි ගසන්නට වූහ. එම අවස්ථාවේ දී කලීෆා අබූබක්කර් (රළි) තුමා යසීද් බින් අබූසුෆියාන්, සුරහ්බිල් බින් හසනා, අම්ර් ඉබ්නු ආස්, අබූ උබෛදා ආදී සහාබාවරුන්ගේ නායකත්වය යටතේ හමුදා සේනාංක හතරක් බෙසාන්තිය පාලනය යටතේ පැවැති ෂාම් ප්‍රදේශයට යවා තැබූහ. බෙසාන්තිය රජු මොවුන් සමඟ සටනට ලක්ෂ හතරක හට පිරිස් සහිත සේනාංකයක් එවා තැබුවේය. එවිට සතුරන්ට විරුද්ධ සෙන්පතිවරු හතර දෙනා එක් ව සටන් කිරීමට තීරණය කර, ඒ පිළිබඳ ව කලීෆාවරයාට දැන්වූහ. කලීෆා මෙයට අවසර දුන් අතර පර්සියාවේ සටන් මෙහෙයවමින් සිටි කාලිද් (රළි) තුමා ද ෂාම් දේශයට යවා තැබූහ. එතුමා සෙන්පතිවරු හතර දෙනා හමු වී යුධ බිමේ තත්ත්වයන් සොයා බැලුවේ ය. පසුව යර්මුක් යන ස්ථානයේ දී කාලිද් (රළි) තුමාගේ නායකත්වය යටතේ සටන සිදුවිය. මුස්ලිම් හමුදාවට ජය අත්පත් විය. විරුද්ධවාදීහු බිහිල් නම් ස්ථානය යටත් කළේය. මෙයින් පසුව හිජ්රි 13 දී ඩමස්කසය මුස්ලිම්වරුන්ගේ පාලනයට යටත් විය. ඒ සමඟම අජ්නදයින්, මර්ජ්රාහිත්, හිම්මස්, කින්සරීන්, කයිසාරියා යන ප්‍රදේශය ද කිලාෆතයට යටත් විය.

- ෂාම් කිලාෆතය යටත් වූ පසු මුස්ලිම්වරු ඊජිප්තුවෙන් පහර දෙනු ලැබූහ. හිජ්රි 19 දී අම්ර් ඉබ්නු ආස් (රළි) ඊජිප්තුව බෙසාන්තියවරුන්ගෙන් බේරාගන්නා ලදී. එරට රජු වූ මුකව්කස් කිලාෆතය සමඟ සාමයට එළෙඹියේය. ඊජිප්තුව අහිමි වූ බෙසස්තියවරු අලක්සන්ද්‍රියාවේ

සිට ඊජිප්තුවට පහර දුන්හ. නාවික හමුදාවක් නො තිබූ නිසා මුස්ලිම්වරුනට සමාදානයට එළඹීමට සිදු විය. කලීෆා උස්මාන් (රළි) තුමාගේ කාලයේ දී නාවික හමුදාව පිහිටුවන ලදී. ඇලක්සන්ඩ්‍රියාව මුස්ලිම්වරුන්ගේ පාලනයට පත් විය. හිජ්රි 28 දී මධ්‍යධරණී මුහුදේ දූපතක් වූ සයිප්‍රසය කිලාපත් පාලනයට පත් විය.

- පර්සියාවට යවනු ලැබූ ලිපිය ඉරා දැමීම රජ නබි (සල්) තුමා අත්අඩංගුවට ගන්නා ලෙස යෙමනයේ නිලධාරියාට අණ කළේය. නබි (සල්) තුමා අත්අඩංගුවට ගැනීමට එහි සිට නිළධාරීන් දෙදෙනෙක් පැමිණියහ. රජු ඝාතනය කරනු ලැබූ ආරංචිය ඔබගේ නිලධාරියාට පවසන ලෙස කී විට ඒ දෙදෙනා මදීනාවෙන් පිටව ගියහ. පර්සියානු රජ පවුලේ පැවති ගැටුම් නිසා රජතුමා ඔහුගේ පුත්‍රයා විසින් ඝාතනය කරනු ලැබුවේය. මේ නිසා රජ පවුලේ සාමය බිඳී ගියේය. නබි (සල්) තුමාගේ ලිපිය පිළිබඳ ව අවධානය යොමු කිරීම සිදු නොවීය. අබුබක්කර් (රළි) තුමා කලීෆා වූ අවස්ථාවේ රජ පවුලේ සාමය ස්ථාපනය විය. මුස්ලිම්වරුන්ගෙන් පලි ගැනීමට අවස්ථාවක් බලා සිටියහ.

- අබුබක්කර් (රළි) තුමාගේ කාලයේ ඇති වූ මුර්තද්වරුන්ගේ කැරැල්ල පර්සියානුවරු හොඳින් යොදාගත්හ. සජාහ් යන කාන්තා මුතනබ්බි මදීනාවට භාරදීමට සූදානම් වූ විට, නක්ලබ් ගෝත්‍රික කණ්ඩායමක් මුස්ලිම්වරු සමඟ සටනට සූදානම් වූහ. එයට නක්ලබ් ගෝත්‍රික ක්‍රිස්තියානින් ද සහාය වූහ. පර්සියානු හමුදා සහාය ලබා දුන්හ. කිලාෆත් පාලන සීමාවේ තිබූ බහ්රයින්හි කුයිස් බක්ර් යන ගෝත්‍රිකයන් ජීවත් වූහ. ඔවුන් කලින් සතුරන් ව සිට, ඉස්ලාමය වැළඳ ගත් පසු මිතුරන් වූහ.

  රිද්දත් යුද්ධය පැවැති අවධියේ දී, බක්ර්වරුන්ට මුද්තද්වී කයිස්වරුන්ට පහර දුන්හ. පසුබිමෙහි පාර්සිවරුන් වූහ. දරාගත නොහැකි කයිස්වරු කලීෆාවරයාට දැනුම් දුන්හ. කලීෆා කාලිද් බින් වලීද්ගේ නායකත්වයෙන් යුත් සේනාංකයක් යවා තැබුවේ ද බක්ර් කෙස් යුද්ධය කිලාෆතය හා පර්සියාව අතර යුද්ධය බවට පත් විය. මුස්ලිම්වරු හිජ්රි 12 දී හිරා නගරය තම පාලනයට පත් කර තවදුරටත් යුද්ධ කරමින් සිටි අවස්ථාවේ දී කලීෆාගේ අණ පරිදි කාලිද් තුමා ෂාම් දේශයට පෙරළා ගියේය. මුසතනා (රළි) සෙන්පති විය. එතුමා හමුදා පැතූ නමුත් උදව් නොලැබීම නිසා හමුදාව සීමාවේ නවතා මදීනාවට පැමිණියහ. එවිට අබුබක්කර් තුමා මරණයට පත් වී උමර් (රළි) තුමා කලිෆා බවට පත් වී සිටියේ ය. උමර් (රළි) තුමා අබූ උබයිදා යන අයගේ නායකත්වය යටතේ සහායක සේනාංකයක් යවා තැබුවේය. එම හමුදාව යුප්‍රටීස් ගඟින් එතෙරව සටන් කරන්නට වූහ. පර්සියානු ඇතුන් දැක අරාබි අශ්වයින් හා ඔටුවන් පැන දුවන්නට වූහ. ඊළඟ සටනේ දී පර්සියානු ඇතුන් බිය ගැන්වූහ. පර්සියානුවරු පරාජයට පත් වූ අතර, හිජ්රි 14 දී යුප්‍රටීස් ගඟ අවට පෙදෙස් මුස්ලිම් පාලනයට පත්විය.

- මෙයින් පසු මුස්ලිම්වරු පැරදවීම සඳහා පර්සියානුන් සියලුම නගරවල හමුදා රැස්කළහ. මෙය කලීෆාට දන්වනු ලැබූ විට කලීෆා තමා ම හමුදා මෙහෙයවා සටනට යෑමට කැමති විය. එහෙත් සහාබාවරු එයට විරුද්ධ වූහ. එනිසා සඊද් බින් අබී වක්කාස් (රළි) නායකත්වයෙන් යුත් සේනාවක් යවා යුද්ධය පවත්වන ලදී. 30,000 ක භටයින්ගෙන් සමන්විත සේනාව 100,000ක යුද සේනාවක් සමඟ කාදිසිය්යා යන ස්ථානයේ ගැටුණි. දින තුනක් පැවති යුද්ධය අවසානයේ මුස්ලිම්වරු ජය ලැබූහ.

- පරාජයට පත් වූ පර්සියානුන් ක්‍රමයෙන් මදා ඉන් (හිජ්රි 16) ජෙලුසා, ජෙසීරා, අහ්වාස්, නිහාවන්ත් (හි. 21), නගරයට පලාගොස් කැරලි ගසන්නට වූහ. මුස්ලිම්වරු ඒ ස්ථානවලට ගොස් කැරලි මර්දනය කර ජය ලැබූහ. නිහාවන්ත් සමඟ (ජයග්‍රහණයේ ජයග්‍රහණය) ෆත්හුල් ෆුතූහ් යැයි හැඳින්වේ.

කලීෆා උස්මාන් (රළි) තුමාගේ කාලයේ ඉස්ෆහන්, අසර්බයිජාන් (හි. 22) ජුර්දාන්, තබරිස්ථාන්, ආර්මිනියාව, කිර්මාන්, සිජිස්ථාන් ආදී මධ්‍යම ආසියානු ප්‍රදේශ මුස්ලිම්වරුන්ගේ පාලනයට යටත් විය.

- මුස්ලිම්වරුන් රටවල් අල්ලා ගැනීමේ අරමුණින් හෝ ධන සම්පත් සූරාකෑමේ අදහසින් හෝ ජනයා යටත් කරගැනීමේ අරමුණින් හෝ සටන් නොකළහ. ඔවුන් සටන් කිරීම සඳහා බලකරනු ලැබූ අවස්ථාවල සටන් කිරීම හැර අන් යමක් කළ නොහැකි අවස්ථාවල පමණක් සටන් කළහ. පර්සියානුවන් හා බෛසාන්දියානුවන් කිලාෆතයට එරෙහිව ඉදිරිපත්වීමට හේතු රාශියක් විය.

  මුස්ලිම්වරුන්ගේ ජයග්‍රහණයට හේතු :

  * නායකත්වයට අවනත වීම හා විනය
  * බෛසාන්තිය, පර්සියානු පාලනයේ දක්නට ලැබුණු අඩුපාඩුකම්
  * මුස්ලිම්වරු අතර දක්නට ලැබූ යහපත් ගුණාංග හා ලක්ෂණ

**අභ්‍යන්තර ගැටලු හා ප්‍රතිඵල**

- නබි (සල්) තුමා ජීවත්වන කාලය තුළම මුතනබ්බිවරු බිහිවූහ. මම නබිත්වයේ ඔබගේ සහකාරයා වෙමි. ලෝකයේ අඩක් ඔබට ය. ඉතිරි අඩ මට අයත් යැයි මුසයිලමා නබි (සල්) තුමාට ලියා යැව්වේය. ඔවුන්ගේ අදහස වැරදි බව නබි (සල්) තුමා සහාබාවරු මාර්ගයෙන් දන්වා සිටියහ. එවිට තම වෑයම අත්හැරිය ඔවුන් නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසු නැවතත් හිස එසවූහ.

- නබි (සල්) තුමාගේ වෆාතය සමඟ අභ්‍යන්තර ගැටුම් ඇති විය. ඉස්ලාමය පිළිබඳ නිවැරදි අවබෝධයක් නැතිකම සතුරු කුමන්ත්‍රණ යනාදිය හේතු විය. මදීනාවට පිටතින් ගැටලු ඇතිවී වර්ධනය වූයේ ඒ නිසා ය. නබි (සල්) තුමාගේ කාලයේ ජීවත් වූ සහාබාවරු මදීනාවේ ජීවත් වීමත්, ඔවුන් ඉස්ලාමය නිවැරදි ව ඉගෙන ගෙන තිබීමත් එයට හේතු විය.

- අබූබක්කර් (රළි) තුමාගේ කාලයේ මුතනබ්බිවරු බිහිවූයේ හිජාසයට පිටතින් ය. ඔවුනට සහාය වූ මුර්තද්වරු ද ගම්බද අය වූහ. බලය ලබාගැනීමටත්, ආධිපත්‍යය වර්ධනය කර ගැනීමටත් නබිත්වය සුදුසු සාධකයක් ලෙස ඔවුන් සැලකූහ. නබි (සල්) තුමාට අපමණ බලය ලැබුණත්, එතුමා බලවත් වූයේත් එතුමා තමා නබිවරයා යැයි එළිදරව් කළ නිසා බැව් ඔවුන් විශ්වාස කළහ. ඉස්ලාමය යන්තම් වටහා ගත් ගෝත්‍රයන් ද තමන් සමඟ ගිවිසුම් ඇති කරගත් ගෝත්‍රය ද තමන් සමඟ එක්කර ගත්හ. මෙයට හේතු වූයේ ඔවුනට ඉස්ලාමීය දැනුම හා පුහුණුව පමණක් හේතු වේ.

  * බනූ හනීෆ් ගෝත්‍රයට අයත් මුසයිලමා බින් හබීබ් (යමාමා)
  * බනූ තක්ලිබ් ගෝත්‍රයට අයත් සජාහ් බින්ත් හාරිදා (යමාමා)
  * බනූ අසද් ගෝත්‍රයට අයත් දුලයිහා බින් කුවයිලිද් (තිර්ද්)
  * බනූ අනස් ගෝත්‍රයට අයත් අස්වත් (යෙමනය)
  * බනූ තුම්මි ගෝත්‍රයට අයත් මලික් බින් තුවයිරා වැන්නන් මොවුන්ගෙන් වැදගත් අය වෙති.

  මොවුනට විරුද්ධව කලීෆාවරයා සෙන්පතිවරු 11 දෙනෙක් යටතේ හමුදාව යැව්වේ ය.

  1. කාලිද් ඉබ්නු වලීද් - දුලයිහා මාලික් බින් නුවයිසිර ට විරුද්ධව
  2. ඉක්රිමා බින් අබූ ජහල් - මුසයිලමාට විරුද්ධව
  3. සුහ්බින් බින් හස්නා - ඉක්රිමාට සහායට හලරමවිත්

4. කාලිද් බින් සයිද් - සිරියාවේ මසාරි
5. අම්ර් ඉබ්නු ආස් - කුලා අක් ගෝත්‍රයට විරුද්ධව
6. හුදයිබා බින් මුහ්සින් - අහ්ලුල් වගා (උම්මාන්)
7. අර්ෆජා බින් හර්දමා - අහ්ලුස් මිහ්රා
8. තර්කා බින් හාජිබ් - සුලයිම් හවාසිස්
9. සිවයිද් බින් මුකර්රින් - යෙමනයේ දිනාමා
10. ආලා බින් හල්රම් - බහ්රයින්වල (හුතයිම් ගෝත්‍රය)
11. මුහාජිර් බින් අබු උමයියා - අබ්නා - අක්ස් ගෝත්‍රවලට එරෙහිව

ප්‍රධාන මුතනබ්බිවරු අතර මුසයිලමා, අස්වද් යන දෙදෙනා ඝාතනය කරනු ලැබූහ. තුලයිහා ඉස්ලාමය පිළිගත්තේය. සජාහ් බස්රාවේ මරණයට පත්වූවා ය.

- අබුබක්කර් (රළි) යුගයේ තත්ත්වය "ශීත ඍතුවේ දී වර්ෂාව පවතින රාත්‍රියක ගවපල්ලා රහිතව ඇවිදින ගවරැළ මෙන් ආගම වෙනස් කරගන්නා අවස්ථාවේ දී මුස්ලිම්වරුන්ගේ තත්ත්වය විය." යනුවෙන් ඉබ්නු මස්උද් (රළි) උපමාවකින් දක්වා ඇත.

- අබුබක්කර් (රළි) තුමාගේ කාලයේ රටේ අභ්‍යන්තර ප්‍රශ්න අතර zසකාතයෙන් නිදහස් වීමද එකකි.

  නබි (සල්) තුමාගේ කාලයේ දී zසකාතය නිසි අයුරින් ගෙවූ කත්බාන්, සුලයිම් ආදී ගෝත්‍රිකයන් zසකාතයෙන් නිදහස් වීමට අවසර ඉල්ලූහ. අමාරුවෙන් උපයාගත් දෑ අන් අයට දීමට අකැමැති වූහ. එහෙත් කලීෆාවරයා නබි (සල්) තුමාගේ කාලයේ දෙනු ලැබූ එක් එළු පැටියෙකු හෝ දීම ප්‍රතික්ෂේප කළේ නම්, එයට විරුද්ධ ව සටන් කරන බව අවධාරණය කළේය. මේ නිසා හිත් වෙනස් වූ ඔවුන් තම zසකාතය ගෙවූහ.

- කලීෆා උමර් (රළි) තුමා නීති රීති බුරුල් කළ හෙයින් අභ්‍යන්තර කැරළි කෝළාහල ඇතිවීමට හේතු විය. උමර් (රළි) තුමාගේ කාලයේ දී බෙසාන්තිය, පර්සියානු අධිරාජ්‍යයේ විශාල කොටස් මුස්ලිම්වරුන්ගේ පාලනයට යටත් විය. මේ ගැන ඊර්ෂ්‍යාවට පත් සමහරු කිලාෆතය විනාශ කිරීමට සැලසුම් කළහ. එහි ප්‍රථම පියවර වශයෙන් උමර් (රළි) තුමාගේ ඝාතනය සිදු විය.

- ඊළඟ පියවර ලෙස මුස්ලිම්වරු බේද භින්න කිරීම සඳහා පියවරක් ගන්නා ලදී. යෙමන් රාජ්‍යයෙන් පැමිණි අබ්දුල්ලාහ් ඉබ්නු සබා යන යුදෙව්වා උස්මාන් (රළි) ට විරුද්ධව ද, අලි (රළි) තුමාට පක්ෂව ද රහසිගත ව ප්‍රචාරය කරන්නට විය. අලි (රළි) තුමාට අයත් පාලන බලය උස්මාන් (රළි) තුමා පැහැර ගත් බව පැවසීය. පසුව කලීෆා උස්මාන් (රළි) තුමාට විරුද්ධව ද බොරු චෝදනා තම ආධාර කරුවන් හමුවේ තැබුවේය. හිජාසයට පිටින් කූෆා බසරා හා ෆුස්දාත් යන නගරවල විසූ ජනයා ඔහුගේ ප්‍රචාරයන්ට රැවටුණහ.

- උමර් (රළි) තුමා අනුගමනය කළ දැඩි පිළිවෙත් අතහැර දැමීම, ඉස්ලාමය ගැන නිසි වැටහීමක් නැති මවාලිවරුන්ගේ සංඛ්‍යාව වැඩි වීම, සමාජයේ ආර්ථික උස් පහත්කම් පැවතීම, කලීෆාගේ මොළොක් හිත හේතුවෙන් සතුරන් වෙත යොමු වූ ආකාරය සමහර නිලධාරීන්ගේ වැරදි පිළිවෙත් ආදිය කැරළි කලකෝළාහල වලට හේතු සාධක විය. ඉබ්නු සබා අවස්ථාව හොඳින් යොදා ගත්තේ ය. කැරැල්ලේ උච්චතම අවස්ථාවේ දී කැරළිකරුවන් විසින් කලීෆාවරයා ඝාතනය කරනු ලැබීය. කිලාෆතයේ අගනුවර වූ මදීනා නගරය කැරළිකරුවන් යටතට පත් විය.

- මෙම අවස්ථාවේ දී සහබාවරු අලි (රළි) තුමා කලීෆා ලෙස තෝරාගත්ත ද, උස්මාන් (රළි) තුමාගේ ඝාතනය කලීෆාට හිසරදයක් විය. එය කැරැල්ලේ ඊළඟ පියවර වෙතට කිලාෆතය ගෙන ගියේ ය. කැරළිකරුවන් මදීනාවෙන් පිට කිරීම, ඝාතකයා සොයා ගැනීම යන කරුණු නිසා ගැටලු මතු විය. කැරළිකරුවන් නගරයෙන් පිට කිරීම සඳහා අලුතින් ආණ්ඩුකාරවරු පත් කරන ලදී. තමා ද මදීනාවේ සිට කූෆා නගරයට ගියේ ය. එනමුත් කලීෆාවරයාගේ පාලන බලයට තුන්වන පාර්ශ්වයක් අතපෙවීම නිසා ඝාතනයට පළිගැනීමට වෑයම් කළ නිසා, ප්‍රශ්නය තව තවත් සංකීර්ණ විය. ඝාතනයට සම්බන්ධ යැයි සැක කළ සිය ගණන් අය මරා දමනු ලැබූහ. ආයිෂා (රළි) මව්තුමියගේ නායකත්වයෙන් කලීෆාවරයාට විරුද්ධව ක්‍රියා කරන්නට වූහ. මෙම සටන (ජමල් යුද්ධය) කලීෆා තුමා විසින් උපාය මාර්ගික ව වළක්වාලීය. එනමුත් දහස් ගණනකගේ මරණයට මෙය හේතු විය.

- උස්මාන් (රළි) තුමාගේ ගෝත්‍රයට අයත් උමෙයාවරු ඩමස්කස් හි එක්රැස් වී කලීෆාට විරුද්ධව කැරළි ගැසූහ. කලීෆා මොවුන් මර්දනය කිරීම සඳහා ෂාම්වලට පිටත් විය. හිජ්රි 37 දී මුආවියා (රළි) තුමාගේ නායකත්වයෙන් යුත් සේනාවක් සිෆ්ෆීන් හි හමු වූහ. අඩ වසරක් තිස්සේ පැවති සාකච්ඡාව ඉබ්නු සෆාත් කණ්ඩායමේ ක්‍රියාවෙන් අසාර්ථක විය. දෙපාර්ශවය අතර පැවැති යුද්ධයේ දී පරාජයට පත් වූ මුආවියා (රළි) තුමා කුර්ආන් පිටපත් ඔසවා පෙන්වූ කපටි ක්‍රියාවෙන් යුද්ධය නතර කර ගත්තේය. විසඳුමක් ලබාදීම සඳහා සමථ සභාවක් පිහිටුවන ලදී. එයින් නියම ප්‍රතිකාරයක් ලබා නොදෙන ලදී.

  සටන් නැවැත්වීම හා සමථ සභාවක් පිහිටුවීම ගැන විරුද්ධ වූ පිරිසක් අලි (රළි) තුමාගේ හමුදාවෙන් ඉවත් ව ගියහ. කවාරිජ්වරු යැයි හඳුන්වනු ලබන්නේ මොවුන් ය. තමන් හැර අන් සියල්ලන්ම නොමඟ ගිය අය යැයි තීරණය කළ ඔවුන් ඒ අය මරා දැමීම තම යුතුකම බව කියමින් දැඩි ක්‍රියාකාරකම්වල නිරත වූහ.

- සාමය ස්ථාපිත කිරීමේ වගකීම ඇති කලීෆාවරයා නහර්වාන් යන ස්ථානයේ දී (හිජ්රි 38) ඔවුන් සමඟ සටන් කළේය. ඉමහත් ජීවිත හානියක් ලැබූ කවාරිජ්වරු විසිරී පලා ගිය අතර, කලීෆාවරයා මුආවියා (රළි) හා අම්ර් ඉබ්නු ආස් යන තිදෙනා එකවර ඝාතනය කිරීමට සැළසුම් කළහ. ඔවුන් තීරණය කළ ආකාරයට ඉබ්නු මුල්ජම් යන කවාරිජ් කලීෆාවරයා ඝාතනය කළ අතර අන් දෙදෙනා බේරුණහ. හිජ්රි 40 දී සිදු වූ මෙම ඝාතනයෙන් පසුව ෂාම් හි ජනයා මුආවියා (රළි) තුමාගේ නායකත්වය යටතේ ද ඉරාකයේ ජනයා හසන් (රළි) තුමාගේ නායකත්වය යටතේ ද වෙන වෙනම ක්‍රියා කරන්නට වූහ. පසුව හසන් (රළි) තුමා මෙම තරගයෙන් ස්ව කැමැත්තෙන් ඉවත් වූ අතර කිලාෆතුර් රාෂිදා ව එයින් අවසන් විය.

**පාලන ක්‍රමය**

- නබි (සල්) තුමා මදීනා නගර පාලනය සඳහා පරිපාලන ක්‍රමයක් හඳුන්වා දුන්හ. ඉස්ලාමීය පාලනය අරාබි රටට සීමා වී පැවැති අවධියේ එය සෑහෙන්නක් විය. එහෙයින් කලීෆා අබූබක්කර් (රළි) තුමා එම පාලන ක්‍රමයම අනුගමනය කළෝය.

- කලීෆා උමර් (රළි) තුමාගේ වකවානුවේ දී කිලාෆත් ව්‍යාප්ත විය. එහෙයින් නව පරිපාලන ක්‍රමයක් හඳුන්වා දීම අවශ්‍ය විය. එහෙයින් නබි (සල්) තුමාගේ පාලන ක්‍රමය පදනම් කර විස්තීර්ණ වූ පරිපාලන ක්‍රමයක් ඇති කළහ.

- කලීෆා මදීනාවේ විසුවේය. එය අගනුවර විය. අනෙක් ප්‍රදේශ පළාත් බවට බෙදන ලදී. හිජාස්, යෙමන්, තායිබ්, ෂාම්, කූෆා, බසරා, ඊජිප්තුව, හිම්මස් යන පළාත් විය. අවශ්‍යතාව

අනුව පළාත් සංඛ්‍යාව අඩු වැඩි විය. ඒ ඒ පළාතේ පරිපාලන නිලධාරියා වශයෙන් වලී පත් කරනු ලැබීය. මුදල් පරිපාලනය ආමිර් යන අයට පවරා තිබුණි. හමුදා කටයුතු අමීර් භාරයේ ද, අධිකරණය කාලිගේ බාරයේ පැවතුණි.

- කලීෆාට උපදෙස් දීම සඳහා මජ්ලිෂුෂ් ෂූරා යන උපදේශක සභාවක් විය. තක්වා ඇත්තා වූත්, නීතිය පිළිබඳ දැනුම ඇත්තාවූත් ශාරීරික මානසික සුදුසුකම් ඇත්තාවූත්, අය එහි සාමාජිකත්වය දැරූහ. ස්ථිර සාමාජිකයින් හා තාවකාලික සාමාජිකයන් වූහ. උස්මාන් (රළි), අලි (රළි), අබ්දුර් රහ්මාන් (රළි), අබ්බාස් (රළි), උබයි ඉබ්නු කඅග් (රළි), මුආද් ඉබ්නු ජබල් (රලි) සයිද් ඉබ්නු සාබිත් (රළි) වැනි සුදුසුකම් ඇති සහබාවරු එහි ස්ථිර සාමාජිකයන් වූහ. තාවකාලික සාමාජිකයින් සාකච්ඡාවට බඳුන්වන කරුණු සම්බන්ධයෙන් නිපුණතාවය හා අත්දැකීම් ඇති අයගෙන් තෝරා පත් කරනු ලැබූහ. මෙම මණ්ඩලයේ නිර්දේශ මත පළාත් හා මධ්‍යම රජයේ නිලධාරීන් පත් කරනු ලබති. ඔවුන්ගේ වගකීම්, දේපළ, අයිතිවාසිකම් හා ජීවන වියදම් දීමනා ආදිය ද අනෙකුත් පහසුකම් ද තීරණය කරනුයේ මෙම සභාව ය. නිලධාරීන් තනතුරට පත්වන විට තම දේපළ පිළිබඳ විස්තරයක් මෙම මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුයි. නිලධාරීන්ගේ විනය කටයුතු භාරව කටයුතු කරන්නේ ද මෙම මණ්ඩලයමය.
- මුලදී යුධ කටයුතුවලට සහභාගී වූයේ ස්වෙච්ඡාවෙනි. බෙසාන්ත්‍රියාවේ හා පර්සියාවේ සටන්වලට සහභාගී වීමට පුහුණුව ලත් හමුදා සේනාංක අවශ්‍ය විය. ඒ නිසා ඔවුන් දීවානුල් ජුනද් යන හමුදා දෙපාර්තමේන්තුව මගින් පුහුණු කරනු ලැබ ක්ෂේත්‍රවලට යවා තබනු ලැබූහ.
- මින් පසු පරිපාලන අවශ්‍යතා සඳහා දිවානුල් දාරීද් යන තැපැල් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. දිවාදුල් ෂූර්ද් (පොලිස් දෙපාර්තමේන්තුව) , දිවානුල් අහ්දාද් (විනය කටයුතු භාර දෙපාර්තමේන්තුව) ආදිය ද පිහිටුවන ලදී. සමහර අවශ්‍යතා ඉටු කිරීම සඳහා තනි පුද්ගලයින්ද පත් කරනු ලැබූහ. උදාහරණ ලෙස මැනුම්කරු ලෙස උස්මාන් බින් හුනයිෆ් (රළි) තුමා ද, ඔම්බුට්ස්මන් ලෙස මුහම්මද් බින් මස්ලමා (රළි) තුමා ද පත් කරනු ලැබූහ.
- පරිපාලනය පහසු කිරීම සඳහා හිජ්රි වසර ක්‍රමය ද, මුදල් නිකුත් කිරීම ද සිදු විය.
- කිලාෆතයේ මුදල් තත්ත්වය සතුටුදායක නුවූ නිසා මුල් කාලවල දී බෛතුල් මාල් ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වූයේ නැත. පළාත්බද පාලන ක්‍රමය බිහි වූ විට, බහ්රයින්වලින් ලැබුණු අතිවිශාල ධනය කුමක් කරනවා ද යන්න මජ්ලිසුෂ් ෂූරාහි සාකච්ඡාවට භාජනය කරන ලදී. එවිට වලීද් බින් හිෂාම් යන අයගේ යෝජනාව පිළිගත් කලීෆා උමර් (රළි) තුමා බෛතුල් මාල් යන මුදල් ආයතනය බිහි කළේය. මෙය සාහිබු බෛතුල් මාල් යන අයගේ බාරයේ විය. zසකාත්, සදකා, ජිස්යා, කරාජ්, ගනීමා, උෂ්ර්, අල්බයිද යන විවිධ මාර්ගවලින් ආදායම් ලැබුණි. රජයේ පරිපාලන සහ හමුදාමය වියහියදම්වලටත් මහජන සුභසාධන කටයුතුවලටත් අවශ්‍ය සහනාධාර සැපයීම සඳහා මෙම මුදල් යොදා ගන්නා ලදී. එක් එක් පළාතක තනි තනි බෛතුල් මාල් විය. එම පළාතේ වියහියදම් තක්සේරු කර ඉතිරියක් වේ නම් ඒවා මධ්‍යම (මදීනා) බෛතුල් මාල් අරමුදලට යවන ලදී. ආදායම් අඩු පළාත් බයිතුල්මාල් අරමුදලට අවශ්‍ය විට දී මධ්‍යම අරමුදලින් උදව් කරන ලදී.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

පියවර 1 : කුලෆාඋර් රාෂිදුන්වරුන්ගේ පාලනය පිළිබඳ තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

පියවර 2 : ඔවුන්ගේ පාලනය යහපත් වීමට පහත දෑ හේතු වූයේදැයි කණ්ඩායම් තුළ සාකච්ඡා කිරීමට යොමු කරවන්න.

(අ) නබි (සල්) තුමාගේ මගපෙන්වීම්

(ආ) පාලනයේ ව්‍යාප්තිය

(ඇ) පරිපාලන ක්‍රමය

පියවර 3 : රැස්කළ තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 4 : අවශ්‍ය දෑ සටහන් කර ගැනීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**


1. අබුබක්කර් ඒ. එම්. (1998) ඉස්ලාමීය ඉතිහාසය 1 කොටස, සායින්ද මරුදූ, ඉස්ලාමීය පර්යේෂණ සංගමය

2. ඉබ්රාහිම් සෙයියද් (1965) මහා කලීෆාවරු හතර දෙනා, චෙන්නායි, වලර්මදි ප්‍රකාශකයෝ.

**නිපුණතාව 9.0 : උමයියා අබ්බාසිය පාලන කාල තුළ හා ඉන් පසු පැවති දේශපාලන, සමාජ අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රගතිය විවේචනාත්මක ව අවබෝධ කර ගනිමින් අගයයි.**

**නිපුණතා මට්ටම 9.1** : උමෙයා පාළනයේ ආරම්භය, වර්ධනය හා වාර්තා පිළිබඳ විමර්ශන දෘෂ්ටි කෝණයයෙන් අධ්‍යයනය කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 35

**ඉගෙනුම් ඵල** :

- උමයියාවරන්ගේ පිබිදීමට හේතු ඓතිහාසික වශයෙන් ගෙනහැර දක්වයි.
- උමයියාවරුන්ගේ සේවා හඳුනාගෙන ලියා දක්වයි.
- උමයියාවරුන්ගේ පිරිහීමට හේතුව විග්‍රහ කර ඉදිරිපත් කරයි.

## විෂය සන්ධාරය

- කුලෆාඋර් රාෂිදීන්වරුන්ට පසුව බිහි වූ පාලනය උමෙයා පාලනය ලෙස හැඳින්වේ. උමෙයා වංශයේ පාලකයින් අඛණ්ඩ ව පාලනය කළ බැවින් මෙම පාලනය උමෙයා (වංශ) පාලනය ලෙස හැඳින්වේ.
- එපමණක් නොව කුලෆාඋර් රාෂිදීන්වරු ඔවුනටම ආවේණික වූ ක්‍රමයකට (තෝරා ගැනීම, පත් කිරීම, පත් කිරීමේ දී තෝරාගැනීම ලෙස) තෝරා පත්කර ගනු ලැබූහ. එහෙත්, අලි (රළි) තුමාගේ ඝාතනයත් සමඟම ඉරාකීයයන් හසන් (රළි) තුමාව ද ෂාම්වරුන් මුආවියා (රළි) තුමාව ද කලීෆා ලෙස තෝරා ගත්හ. පසුව මුආවියා (රළි) තුමා ඉරාකය බලා මහා සේනාවක් සමඟ පැමිණි විට මුස්ලිම්වරුන් මුස්ලිම්වරුන් මගින් ම ඝාතනය වීමට අකැමැති වූ හසන් (රළි) තුමා පාලනය අත්හැරියේ ය. එබැවින් හිජ්රී 41 දී එකම පාලකයා ලෙස මුආවියා (රළි) පත් විය.
- පෙර කලීෆාවරුන්ගේ තෝරාගැනීමට වෙනස් ව තමා ම කලීෆා පදවියට උරුමකම් කියා කලීෆා ලෙස පත්වීම ද උමෙයා ගෝත්‍රිකයින්ම උරුමක්කාරයින් ලෙස කලීෆා ලෙස පත්වීම ද නිසා මෙම පාලනයට උමෙයා පාලනය යන නම ලැබිණි. කුලෆාඋර්රාෂිදීන් වරුන්ගේ ක්‍රමයට වඩා වෙනස්වීම ද මෙයට හේතු ලෙස දැක්විය හැකිය.
- ජාහිලියියා කාලයේ දී කඃබාව පරිපාලනයට උමෙයාවරු ද දායක වූහ. මක්කාව මුස්ලිම්වරුන්ගේ ආධිපත්‍යයට පත් වූ අවස්ථාවේ කුරෙෂිවරුන්ට නායකත්වය දුන්නේ මුආවියා (රළි) තුමාගේ පියා වූ අබූසුෆ්යාන් ය. එබැවින් කලීෆා වීමට තමා ද සුදුසුකම් ඇත්තෙකු ලෙස ඔහු සිතන්නට ඇත. උස්මාන් (රළි) තුමාගේ ඝාතනයට පළිගත්තේ නැතැයි යන්න මුආවියා (රළි) තුමා ප්‍රමුඛ උමෙයාවරුන්ගේ ප්‍රධාන චෝදනාව විය. කලීෆා අලි (රළි) තුමාට බෙඅත් නොදීම, ඝාතනය වූ කලීෆා තුමාගේ කබාය ප්‍රදර්ශනය කරමින් හැඟීම් ඇවිස්සීම, සිෆ්ෆීන් හි යුද්ධ කිරීම, ඊජිප්තුව තම පාලනය යටතට ගෙන ඒම, හසන් (රළි) තුමාට විරුද්ධව හමුදා මෙහෙයවීම යන්න නායකත්වය සඳහා වූ මූලික සැලසුම් ලෙස පෙනේ.

- වසර 20 ක් පමණ ෂාම් හි ආණ්ඩුකාරයා ලෙස සේවය කර ජනයාගේ අභිමානයට පාත්‍ර වී සිටීම, එහි උමෙයියාවරුන්ව පදිංචි කරවීම, මායිම් පළාත වූ ෂාම් ආරක්ෂා කිරීම යන හිතකර වූ වාතාවරණය මුආවියා (රළි) තුමන්ට ලැබිණි. අනෙක් අතට නිතර නිතර වෙනස් වන්නා වූ ලක්ෂණයක් තිබූ ඉරාකීයයන්, බලයට පත් වූ දා පටන් මුස්ලිම්වරුන් සමඟම සටන් කර විඩාපත් ව සිටීම, කුමන්ත්‍රණකරුවන්ගේ පීඩා, කවාරිජ්වරුන්ගේ කලබල වැනි දෙයින් අලි (රළි) තුමා බෙලහීන ව සිටියහ.

- මුආවියා (රළි) තුමා පාලන බලය ලබාගැනීම නිසා (41-60) කලීෆා, කිලාෆත් යන්නෙහි යථාර්ථයට තේරුමක් නැති වී ගියේ ය. අගනගරය මදීනාවෙහි සිට ඩමස්කසයට (දිමිෂ්ක්) වෙනස් විය. උමෙයා හා හාෂිම් යන ගෝත්‍ර අතර භේදයේ වර්ධනය ආරම්භ විය. දේශපාලනයෙහි සහාබාවරුන්ගේ බලපෑම ක්‍රම ක්‍රමයෙන් අඩු වී බෙසෙන්තියානු බලපෑම් නිසා නව සම්ප්‍රදායයන් වර්ධනය ආරම්භ විය. බයිතුල්මාලයේ ක්‍රියාකාරකම් සමාජීය ප්‍රයෝජනයට ප්‍රමුඛත්වය දීමෙන් වැළකී පැවතිණි.

- එහෙත්, මෙම වංශයෙහි පාලනයෙහි නිර්මාතෘ ලෙස මුආවියා (රළි) තුමා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත්තේය. දිගුකාලීන වූ පරිපාලන දැනුමත්, එතුමා ළඟ දක්නට ලැබූ සහජ හැකියාවන්, (රාජ්‍ය තන්ත්‍රය, ජන ආකර්ෂණය, ක්‍රියාකාරකම් පිළිවෙලට කිරීම) හා ඔහුට ලැබුණු සෙන්පතියන්ගේ දායකත්වයත් මෙයට උපකාර කළේය.

- ඔහු කිලාෆතය එක් නායකත්වයක් යටතේ ඒකීය කළේය. බෙසන්තියානු ක්‍රමයට හමුදාමය හා පරිපාලනමය සේවාවන් වෙනස් කළේය. උමර් (රළි) තුමාගේ කාලයේ ඇති කළා වූ දෙපාර්තමේන්තු පුළුල් කළේය. දීවානුල් හාතම් වැනි උප දෙපාර්තමේන්තු ඇති කළේය. ස්වදේශීය කලබලකාරී තත්ත්වය හේතුවෙන් හිජ්රි 30 ට පසුව විදේශීය සතුරන් කෙරෙහි සැලකිලිමත් වීමට අවස්ථාවක් නොලැබුණි. එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන බෙසන්තියානුවන් උතුරු අප්‍රිකානු ප්‍රදේශ නැවත අත්පත් කරගත් අතර ස්වදේශිකයින්ට හිංසා කිරීමට පටන් ගත්හ. ජනයා කලීෆා වෙත පැමිණිලි කිරීමෙන් පසු උත්බා බින් නාෆිඋ ගේ නායකත්වයෙන් උතුරු අප්‍රිකාවට සේනාංක යවන ලදී.

- හිජ්රි 50 හි දී කෙරවාන් නගරය නිර්මාණය කර එහි ස්ථිර හමුදාවක් තබන ලදී. අත්ලාන්තික් සමුද්‍රය දක්වා වූ උතුරු අප්‍රිකානු ප්‍රදේශ මුස්ලිම්වරුන්ගේ පාලනයට නතු කළේය. නැගෙනහිර ඇෆ්ගනිස්ථානය (හිජ්රි 51) , බල්කු (හිජ්රි 53), බුහාරා (හිජ්රි 54) හා සමර්කන්ද් (හිජ්රි 55) යනාදී ප්‍රදේශ උමෙයියාවරුන්ගේ පාලනය යටතට පැමිණුනි. හිජ්රි 48 සිට 50 දක්වා කොන්ස්තන්තිනෝපලය යටත් කිරීම සඳහා හමුදා මෙහෙයවීම් සිදුවිය. සයිප්‍රස්, රෝඩස් යන දූපත් ද උමෙයා පාලනය යටතට පැමිණුනි. ශාදියා, සාෆියා යන නම්වලින් සීත හා ග්‍රීෂ්ම කාල හමුදා සේනාංක ඇති කර තිබුණි.

- උමර් (රළි) තුමාට පසුව විශිෂ්ඨ වූ පාලකයා ලෙස ප්‍රශංසා කරනු ලබන මුආවිය (රළි) තුමා පාලනය ස්ථිර කළ පසු තම වංශයේ පාලනය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වූ ක්‍රමවේදයන් ඇති කළේය. මුහීරත් ඉබ්නු සුඅබා (රළි) තුමාගේ අනුශාසනාවකට අනුව පුත්‍රයා වූ යසීද් ව උරුමක්කරු ලෙස පත් කළේය. යසීද් වෙනුවෙන් ජනයාගෙන් බෙඅත් ලබා ගත්තේය. මෙය නව ක්‍රමවේදයක් විය. එක් කලීෆා කෙනෙකු ජීවතුන් අතර සිටින විටම අනෙක් කලීෆාව පත් කිරීම, ඔහු වෙනුවෙන් ජනයාගෙන් බෙඅත් ලබාගැනීම යන ක්‍රමවේදය ආරම්භ කළේය. මෙම ක්‍රමවේදයට සහභාවරුන් කිහිපදෙනෙකුම විරුද්ධ වූහ. බියගන්වා හා ත්‍යාග ලබා දී බෙඅත් ලබාගන්නා ලදී. එහෙත් එදා පැවති වාතාවරණයට අනුව මෙය මුආවියා (රළි) තුමාගේ ඉජ්තිහාදය

ලෙස මෙයට එකඟ වන්නවුන් ද සිටියහ. අලි (රළි) තුමාගේ ආධාරකරුවන් ලෙස සිටි ඉරාකීයයන් මෙය අනුමත නොකර විප්ලව කළහ. සෙද් ඉබ්නි අබී යන සේනාධිපත් මාර්ගයෙන් මොවුන් ව මෙල්ල කරන ලදී. හිජාසයේ ද විරුද්ධවීම් ඇති විය.

- යසීද් ව උරුමක්කරු ලෙස නම් කිරීම මගින් මුආවියා (රළි) තුමා බහුතර ජනයාගේ අප්‍රසාදයට ලක්විය. ඔහුගේ මරණයට පසුව කර්බලා හි දී (හිජ්රි 61) හා හර්රා හි දී (හිජ්රි 63) ඇති වූ සටන් මෙය ගෙනහැර දක්වයි. ජනයා අබ්දුල්ලාහ් ඉබ්නු සුබෛර් (රළි) තුමාව කලීෆා කර පාලනයක් තුළ පාලනයක් ඇති කිරීමේ සම්ප්‍රදාය ඇති කළහ. යසීද්ගේ මරණයට පසුව එකාට පසු අනෙකෙකු ලෙස පාලනයට පත් වූ ඔහුගේ පුත්‍රයින් දෙදෙනාටම බලය අහිමි විය. උමෙයා ප්‍රභූන් මර්වාන් ඉබ්නු හාකම් නමැතිතා ව කලීෆා ලෙස තෝරා ගත්හ. මෙම අවස්ථාවෙහි, ඉබ්නු සුබෛර් දමස්කසය වටා පිහිටි ප්‍රදේශ හැර අන් සියළු ප්‍රදේශම තම පාලනයට නතු කර ගත්තේය. දෙදෙනා අතර ඇති වූ මර්ජ් රාහිද් යුද්ධයෙන් මර්වාන්ට ජය ලැබුණි. එහෙත්, ඔහුට දිගුකලක් පාලනය කිරීමට නොහැකි විය.
- මර්වාන්ට පසු ඔහුගේ පුත් අබ්දුල් මලික් (65 - 86) කලීෆා විය. මොහු උමෙයා වංශ පාලනයේ දෙවැනි නිර්මාතෘ ලෙස සඳහන් වෙයි. කලීෆා මර්වාන් ව ඝාතනය කළවිට රජ පවුලෙහි ආරවුල් ඇති විය. මර්වාන් තමාට පසුව යසීද්ගේ පුත් කාලිද් ට බලය ලබාදෙන බව පවසා පාලනයට ආවේය. එහෙත් පසුව තම පුත් අබ්දුල් මලික්ව උරුමක්කරු ලෙස පත් කළේය. මර්වාන් කාලිද්ගේ මවව විවාහ ගිවිස සිටියේ ය. තම පුතා වූ කාලීද් ට බලය ලබා නොදීම නිසා කෝපයට පත් බිරිඳ සැමියාව ඝාතනය කළ බව පවසති. මර්වාන්ගේ හා කාලිද්ගේ පවුල් අතර ක්‍රෝධය ඇති විය. කාලිද්, අබ්දුල් මලික්ගේ හතුරා බවට පත්විය.
- මෙම අවස්ථාව වනවිට තව්වාබීන් වරු (හුසෛන් (රළි) තුමාට කර්බලාහි දී උදව් කිරීමට නොහැකි වීම පිළිබඳ ව සමාව අයදින්නන්) බලවත් වී උමෙයාවරුන්ට විරුද්ධ වීමට උත්සාහ ගත්හ. අබ්දුල්ලාහ් ඉබ්නු සුබෛර් (රළි) තුමා නැවතත් තමාව බලවත් කර ගත්තේය. මෙසපොතේමියාහි කවාරිජ්වරු බලවත් වූහ. උතුරු අප්‍රිකානු ප්‍රදේශ බෙසන්තියානුවන් නැවත අත්පත් කරමින් සිටියහ. මෙලෙස කාලිද්, තව්වාබීන්, ඉබ්නු සුබෛර්, කවාරිජ්, බෙසන්තියානුවන් යන සතුරන් පස් දෙනෙක් ව මර්දනය කිරීමට අවශ්‍ය තත්ත්වයකට අබ්දුල් මලික් පත්විය. කෙසේ වෙතත් ධෛර්ය සම්පන්නව මුහුණ දුන්නේ ය.
- කාලිද්ට උපකාරයට සිටි ඔහුගේ සෙන්පති අම්ර් ව ඝාතනය කිරීම මගින් කාලිද්ව බෙලහීන කළේය. මුක්තාර් බින් උබෛද් ගේ නායකත්වයෙන් තව්වාබීන්වරු ඉරාකයේ බලවත් වී සිටීම මර්දනය සඳහා උබෛදුල්ලාහ් බින් සියාද්ගේ නායකත්වයෙන් හමුදා සටන් කළහ. තව්වාබීන්වරු උබෛදුල්ලාහ්ව මරා දමා තම ආධිපත්‍යය තහවුරු කරගත්හ. මෙවේලේ, මුස්අබ් ඉබ්නු සුබෛර්ගේ නායකත්වයෙන් වූ ඉබ්නු සුබෛර්ගේ හමුදාව තව්වාබීන් වරුන් ව මර්දනය කර ඉරාකය තම ආධිපත්‍යය යටතට ගෙන ආවේය. පසුව එම හමුදාව මෙසපොතේමියාවට ගොස් කවාරිජ්වරුන්ව මර්දනය කිරීමේ කාර්යයෙහි නියැලුණෝ ය. ඉබ්නු සුබෛර්ගේ හමුදා තුනකට බෙදී පැවති අවස්ථාවක් බලා අබ්දුල් මලික් හජ්ජාජ් ඉබ්නු යුසුෆ්ගේ නායකත්වයෙන් යුතු හමුදාවක් මක්කාවට යැවීය. ඉබ්නු සුබෛර්ව පරාජයට පත්කොට හජ්ජාජ් විසින් මරාදමන ලදී. (73) හජ්ජාජ්ගේ හමුදාව ඉරාකයට ගිය විට ඔවුන් ද යටත් වූහ. මුහල්ලබ් නමැත්තාගේ නායකත්වයෙන් පිටත් වූ හමුදාව මෙසපොතේමියාව අබ්දුල් මලික්ගේ පාලනය යටතට ගෙන ආවේය.

- මෙලෙස රට තුළ වූ විරුද්ධවාදීන් ව මර්දනය කළ පසු බෙසන්තියානුවන්ට විරුද්ධ යුද්ධයට පිවිසියේ ය. සෙන්පති සුහෙර්ගේ නායකත්වයෙන් කෙරවානයට හමුදා යවන ලදී. සෙන්පති සුහෙර් ඝාතනය වූ පසු හසන් බින් නුඃමාන්ගේ නායකත්වයෙන් ගිය හමුදා කෙරවානය තම ආධිපත්‍යය යටතට ගෙන ආවේය. මෙලෙස කලීෆා අබ්දුල් මලික් තමාගෙන් ගිලිහුණු ප්‍රදේශ මුදා ගත්තේය. උමෙයියාවරුන්ගේ පාලන ප්‍රදේශ වර්ධනය විය. මීට පසුව ප්‍රතිසංස්කරණ ඇති කළෝය.

- කලීෆා අබ්දුල් මලික් අරාබි භාෂාව රාජ්‍ය භාෂාව බවට ප්‍රකාශයට පත් කළේය. මේ නිසා අරාබි නොවන්නන්ට ද අරාබි භාෂාව ඉගෙන ගැනීමේ අවස්ථාව උදා විය. වෙනත් භාෂාවලින් තිබූ ලේඛන අරාබි භාෂාවට පරිවර්තනය කරන ලදී. භාෂාව ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ ලියන ලදී. ජාහිලියියා යුගයේ සාහිත්‍යය ගොනු කරන ලදී. පසුකාලීනව පරිවර්තන කලාව වර්ධනයට හා විද්‍යාත්මක චින්තනයන් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ භාෂාවෙහි හරවත් බවට මඟ පෙන්වීය. රටවල් 50කට වැඩි සංඛ්‍යාවක් අරාබි රටවල් ලෙස ප්‍රකාශයට පත් විය.

- මෙම කාලයේදී ම අබ්දුල් මලික් මුදල් නිකුත් කරන ආයතන ඇති කර අරාබි මුදල් ප්‍රකාශයට පත් කළේය. එතෙක් භාවිතයේ තිබූ ලතින් හා පහ්ලවි මුදල් තහනම් කළේය. රෝමවරුන් තම මුදල් භාවිතා නොකරන ලෙස තහනම් නියෝගයක් දැමීමට පිළියමක් ලෙස මෙලෙස කළ බව ද සඳහන් කරති.

- උමර් (රළි) හා මුආවියා (රළි) තුමන්ලාගේ කාලවල දී ඇති කරන ලද තැපැල් ක්‍රමය මොහු තවත් ව්‍යාප්ත කළේය. අශ්වයින්ව හා පරෙවියන්ව මේ සඳහා පුහුණු කර උපයෝගී කළේය. නීති ක්ෂේත්‍රය ප්‍රතිසංවිධානය කිරීම සඳහා අධිකරණ තීන්දු ලේඛනගත කිරීමට අණ දුන්නේය. නීතිමය තීන්දු ලේඛනගත නොකළ කාලවකවානුවක මෙලෙස කිරීම පැසසුමට ලක් කළයුතු එක් කාර්යයක් වේ.

- අභ්‍යන්තර කලබල මර්දනය සඳහා හමුදාව ව්‍යාප්ත කළ කලීෆා සාමකාමී බව ඇති වූ පසුව අමතර හමුදාවන් විසුරුවා හැරියේය. මේනිසා රාජ්‍ය මූල්‍ය ආරක්ෂා වූ අතර විසුරුවන ලද සෙබලුන් ග්‍රාමීය ප්‍රදේශවලට ගොස් කෘෂිකාර්මික කටයුතුවල නියැලුනෝය. තවද උමෙයියා පාලනයේ කලා හා සාහිත්‍ය කටයුතුවල උත්සාහයන් ද ආරම්භ වූයේ මොහුගේ කාලයේදී ය.

- අබ්දුල් මලික්ට පසුව ඔහුගේ පුත් වලීද් කලීෆා විය. (86 - 96) උමෙයියා කලීෆාවරුන්ගෙන් කරදර නොමැතිව පදවි ප්‍රාප්ත වූ මුල්ම කලීෆා මොහු ය. අබ්දුල් මලික් විසින් විරුද්ධවාදීන්ව මෙල්ල කර තැබීම හා පරිපාලනය සැලසුම් සහගත කිරීම යන්න මෙයට හේතු ලෙස දැක්විය හැක. ඒ දක්වා උමෙයියාවරුන්ට ඉරාක්වරු, හිජාස්වරු හා කවාරිජ්වරු යන්නන් කරදර කරමින් සිටියහ. ඔවුන් මොහුට විරුද්ධ නොවූහ. රට අභ්‍යන්තරයෙහි සාමය පැවති නිසා කලීෆා පිටරටවල් කෙරෙහි අවධානය යොමු කළේය. අබ්දුල් මලික්ගේ අනුශාසනාවකට අනුව හජ්ජාජ්ව උසස් තත්ත්වයක තැබූ නිසා ඔහු විසින් පහත රට යටත් කර තබා ගත්තේ ය.

- මොහුගේ කාලයේ දී සින්දු හා ස්පාඤ්ඤය යන ප්‍රදේශ දෙකත් මුස්ලිම්වරුන්ගේ පාලනය යටතට පත් විය. සෙන්පති කුතෙබා මධ්‍යම ආසියානු ප්‍රදේශවල උමෙයියා පාලනය ව්‍යාප්ත කළේය. කුවාරිස්ම් හා සමර්කන්ද් ප්‍රදේශ හරහා චීනයේ මායිම දක්වා පාලනය ව්‍යාප්ත විය. මූසා බින් නුසෛර් උතුරු අප්‍රිකානු ප්‍රදේශ පමණක් නොව මධ්‍යධරණී මුහුදු දූපත් ද උමෙයියාවරුන්ගේ පාලනය යටතේ තැබීය. මොහු විසින් යවන ලද සෙන්පති තාරික් බින් සියාද් යන තරුණයා ස්පාඤ්ඤය මුස්ලිම් පාලනය යටතට ගෙනාවේය. ආර්මේනියාව,

කැස්පියන් මුහුදු ප්‍රදේශ සෙන්පති මස්ලමා විසින් යටත් කරගන්නා ලදී. ඉස්ලාමීය විනයට කැමැති වූ හිජාසයට, උමර් ඉබ්නු අබ්දුල් අසීස් ව ආණ්ඩුකාර ලෙස පත් කිරීම මගින් එහි ඇති වූ එදිරිවාදිකම් අඩු කළේය.

- රටෙහි සාමය පැවතීම, දේශ සීමා විස්තීරණ වීම, ප්‍රමුඛ හේතූන් රාජ්‍ය ආදායම වර්ධනය කළේය. එබැවින් පෙර කලීෆාවරුන්ගේ කාලවල දී සිදු නොවූ පොදු ජන සේවා මොහුගේ කාලයේ දී අධික විය. පාසල් ආරම්භ කරන ලදී. ආරෝග්‍ය ශාලා හා සායන පිහිටුවන ලදී. අනාථ නිවාස හා රෝගීන් සඳහා වූ නිවාස ඉදිකරන ලදී. මාර්ග පද්ධති ව්‍යාප්ත කරන ලදී. පොදු ළිං හාරන ලදී. පාලම් නිර්මාණය කරන ලදී. භෝජන ශාලා නිර්මාණය කරන ලදී. දුප්පතුන් හා රොගීන් සහනාධාර ලැබූහ. මස්ජිදුන් නබවිය ප්‍රතිසංස්කරණය කරන ලදී. ගෘහ නිර්මාණ ශිල්පයෙන් අනූන ඩමස්කස් ජාමිආ මස්ජිදය ඇති විය. බලකොටු තනන ලදී.
- මොහුට පසුව ඔහුගේ සහෝදරයා වන සුලෙමාන් කලීෆා විය. මොහුගේ පාලන කාලය වසර තුනක් විය. ඊළඟට කලීෆා වූ උමර් ඉබ්නු අබ්දුල් අසීස් ව පත් කළේ මොහු ය.
- උමර් ඉබ්නු අබ්දුල් අසීස් (99 - 101) සුවිශේෂී වූ කලීෆා වරයෙකු ලෙස සැළකෙයි. වසර දෙකක් පමණක් පාලනය කළ ද දෙවන උමර්, පස්වන කලීෆා, කලීෆතුස් සාලිහ් ලෙස ප්‍රශංසා කෙරෙන තරමට මොහුගේ සේවාවන් හා ක්‍රියාවන් පැවතිණි. කලීෆා උමර් (රළි) තුමාගේ පවුලට තිබූ සම්බන්ධය, මදීනාවෙහි අධ්‍යාපනය ලැබීම යන කාරණා දෙක මොහුගේ පාලනයට මඟ පෙන්විය. උමෙයියා වංශ පාලනයේ සිදුවූ වැරදි හොඳින් දැන සිටි මොහු, ඒවා ඉවත් කිරීම සඳහා මහත් උත්සාහයක් දැරීය. කලීෆා වලීද්ගේ කාලය් හිජාසයේ ආණ්ඩුකාරයා ලෙස පත්වීම ලැබුණු විට ස්වාධීන ව ක්‍රියා කිරීමට අනුමැතිය ලැබීමෙන් පසුව එම පදවිය භාරගත්තේය. එහි මජ්ලිසුෂ් ෂූරාවක් ඇති කර, ඒ හරහා පරිපාලනය කළේය. මේ නිසා හජ්ජාජ්ගේ අකටයුතුකම් වලින් බේරීමට අවශ්‍ය වූවන් හිජාසයෙහි පදිංචි වීම ඇරඹූහ. හිජාසයෙහි ඔහු ලැබූ පුහුණුව කිලාෆතය පරිපාලනයට උපකාරී විය.
- ජනයාගෙන් අදහස් විමසීමකින් තොර ව තමාව කලීෆා ලෙස පත් කිරීම ගැන ඔහු විරුද්ධත්වය ප්‍රකාශ කළේය. ජනයා එකහෙළා ඉල්ලීම් ඉදිරිපත් කළ නිසා එම තනතුර භාර ගත්තේය. පෙර කලීෆාවරුන්ගෙන් ඇති වූ අකටයුතුකම් නැති කිරීම තමාගේ මුල් ම කාර්යය ලෙස සැළකුවේය. උමෙයියාවරුන්ට ලබා දෙන ලද විශේෂී වූ වරප්‍රසාදයන් නැති කළේය. (උදා : බෛතුල් මාලයෙන් ආධාර ලබාදීම, අධිකරණවල විශේෂ ස්ථාන වෙන් කිරීම) පරිපාලන අක්‍රමිකතා නැති කිරීමට උත්සුක විය. (උදා : එක් එක් රාජ්‍ය ආදායම් ක්ෂේත්‍රයට වෙන ම වාර්තා පොත් යොදා ගැනීම, ආදායම වර්ධනය කිරීම සඳහා මවාලිවරුන් මත පටවන ලද අධික බද්ධ තහනම් කිරීම, දිම්මිවරුන්ට ආගමික නිදහස සහතික කිරීම) ජනතාවට ඉස්ලාමය අධ්‍යයනය සඳහා අවස්ථා ඇති කර දුන්නේ ය. හදීසයන් සම්පිණ්ඩනයට රාජ්‍ය මට්ටමේ වැඩපිළිවෙලක් ඇති කළේය. පාඨශාලා ඇති කර සිසුන්ට උපකාරක අරමුදලක් හා ගුරුවරුන්ට වේතනයක් ද ලබා දුන්නේය. මස්ජිදයන් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස උසස් කළේය. (උදා : කුර්ආන් හා හදීස් පන්ති පැවැත්වීම, ආලිම්වරුන්ව පුහුණු කිරීම) ප්‍රසිද්ධියේ සිදුවන පාප ක්‍රියා තහනම් කළේය. (උදා : පොදු ළිංවල නිර්වස්ත්‍රව නෑම හා මද්‍යසාර භාවිතය) ආක්‍රමණයන් නතර කළේය. පුහුණු කරන ලද කණ්ඩායම් මාර්ගයෙන් ඉස්ලාමය ප්‍රචාරය කළේය. මෙමගින් ජනයා ප්‍රයෝජන ලැබූහ. උමෙයියාවරු කෝපයට පත් වූහ. අවසානයේ දී වස දී ඝාතනය කරන ලදී.

- මොහුගේ පාලනයෙහි මහිමය, උමෙයා වංශ පාලනය කෙරෙහි ජන අප්‍රසාදය ඇති කළේය. මීට පසුව පාලනයට පත් වූ දෙවන යසීද් පළමු යසීද් ව අනුගමනය කළේය. ජනයා කෝප වූහ. සියලුම ප්‍රදේශවල මුලරීවරු හා හිමියාර්වරු අතර ගැටුම් ඇති විය. මෙම අවස්ථාව අබ්බාස්වරු ප්‍රයෝජනයට ගත්හ. අහ්ලු බෛත්වරුන්ට පාලන උරුමය ඇතැයි යන මතය මුනිවරුන් ලෙසත් වෙළෙන්දන් ලෙසත් රඟපාමින් ප්‍රචාරය කළහ. පිළිවෙලට පත් වූ උමෙයා කලීෆාවරු බලවත් නොවූ තත්ත්වයක සිටිය බැවින් කලීෆා හිෂාම්ගේ කාලයේ දී අබ්බාස්වරු තම ප්‍රචාරය එළිපිටම කළහ. දෙවන මර්වාන්ගේ කාලයේ දී සටන් ආරම්භ කළහ. මුලින් ම කූෆාව අත්පත් කරගත්හ. විරුද්ධ ව පැමිණි හමුදාව පරාජයට පත් කළහ. කලීෆා මර්වාන්ව මරා දමන ලද අතර උමෙයා පාලනය අවසාන විය.

- හිට්ටි යන පෙරදිග පර්යේෂකයා උමෙයාවරුන්ගේ කාලය බීජෞෂණකාලය යැයි පවසයි. මක්නිසා ද යත්, අබ්බාසීය කාලයේ පසුකාලීනව ඇති වූ බුද්ධිමය හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි වර්ධනයට උමෙයාවරුන් අඩිතාලම දැමූ බැවිණි. පෙර සඳහන් කළ ආකාරයටම, විද්‍යාත්මක අදහස් ඉදිරිපත් කිරීමට අවශ්‍ය සුදුසුකම අරාබි භාෂාව ලබාගත්තේය. අරාබි භාෂාව මව් භාෂාව නොවන කූෆා, බසරා යන ප්‍රදේශවල තරගකාරීත්වයෙන් අරාබි භාෂාව ඉගෙන ගත්හ. කූෆා ව්‍යාකරණඥ හා බසරා ව්‍යාකරණඥයා ලෙස සඳහන් කළ හැකි තරමට ඔවුනගේ උත්සාහයන් පැවතින. අබුල් අස්මද් අත්තුඅලි, ෂීබවෙහි ප්‍රමුඛ බසරා උගතුන්, අල් කිසායි, අල් බර්රා ප්‍රමුඛ කූෆා උගතුන් ද ව්‍යාකරණ ග්‍රන්ථ ද ශබ්දකෝෂ ද නිර්මාණය කළහ.

- තරුණ සහාභාවරුන් ද, තාබිඊන්වරුන් ද, හදීස්, ෆික්හ් හා තෆ්සීර් යන ක්ෂේත්‍රවලට තම අවධානය යොමු කළහ. මුහම්මද් ඉබ්නු හස්මි, ෂිහමුද්දීන් සුහ්රි වැන්නවුන් හදීස් ක්ෂේත්‍රයට දායක වූහ. දේශපාලනයෙන් මිදුණු නිපුණත්වයක් තිබූ සහාබාවරුන් හා තාබිඊන්වරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයට තම අවධානය යොමු කළහ. මක්කා, මදීනා, කූෆා, බසරා හා ඊජිප්තුව යන නගරවල පිහිටි මස්ජිද හා ඒ අවට පිහිටි මද්රසා මගින් අධ්‍යාපනය ලබා දෙමින් පැවතිණි. නගරයකින් නගරයකට ගොස් ජනයා අධ්‍යාපනය ලැබූහ. ඉබ්නු ජුරෛහ්, සුෆ්යාන් බින් උයෙනා, සුෆ්යානු ස්සව්රි, හම්මාද්, ලෛස්, ඉබ්නු මුබාරක් හා ඖසායි වැනි උගතුන් හදීස් ක්ෂේත්‍රයට දායක වූහ.

- මෙම කාලයේ දී ෆික්හ් අර්බුද වැඩි වී තිබූ හෙයින් සෑම නගරයකම ෆික්හ් හි උගතුන් තනි තනිවමත්, කණ්ඩායමක් ලෙසත් සේවය කළහ. මක්කාවෙහි අතා ඉබ්නු අබී රබාහ්, අම්ර් ඉබ්නු දීනාර්, දාවුද් බින් කෙසාන් වැන්නවුන් ද, මදීනාහි සඊද් ඉබ්නු මුසයියත්, උර්වා බින් සුබෛර්, අල් කාසිම් බින් මුහම්මද් වැන්නවුන් ද, කූෆා හි ඊබ්‍රාහිම් නුකඊ, ෂඅබි, හම්මාද් වැන්නවුන් ද, බසරා හි හසන් අල් බෂ්රි, මුහම්මද් ඉබ්නු සීරීන්, මුස්ලිම් බින් යසාර් වැන්නවුන් ද ඩමස්කස් හි මක්හුල්, ඖසායි වැන්නවුන් ද සේවය කරමින් සිටියහ. අල්කමා, මුජාහිද්, ඉක්රිමා වැන්නවුන් තෆ්සීර් ක්ෂේත්‍රයේ නිපුණත්වයක් ලබා සිටියහ. කිරාඅත් කලාව ඇතිකළ ඉමාම්වරුන් 7 දෙනාම උමෙයා කාලයේ ජීවත් වූවන් ය යන්න විශේෂයෙන් ම සඳහන් කළ යුතු ය.

- අල්කුර්ආනය පාදක කොටගෙන ජනිත වූ මෙම කලාවන් ඉල්මුන් නක්ලියියා යැයි හැඳින්වේ. මීට පසු ජනිත වූ කලාවන් ඉල්මුල් අක්ලියියා යැයි හැඳින්වේ. උමෙයා කාලයේ ඇති වූ ඉල්මුන් නක්ලියියා හි වර්ධනය අබ්බාසිය පාලන සමයෙහි දී ඉල්මුල් අක්ලියියා ඇතිවීමට අඩිතාලම ලෙස ක්‍රියාකළේය. කලීෆා යසීද්ගේ පුත් කාලිද් මිනුම් විද්‍යාව හා රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවල නියැලී ග්‍රීක හා කිබ්ති භාෂාවලින් වූ රසායන විද්‍යා ග්‍රන්ථ ද පරිවර්තනය කර ඇත.

- මෙලෙසම උමෙයියා කාලයේ දී සෞන්දර්ය ශාස්ත්‍රඥයන් ද වර්ධනය විය. බෙසන්තීය බලපෑමට ලක්වූ ප්‍රදේශ මුස්ලිමුන්ගේ පාලනය යටතට පැමිණි හෙයින් ඉස්ලාමය අනුබල නොදුන් කලාවන් හි පමණක් නොව ගෘහ නිර්මාණ ශිල්පය වැනි ඉස්ලාමය අනුබල දුන් කලාවන්හි ද නියැලුණහ. කලීෆා වලීද්ගේ කාලයේ දී කලාත්මක නිර්මාණ සහිත ගොඩනැගිලි ඉදිකරන ලදී. මස්ජිදයක කොටස් වන කුන්ෂා, මිනාරා, මිහ්රාබ්, මිම්බර් හා දුනු ආකාර ආරුක්කු වැනි දේ කලාත්මක බවක් ගත්තේ ය. කුෆ්තතුල් හල්රාඋ (හජ්ජාජ්), මුවක්කර් (යසීද් - 2), කස්ර් (වලීද් - 2), වැනි ග්‍රාමීය මාලිගා, දිමිෂ්ක් ජාමිආ මස්ජිද්, කුබ්හතුස් සුක්රා (වලීද් - 1) වැනි නිර්මාණ ද විශේෂයෙන් සඳහන් කළ යුතු ගොඩනැගිලි ලෙස විය.
- උමෙයියාවරුන්ගේ වාර්තාවන් ලෙස පහත දෑ සඳහන් කළ හැකි ය.
  * පැතිරුණු අධිරාජ්‍යයක් ඇතිකර පාලනය කිරීම.
  * අරාබි භාෂාව හා අරාබිකම ආරක්ෂා කිරීම.
  * කලා හා සාහිත්‍ය උත්සාහයන් ආරම්භ කිරීම.
  * උගතුන්ට ස්වාධීන ව ක්‍රියා කිරීමට ඉඩහැර ඉල්මුන් නක්ලියාව පෝෂණය කිරීම.
  * විරුද්ධවාදීන්ගෙන් කිලාෆතය ආරක්ෂා කිරීම.
  * දේශපාලන, ආර්ථික හා සමාජයීය වර්ධනයට උපකාර කිරීම.
- උමෙයියාවරුන්ගේ බිඳවැටීමට හේතු වූ සාධක ලෙස පහත දෑ සඳහන් කළ හැකි ය.
  * ඉස්ලාමීය මග පෙන්වීම් අනුගමනය නොකිරීම
  * භෞතික හැඟීම
  * උරුමක්කරුවන්ගේ පිළිවෙලක් නොමැති බව.
  * පසුකාලීන කලීෆාවරුන්ගේ බෙලහීන බව.
  * බෙතුල්මාලය අනිසි ලෙස භාවිතය
  * විරුද්ධ මත දැරූ ෂීආ හා කවාරිජ්වරු
  * මවාලිවරුන් හා දිම්මිවරුන් අතර තිබූ අප්‍රසාදය
  * අබ්බාසිවරුන්ගේ පිබිදීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : උමයියාවරුන්ගේ කාලය පිළිබඳ කෙටියෙන් දක්වන්න.

පියවර 2 : ඉගෙනුම් කාඩ්පත් ඇසුරෙන් තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

පියවර 3 : පහත මාතෘකා යටතේ විවාදයක් පැවැත්වීමට යොමු කරන්න.
(අ) උමයියාවරුන්ගේ පාලන කාලය යහපත් කාලයකි.
(ආ) උමයියාවරුන්ගේ පාලන කාලය යහපත් කාලයක් නොවේ.

පියවර 4 : විවාදයේ ඉදිරිපත් වූ කරුණු සමලෝචනය කරන්න.

පියවර 5 : වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**


1. ඉබ්රාහිම් සෙයියිද් - උමෙයාක්කල් (දෙමළ බසින්), චෙන්නයි, වලර්මදි ප්‍රකාශකයෝ.
2. අබූබක්ර් ඒ. එම්. - ඉස්ලාමීය වරලාරු II (දෙමළ බසින්) (1989), ඉස්ලාමීය පර්යේෂණ සංගමය.
3. කයිපබාදි මායිල් , උමර් ඉබ්නු අබුදුල් අසීස්, චෙන්නයි.

**නිපුණතාව 9.0 : උමයියා අබ්බාසිය පාලන කාල තුළ හා ඉන් පසු පැවති දේශපාලන, සමාජ අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රගතිය විවේචනාත්මක ව අවබෝධ කර ගනිමින් අගයයි.**

**නිපුණතා මට්ටම 9.2 :** අබ්බාසීය පාලනයේ ආරම්භය, වර්ධනය හා වාර්තා පිළිබඳ ව විශ්ලේෂණය කරයි.

**කාලය :** කාල පරිච්ඡේද 35

**ඉගෙනුම් ඵල :**

- අබ්බාසිවරුන් පිබිදීමට හේතු හඳුනා ගනී.
- උමෙයා සේවා සමඟ අබ්බාසීය සේවා සංසන්දනය කර විවේචනාත්මක ව ඉදිරිපත් කරයි.
- අබ්බාසිය පාලනය දීර්ඝ කාලයක් පැවැතීමට හේතු තාර්කික ව ඉදිරිපත් කරයි.

## විෂය සන්ධාරය

- උමෙයාවරුන්ට පසුව ඇති වූ වංශ පාලනය, අබ්බාසීය පාලනය ලෙස හැඳින්වේ. නබි (සල්) තුමාගේ මහප්පා වූ අබ්බාස් (රළි) තුමාගේ පරම්පරාවෙන් පැවත එන්නන් පාලකයන් ලෙස සිටි බැවින් මෙම නම දී ඇත.

**මුල් අදියරේ කලීෆාවරු (හිජ්රි 132 - 232)**




- උමෙයා කලීෆා දෙවන මර්වාන් හිජ්රි 132 (ක්‍රි.ව.750) දී මරාදැමීමත් සමඟ අබ්බාසිය කාලය ආරම්භ වෙයි. එය හිජ්රි (හිජ්රි.656 - ක්‍රි.ව 1258) දක්වා එනම් ශතවර්ෂ 5 ක් පමණ පැවතිණි. ඉතිහාසඥයින් මෙම පාලන කාලය කොටස් පහකට වෙන්කර දක්වා ඇත.

1. අබ්බාසිවරුන්ගේ මුල් වකවානුව  - හිජ්රි 132-232 (ක්‍රි.ව. 750 - 847)
2. තුර්කිවරුන්, මම්ලුක්වරුන්, බලවත්වූ කාල වකවානුව - හිජ්රි 232 - 334 (ක්‍රි.ව.847-945)
3. බනූ බවයින් කාල වකවානුව - හිජ්රි 330 - 447 (ක්‍රි.ව. 945 - 1075)
4. ෂෙල්ජුක්කියවරුන්ගේ කාල වකවානුව - හිජ්රි 447 - 530 (ක්‍රි.ව. 1075-1136)
5. පිරිහීමේ කාල වකවානුව - හිජ්රි 530 - 656 (ක්‍රි.ව.1136 - 1258)

- මෙයින් මුල් කාල වකවානුව යහපත් කාලය වුණි. බලවත් කලීෆාවරු මෙම කාලයේ පාලනය කළහ. සැලකිය යුතු වර්තා ද පිහිටුවූහ. මෙම කාලයේ දී කලීෆාවරු 9 දෙනෙක් පාලනය කර ඇත්තාහ.

- අබ්බාසිවරුන්ගේ නැගිටීමට පර්සියානුවන් මහත් දායකත්වයක් ලබා දුන්හ. එහෙත් පර්සියාවේ ගෞරවාන්විත ව ජීවත් වූ පර්සියානුවන් (ඉස්ලාමය පිළිගෙන සිටි මවාලිවරු) උමෙයා පාලන කාලයේ දී දෙවන පන්තියේ පහත් රටවැසියන් ලෙස සලකන ලද නිසා හා උමෙයා පාලන සමයේ දී කෲර ලෙස පහරදීමට ලක් වූ නිසා ද මහත් මානසික පීඩනයකට ලක් වූහ. එබැවින් උමෙයාවරුන්ව විනාශ කිරීමට අවස්ථාවක් උදාවන තෙක් බලා සිටියහ. දෙවන යසීද් බලයට පත් වූ විට අබ්බාසිවරුන් අහ්ලුල් බෛත්වරුන්ට පාලන උරුමය ලැබිය යුතු යැයි ප්‍රචාරය කළහ. මුහම්මද් බින් අලී ප්‍රචාරය ආරම්භ කළ කාලයේ පටන් පර්සියානුවන් වූ කාලිද් බර්මකි, අබූ මුස්ලිම් කුරසානි වැන්නවුන් තීව්‍ර ප්‍රචාරයෙහි යෙදුනාහ. මෙබැවින් පර්සියානු ප්‍රදේශවල අබ්බාසිවරුන්ට මුළුමහත් සහයෝගයම ලැබිණි. අහ්ලුල් බෛත්වරුන්ට පාලන උරුමය ඇතැයි යන ඔවුනගේ ඉල්ලීම, දේවත්ව/දිව්‍යමය උරුමයක් සේ සලකා ක්‍රියාකළ ප්‍රතිපත්තියකට සහයෝගය දැක්වූ පර්සියානුවන්ට ඉතා ළංවූ ප්‍රතිපත්තියක් විය. පර්සියානු ප්‍රදේශයේ පැවති කූෆාව අබ්බාසිවරුන් විසින් මුලින් ම ජයගන්නා ලදී.

- මෙම තත්ත්වය සමඟම කිලාෆතයේ නොයෙකුත් වෙනස්කම් ඇති විය.

  * එක් වංශයක පාලනය අවසන් වී තවත් වංශයක පාලනය බිහිවීම.
  * කිලාෆතයේ අගනගරය අපරදිග (ඩමස්කසය) සිට පෙරදිග (බග්දාද්) ට වෙනස් විය.
  * බග්දාද්, කෝර්ඩෝවා යන නගර දෙක අගනගර කරගත් රාජ්‍යයන් දෙකක් ඇතිවිය.
  * පාලනයෙහි පර්සියානු බලපෑම අධික විය.
  * සමාජීය දේශපාලන ක්ෂේත්‍රයන්හි වෙනස්කම් ඇතිවිය.
  * කුඩා රාජ්‍යයන් ඇති විය.
  * කලාව, සාහිත්‍යය, විද්‍යාව වැනි ක්ෂේත්‍රවල වර්ධනයක් ඇති විය.

- අබ්බාසිවරුන්ගේ මුල් කලීෆා ලෙස අබුල් අබ්බාස් හිජ්රි 132 හි දී බලයට පත් විය. ඔහු හතුරන්ව මෙල්ල කිරීම සඳහා තම මුළු අවධානයම යෙදවීය. උමෙයා රජ පරම්පරාව සම්පූර්ණයෙන් ම විනාශ කර දැමීම ඔහුගේ අභිලාෂය විය. ජීවතුන් අතර සිටියවුන්ව මරා දැමීම පමණක් නොව, මරණයට පත් වී භූමදානය කරන ලද මෘතදේහවලට ද දඬුවම් ලබා දුන්නේය. බේරී පළාගිය අබ්දුර් රහ්මාන් යන තරුණයා පමණක් කෙටි කාලයකට පසුව ස්පාඤ්ඤයේ උමෙයා පාලනය ස්ථාවර කළේය. කලීෆා තමන්ව රුධිර පිපාසය ඇත්තා යන තේරුම ඇති අස්සබ්බාහ් යන නම ආරූඪ කර ගත්තේ ය.

- ඊළඟට බලයට පත් වූ කලීෆා ජෘෆර් අල් මන්සූර්, අබ්බාසිවරුන්ගේ නියම ස්ථාපකයා යැයි සැලකේ. ඔහු අලවිවරුන්ගේ බලපෑම් තිබූ කූෆාව අතහැර බග්දාදය අගනුවර කර ගත්තේය. තමා ම සැලසුම් කර සුදුසු ස්ථානයක සුදුසු ආකාරයට එම නගරය නිර්මාණය කළේය. හිජ්රි

145 සිට 150 දක්වා වූ වසර 5 ක කාලය තුළ කාලිද් බර්මකිගේ අධීක්ෂණය යටතේ එය සම්පූර්ණ විය. කවාකාර ව ඇතුළු බලකොටුව හා පිටත බලකොටුව ද අඩංගුව, මධ්‍යයෙහි ජාමිආ මස්ජිදය ද අඩි 180 උස් වූ හරිත කුළුණ ද අයට අඩංගු විය. මුහුදු මාර්ගයෙන් හා ගොඩබිම් මාර්ගයෙන් බඩු බාහිරාදිය ලැබෙන ආකාරයට මාර්ග පුළුල් ව සාදන ලදී. එය මදීනතුස් සලාම් හෝ මදීනතුල් මන්සූර් හෝ ලෙස හැඳින්වේ.

- නැවතත් උමෙයාවරුන්ගේ පිබිදීමක් ඇති නොවන ආකාරයට අබුල් අබ්බාස් උමෙයාවරුන්ව සහමුලින්ම නැතිකර දැමීය. එහෙත් කලීෆා මන්සූර්ට අලෙව්වරු හා පර්සියානුවන් කෙරෙහි බයක් ඇති විය. එබැවින් අබ්දුල්ලාහ් බින් අලි (අරාබි සෙන්පති) අබූ මුස්ලිම් කුරාසානි (පර්සියානු සෙන්පති) හා මුහම්මද් අන්නෆ්සුස් සකියියා (අලෙව්වරුන්ගේ සෙන්පති) යන තිදෙනාව අවස්ථානෝචිත ව උපක්‍රමශීලී ව මරා දැමුවේ ය. එබැවින් මොවුන්ට හතුරන් නැති ව ගියේය.

- ඉන්පසුව පරිපාලන ක්‍රමවේදයක් ඇති කළේය. උමෙයාවරුන් ලෙසම පළාත් ආණ්ඩුකාරවරුන්ව පත්කළ ද වසීර් (ඇමති), හාජිබ් (ආරක්ෂකයා) යන නව තනතුරු ද ඇති කළේය. වසීර්වරු පත් කළද කලීෆා මන්සූර් බලතල ලබා නොදීම නිසා ඔවුන් පදවි අත්හලහ. හාජිබ් නැමැත්තා දොරටු පාලකයා යන තත්ත්වයෙහි සිටිය ද ඔහු ජනතාව සම්බන්ධීකරණය කරන නිලධාරියා ලෙස කටයුතු කළේය. ඔවුන් සමඟ ම පෞද්ගලික ලේකම් කෙනෙක්ව ද පත් කර සිටියේ ය. පරිපාලනයේ දී හා හමුදාවන් හි අරාබි හා පර්සියානු සමබරතාවය ද ආරක්ෂා කළේය.

- මොහුට පසුව පුත්‍රයා වූ මහ්දි ද, ඊට පසුව හාදි ද බලයට පත්වූහ. කලීෆා මහ්දිගේ කාලයේ දී අධික ලෙස සමාජ සුභසාධන කටයුතු ඉටුවිය. එබැවින් අබ්බාසිවරුන් පිළිබඳ හොඳ අභිප්‍රායක් ජනයා තුළ සනිටුහන් කිරීමට හැකි විය. මොහු ඇමතිවරුන්ට බලතල ලබාදුන් නිසා ඔවුන්ගේ සහයෝගය ද ලැබුණි. විදේශීය සම්බන්ධතා ද ඇති විය.

- ඊළඟට පැමිණි කලීෆා හාරූන් අබ්බාසි කලීෆාවරුන් අතරින් සුවිශේෂී කෙනෙකු වෙයි. මොහුගේ කාල පරිච්ඡේදය අබ්බාසිය පාලනයෙහි උච්චම කාලය ලෙස හඳුන්වති. පියාගේ කාලයේදී ම සටන් පුහුණුව (සෙන්පති බලය) හා පරිපාලන පළපුරුද්ද (ආණ්ඩුකාරයෙකු ලෙස) ද ලබා ගත් මොහු රාජ්‍ය පාලනය මැනවින් ඉටු කළේය. මොහු වෙත බුද්ධිය හා අධ්‍යාත්මික හික්මීම ද දක්නට ලැබිණි. අල්ලාහ්ට තිබූ ලංවීම, ජනයාට දන්දීම හා උගතුන්ගෙන් උපදෙශ ලබාගැනීම යන්නෙහි ආදර්ශවත් වූයේ ය. වෙස්වලා ගෙන ගොස් ජනයාගේ අඩුපාඩු සොයා බැලීමෙහි ද නිරත විය.

- මොහුගේ කාලයේ කාලිද් බර්මකිගේ පරම්පරාවෙන් පැවති බර්මකි පවුල කලීෆාට අනුබලයක් වූයේය. යහ්යා බර්මකි කලීෆාගේ ගුරුතුමා වූවාසේම හාරූන්ට පදවි ප්‍රාප්තියට උපකාර ද කළේය. එබැවින් මොහුගේ පුතනුවන් වූ ෆලිල්, ජඃෆර් හා මූසා යන්නන් පාලනයෙහි උසස් නිලතල දැරූහ. ඔවුන් සුඛෝපභෝගී මාලිගා තැනූහ. නොයෙක් රටවලින් උගතුන් හා පොත්පත් ද බග්දාදයට ගෙන ආහ. තෑගිභෝග ලබා දුන්හ. මෙලෙස බග්දාදය අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් තත්ත්වයකට පත්විය. නවාතැන් පොළවල්, ආරෝග්‍ය ශාලා හා මස්ජිදයන් වැඩි විය. මෙලෙස බර්මකිවරු බලවත් වීම පිළිබඳ ව මහා අමාත්‍ය වූ ෆස්ල් බින් රබීආ අකමැති විය. බර්මකිවරු ශීයාවරුන් වූ නිසා පාලනය අලෙව්වරු යටතට යා හැකි යැයි කලීෆාව බියට පත් කළේය. මේ නිසා බර්මකිවරුන්ගේ බලය නැති කිරීමට කලීෆා උත්සාහ ගත්තේය. ඔවුන්ව සිරගත කරන ලදී. වස්තු රාජසන්තක කරන ලදී. මෙය යම් ආකාරයකට කිලාෆතයට හානිදායක ද විය.

- මොහුගේ කාලයේ දාරුල් හික්මා යන පුස්තකාලය ඇති කරන ලදී. අස්මඊ (ව්‍යාකරණය), ජිබ්රීල් (වෛද්‍ය විද්‍යාව), ඉබ්රාහීම් මව්සලි (සංගීතය), අබූ යූසුෆ් (ෆික්හ්) වැනි බුද්ධිමතුන් ද ජීවත් වූහ. කථාපොත් ද, දාර්ශනික පොත් ද පරිවර්තනය කරන ලදී. අබූ යහ්යා බින් ෆත්රීක්, යහ්යා බින් මුආවියා වැනි පරිවර්තකයින් සේවය කළහ.

- දේශපාලනය විශිෂ්ඨ ලෙස පැවති බැවින් විදේශීය සම්බන්ධතා අධික විය. ඒවා දේශපාලනයට, වෙළඳාමට, අධ්‍යාපනයට සම්බන්ධ විය. රෝමවරුන් හා සටන්කර අත්පත් කරගත් ප්‍රදේශ, ගිවිසුම් කඩකර කප්පම් ගෙවීම පැහැර හැරිය විට මෙහි ඵල විපාක ඇස් දකිනු ඇති මුත් කන්වලට නොඇසෙනු ඇතැයි තදින් අවවාද කළේය. ඉන්දියානු, චීන ප්‍රාන්ත රජවරුන් හා හිතවත් සබඳතා පැවැත්වූහ. මොහුගේ කාලයේ දී කෘෂිකර්මය, හස්ත කර්මාන්තය, වෙළඳාම යන ක්ෂේත්‍රවලින් අධික ආදායමක් ලැබිණි. වළාකුල, නුඹ කුමන ප්‍රදේශයකට ගොස් හෝ වර්ෂාව ලබාදෙනු මැනවි. මට එම ප්‍රදේශයෙන් බදු ලැබෙනු ඇතැයි ඔහු වැහි වළාකුළු බලා පැවසීය. මොහුගේ කාලයේ මුදල් යුරෝපීය මහාද්වීපයේ, ආසියානු හා අප්‍රිකානු මහාද්වීපවලින් ද සොයාගෙන ඇත.

- මොහුගේ කාලයේ ඇති වූ අභ්‍යන්තර ආරවුල් මර්දනයට බර්මකිවරු නව ක්‍රමවේදයක් යොදාගත්හ. ඔවුනට විරුද්ධව සටන් කිරීම වෙනුවට සාකච්ඡා කර ඔවුන්ට නිදහසේ පාලනයට ඉඩ දී කප්පම් ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කළෝය. මෙය පසුකාලීන ව කුඩා රාජ්‍යයන් ඇතිවීමට හේතු වී යැයි සඳහන් වේ. ඉද්රීසිවරුන් හා අක්ලබිවරුන් මෙය ආරම්භ කළහ.

- මොහුට පසුව කලීෆා මාමූන් බලයට පත්විය. රාජ්‍ය පාලනයට වඩා අධ්‍යාපනික පර්යේෂණවල යෙදීමට මොහුට වැඩි කැමැත්තක් තිබිණ. අමීන් ඝාතනයට ලක්වන විට මොහු මේර්ව් නගරයේ සිටියේ ය. කලීෆා වූ පසුත් ඔහු බග්දාදයට නොගියේය. ෆස්ල් බින් සහ්ල් නැමැති මහා අමාත්‍යවරයා හා සෙන්පතියා බග්දාදයේ සිට පරිපාලන කටයුතු ඉටු කළහ. එහෙත්, ඔවුන්ගේ පරිපාලනය පක්ෂපාතී ව හා ජනයාගේ අතෘප්තියට ලක් ව තිබුණි. සිරියාවෙහි උමෛයාවරුන් ද හිජාස් හි අලෙවිවරුන් ද විප්ලව කළහ. බග්දාදයේ මහ ඇමතිට විරුද්ධ විප්ලව ඇරඹිනි. එහෙත් ඒවා කලීෆා ට දැන්වූයේ නැත.

- මෙම අවස්ථාවේ කලීෆා තම දියණියව ෂීආවරුන්ගේ ඉමාම් වූ අලි රිලා ට විවාහ කර දුන්නේය. ඊළඟ උරුමක්කරු ලෙස ඔහුව පත් කළේය. මෙය අලෙවිවරුන්ට පාලන බලය ලබාදීමට යන්නේ ය යන සැකය ඇති කළේය. මෙම අවස්ථාවෙහි බග්දාදයේ තත්ත්වය බෘනා මගින් දැනගෙන බග්දාදයට යෑමට සූදානම් විය. කලීෆා හරිත වර්ණ (කොළ පාට) කබායක් ඇඳ පිටත්වීම ජනයාගේ සැකය තවදුරටත් වර්ධනය කිරීමට හේතු විය. එසැනින් අබ්බාසිවරුන්ගේ වස්ත්‍රය වන කළු පැහැති කබාය ඇඳගත්තේය. වාසනාවකට කලීෆාට පෙර අලි රිලා මරණයට පත් විය.

- බග්දාදයට පැමිණි විගස මහා අමාත්‍යවරුන්ගේ ප්‍රයෝගයන් තේරුම් ගත්තේය. පසුව ඔවුන්ව පදවියෙන් පහ කරන ලදී. බග්දාදයේ යුදෙව් හා ක්‍රිස්තියානිවරුන් ද සහිත ෂූරා සභාවක් පිහිටුවීය.

- කලීෆා හාරූන් විසින් ස්ථාපනය කළ දාරුල් හික්මාව තවදුරටත් ව්‍යාප්ත කළේය. පුස්තකාලයක් ලෙස පමණක් සේවාවන් ලබාදුන් එය බෛතුල් හික්මාව ලෙස වැඩිදියුණු කරන ලදී. මෙහි අනෙකුත් භාෂාවලින් වූ පොත්පත් පරිවර්තනය කරන ලදී. පරිවර්තනය කළ පොත්පත් වර්රාක් ලෙස හැඳින්වෙන ලිපිකරුවන් මගින් පිටපත් කරන ලදී. ඒවා පොත් ලෙස බැඳ පුස්තකාලයෙහි තබන ලදී. පරිවර්තකයින්ට පොතෙහි බරට තෑගි පිරිනමන ලදී. අපරදිග සිට ඔටුවන් පස්දෙනෙකු

ඔසවන තරම් පොත් ආනයනය කරන ලදී, හුනෛන් බින් ඉස්හාක් පුස්තකාලයට වගකිවයුත්තා ලෙස සිටියේය. බෛතුල් හික්මාහි පර්යේෂණ ඒකකයට දාර්ශනිකයෙකු වූ කින්දි වගකිවයුත්තා ලෙස සිටියේය. අල්කුවාරිස්මී, සාක්කිර් පවුලෙහි මුහම්මද්, අහ්මද් හා හසන් තාරකා විද්‍යා ආයතනයෙහි සේවය කළහ. බෛතුල් හික්මාවට පිට ද නොයෙක් පර්යේෂණ ආයතන ඇති කරන ලදී.

- මීට අමතරව අඟහරුවාදා දිනවල පැවැත්වුණු දාරුල් මුනාලරා යන විවාද මණ්ඩපයේ කලීෆා ද සහභාගී විය. බුද්ධිමතුන් 40 පමණ සහභාගී වූ මෙම මණ්ඩපයෙහි මුඃතසිලාවරු සාරවත් අදහස් ඉදිරිපත් කළහ. මේ නිසා ඔවුන් කෙරෙහි කලීෆාගේ ඇල්ම ඇති විය. කල්යත්ම කලීෆාද මුඃතසිලා කෙනෙකු බවට පත්වීමත් සමඟම, මුඃතසිලා ප්‍රතිපත්තිය රාජ්‍යයේ ප්‍රතිපත්තිය ලෙස ප්‍රකාශයට පත් කළේය. මේ නිසා උලමාවරුන්ගේ විරුද්ධත්වයට පාත්‍රවූයේ ය. මෙයට විරුද්ධ වූ උලමාවරුන්ට දඬුවම් කරන ලදී. සිරගත කරන ලදී. මෙම අවස්ථාවෙහි ඔහු මරණයට පත්වුව ද ඊට පසුව පිළිවෙලට පැමිණි මුඃතසිම් ද මෙම ප්‍රතිපත්තියම අනුගමනය කළහ. කලීෆා මුතවක්කිල්ගේ පදවි ප්‍රාප්තියෙන් පසුව මුඃතසිලා ප්‍රතිපත්තිය තහනම් කරන ලදී.

**පසු කාලය**

- අබ්බාසිවරු බලයට පත් වී එක් සියවසක කාලයක් තුළ දී එම යුගය අඳුරු වීම ආරම්භ විය. එයට දේශපාලන, සමාජයීය හේතු බොහෝමයක් දායක විය. කලීෆා මුඃතසිම්ට පසුව බලයට පත් කලීෆාවරුන් කිලාෆතයෙහි සෞභාග්‍යයට සරිලන අයුරු රාජ්‍ය පාලනය පවත්වාගෙන යාමේ සුදුසුකම් නැතිකර ගෙන සිටියහ. නිතර අලෙව්වරුන් වැනි විරුද්ධ කණ්ඩායම් කලබල ඇතිකළ අවස්ථාවල දී යුධමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට උත්සුක වූවා හැර දේශපාලනමය ක්‍රියාකලාපවලට අවතීර්ණ වූයේ නැත. කලීෆාවරු තමන්ගේ සුඛෝපභෝගී දිවිය සඳහා පාලනය තබා ගත්තා පමණක් නොව ජනයාගේ සුබ සාධනයෙහි දක්වන සැලකිල්ල අඩු කර ගත්හ. පරිපාලනමය කටයුතුවල නියුතු අමාත්‍යවරු, සෙන්පතිවරු, ආණ්ඩුකාරවරු, කලීෆාව නාමමාත්‍රව තබාගෙන තමන් ස්වාධීනව පාලන කටයුතු කරගෙන යෑම ආරම්භ කළහ.

- කලීෆා මුඃතසිම් ශ්‍රේෂ්ඨ විරුවෙක් විය. ඔහු තුර්කි සොල්දාදුවන්ට ආකර්ශණය විය. පර්සියානු හමුදාවල ආඩම්බරය මර්දනය සඳහා තුර්කි හමුදා ඛණ්ඩයක් ඇති කළේය. ඔවුන් බග්දාදයෙහි ඉතා කෲර ලෙස හැසිරුණාහ. එබැවින් ඔවුන් වෙනුවෙන් සාමර්රා නගරය නිර්මාණය කර ඔවුන්ට එහි පදිංචි කළේය. සැලකිය යුතු කාලයක් එය අගනුවර ලෙස ද පැවතිනි. තුර්කිවරු කලීෆාගේ උසස් නම්බුව ලැබූහ.

- කලීෆා මුතවක්කිල්ව තුර්කි හමුදා ඝාතනය කළහ. ඊට පසුව පැමිණි කලීෆාවරු බෙලහීන වූ හෙයින් ස්පාඤ්ඤය, ඇල්ජීරියාව, ටියුනීසියාව, ඊජිප්තුව හා මොරොක්කෝව වැනි ප්‍රදේශවල ස්වාධීන රාජ්‍යයන් බිහි විය. කලීෆාගේ බෙලහීන බව වටහාගත් අධිකාරීන් තුර්කිවරුන්ව මෙල්ල කර තමන්ව සුදුස්සන් කර ගත්හ. ඔවුන් අමීරුල් උමරා ලෙස හැඳින්වුණි.

- අමීරුල් උමරා පදවිය ලැබූවන් කිලාෆත් පරිපාලනය ඉටුකිරීමේ හැකි බලය ලැබූහ. මෙම කාලවකවානුවෙහි දී මේ දක්වා අමීර් යන නමින් සිටි ස්පාඤ්ඤයේ (අන්දලූසියාවේ) පාලකයා තමාව අමීරුල් මුඃමිනීන් ලෙස ප්‍රකාශයට පත් කළේය. ඊජිප්තුවෙහි මහ්දියාව මූලස්ථානය කර ගනිමින් ෆාත්තිමීය පාලනය පැවැතුණි. මෙම කාල වකවානුවේ පසුකාලීනව ෂීආවරුන් වන බුවෛහිද්වරු බලය ලබා ගැනීම ආරම්භ කළහ. ක්‍රි.ව. 945 දී අහ්මද් බුවෛහිද් අමීරුල් උමරා ලෙස පදවි ප්‍රාප්ත විය.

- මොහුගේ කාලයේ සිට පුවෛහිද් වරුන්ගේ කාලය ආරම්භ විය. මෙම කාලය තුළ කලීෆාවරුන් 8 දෙනෙකු පාලනය කළහ. ෂීආවරුන් වන මොවුන් හා ඊජිප්තුවෙහි ෆාත්තිම්වරුන් අතර සබඳතා තිබුණි. මේ බැවින් ෂීආ හා සුන්නි ගැටුම් නැවතත් ඇති විය. කලීෆා පුවෛහිද් වරුන් සමඟ භේදවීම ආරම්භ විය. මෙම අවස්ථාවේ දී තුර්කිවරුන් වන සල්ජුකිවරු ක්‍රමයෙන් කිලාෆතයේ තැනක් ලබා ගත්හ. කලීෆා මුඃතද්ගේ කාලයේ දී සල්ජුක්කියානුවන් තනිවම පාලනය ගෙන යෑමේ හැකියාව ලැබූහ. මෙබැවින් සල්ජුකියානු කාලසීමාව ආරම්භ විය.

- සල්ජුකියානුවන්ගේ කාලයේ දී කලීෆාවරුන් 12 දෙනෙකු පාලනය කළහ. මුස්ලිම්වරුන් හා ක්‍රිස්තියානුවන් අතර කුරුස යුද්ධ ඇති වූයේ මෙම කාල වකවානුවේ ය. සල්ජුකියානුවන් පලස්තීනය තම ආධිපත්‍යය යටතට ගත්විට එහි පැමිණෙන ක්‍රිස්තියානි සංචාරකයින්ට සීමාවන් පැනවූහ. මේ නිසා කෝපයට පත් ක්‍රිස්තියානුවන් ක්‍රිස්තු ධර්මයට අනතුරක් ලෙස අපරදිග රටවල ප්‍රචාරය කළහ. පාප්තුමන්ලා හා අපරදිග රාජකීය නායකත්වයන් ද ඔවුනට සහයෝගය දැක්වූහ. මේ නිසා මුස්ලිම්වරුන්ට අපරදිග රාජ්‍යයන් සමඟ සටන් කිරීමේ තත්ත්වයක් උදා විය. මෙවැනි සටන් මුස්ලිම්වරුන්ව හමුදාමය අතින් බෙලහීන කළේය.

- මෙම අවස්ථාවේ කිලාෆතයේ ඇති වූ වර්ධනය වූ කුඩා රාජ්‍යයන් තමන් අතරෙහි තරගකාරීත්වයක් ඇතිකර ගත්හ. එකක් තව එකක් ගිල ගැනීමට උත්සාහ ගත්තේය. අවස්ථාව බලාපොරොත්තුව සිටි විදේශ රාජ්‍යවලට මෙය අවස්ථාවක් වූයේය. කුඩා රාජ්‍යවලට උපකාර කරන මුවාවෙන් කිලාෆතය තුළට ඇතුළු වූහ. වර්ධනය වෙමින් පැවති මොංගෝලියානු අධිරාජ්‍යය මුස්ලිම්වරුන්ගේ ප්‍රදේශවලට මැදිහත් විය. 1257 දී මහා ජනගඟක් සේ බග්දාදයට ඇතුළු වූ මොංගෝලියානුවන් (තතාත්තාරිවරු) අබ්බාසිය පාලනය රුධිර ගංගාවක් මධ්‍යයේ විනාශ කර දැමීය. ෂාම් හි සිටි මුස්ලිම්වරුන් මොංගෝලීය පහරදීමෙන් බේරුණු නිසා ඔවුන් මගින් පසුව උස්මානීය කිලාෆතය ඇති වීමට මඟ පෑදිනි.

- අබ්බාසි, කිලාෆතයේ බිඳවැටීමට පහත සඳහන් දෑ හේතු සාධක විය.
    - පසු කාලීනව පැමිණි කලීෆාවරුන්ගේ නුසුදුසුකම
    - කලීෆාවරුන් අතර ඇති වූ බල තරගය
    - නුසුදුසු විනෝදාංශ
    - තුර්කිවරුන්ගේ බලපෑම
    - කුඩා රාජ්‍ය ඇතිවීම හා ඒවා අතර තරගය
    - පරිපාලනමය අපිළිවෙළ හා හමුදාව නොසලකා හැරීම
    - කුරුස යුද්ධ
    - ආර්ථික අක්‍රමිකතා
    - මොංගෝලියානු ආක්‍රමණ

- අබ්බාසිය කාලයේ දක්නට ලැබුණු කුඩා රාජ්‍ය කිහිපයක්

| නම | පිහිටුවූ තැනැත්තා (ස්ථාපකයා) | රට | කාලය (හිජ්රි) |
|---|---|---|---|
| අක්ලබි | ඉබ්‍රාහිම් බින් අක්ලබ් | ටියුනීසියා | 184-296 |
| සියාදි | මුහම්මද් බින් සියාදි | යෙමනය | 203-402 |
| තාහිරි | තාහිර් බින් හුසෙන් | කුරාසාන් | 205-225 |
| සෆ්ෆාරි | හෑකූබ් බින් ලෛස් සෆ්ෆාරි | ඉරානය | 259-299 |
| අලවියියා | සෛදි අලවි | තබරිස්ථානය | 250-316 |
| ෆාත්තිම් | උබෛදුල්ලා උබෛදි | ටියුනීසියාව | 296-567 |
| හම්දානි | අබ්දුල්ලාහ් බින් හම්දාන් | මව්සිල් . . . | 289-389 |
| කස්නවි | මුහම්මද් කස්නවි | ඇෆ්ගනිස්ථානය | 351-552 |
| අයියූබි | අයියූබ් | ඊජිප්තුව | 564-700 |

**අධ්‍යාපන හා සංස්කෘතික ප්‍රගතිය**

- උමෙයා කාලයේ අඩිතාලම් දමන ලද අධ්‍යාපන හා සංස්කෘතික උත්සාහයන් අබ්බාසි කාලයේ දී මහත් වර්ධනයක් පෙන්වීය. විශේෂයෙන්ම, පර්සියානුවන් සමඟ තිබූ සම්බන්ධතාවය මෙයට ප්‍රධාන හේතුව වන්නට ඇත. පාලනයෙහි තමන්ට ලබාදෙන ලද ස්ථානය ඔවුන් මේ ක්ෂේත්‍රයෙහි සහයෝගය දැක්වීමට ආධාරක ශක්තියක් ලෙස පැවතින. අරාබි භාෂාවෙහි ගද්‍ය ශෛලියෙහි හා පද්‍ය ශෛලියෙහි යන දෙකෙහිම වෙනස්කම් ඇති විය.

- උමෙයා කාලයේ දී උසස් තරාතිරමේ පුද්ගලයන් සඳහා හෝ ඔවුන්ව පසුබිම් කරගත් සාහිත්‍යයන් පමණක් ඇති විය. එහෙත් අබ්බාසි කාලයේ දී පොදු ජනයා වෙනුවෙන් සාහිත්‍යය ඇති කරන ලදී. අබූ නුවාස් මෙය ආරම්භ කළේය. ඉබ්නු කුතෛබා ඉදිරියට ගෙන ගියේය. අරාබි බසෙහි භාවිතයේ පැවති දිග වාක්‍ය වෙනුවට පර්සියානු භාෂාව අනුගමනය කර කුඩා වාක්‍ය ඇතුළත් විය. ඉබ්නු මුකම්බආ හා මුහම්මද් බින් යසාර් වැනි භාෂා දෙකෙහිම නිපුණත්වය ලැබූවන් ඔවුන්ගේ ග්‍රන්ථවල මෙවැනි භාෂා ශෛලියන් භාවිත කළහ. (උදා : අදබුස් සකීර්, අදබුල් කබීර්, කලීලා වතිම්නා) පර්සියානු භාෂාව අනුගමනය කළ කථාපොත් මකාමා යන නමින් බිහිවිය. (මකාමා හරීරි) කලීෆා මන්සූර්ගේ කාලයේ මුත්ඉම් බින් ඉයාල්, හාරූන්ගේ කාලයේ අබ්බාස් බින් අෑලම් වැනි කවියන් අරාබි සාහිත්‍යය පෝෂණය කළෝය. අබූ නුවාස් කම්රිසියා, හිජා කාව්‍යවල නව උපායයන් හැසිරවීය.

- බග්දාද් හා සමර්කන්ද් යන නගරවල කඩදාසි නිෂ්පාදනය කළ හෙයින් පොත් විශාල සංඛ්‍යාවක් ජනිත විය. ප්‍රස්ථාවපිරුලු, කුත්බාවන්, උපදේශයන් අක්ෂරවලින් ඇති විය. උමෙයා කාලයේ දී හදීස් එක්රැස් කිරීමේ උත්සාහයන් ආරම්භ වුව ද අබ්බාසි කාලයේ දී එය උච්ච අවස්ථාවට පත් විය. හදීස් එක්රැස් කර සටහන් කිරීම (මුස්නද්) යන තත්ත්වයට වඩා හදීසයන් හොඳින් පර්යේෂණයට ලක්කර පොත් ලිවීමේ තත්ත්වය ඇති විය. අස්මාඋර් රිජාල් හා ඉල්මුල් ජරහ් කලාවන් ඇති විය.

- මෙලෙස ෆික්හ් ද තනි කලාවක් ලෙස මෙම කාලයේ දී ඇති විය. ප්‍රධාන නගරවල පැවති ෆික්හ් පන්ති ද ෆික්හ් පොත්පත් ඇතිවීමට මඟ පෑදීය. ෆික්හ් හා මද්හබ් යන ආයතන ස්ථිර විය. අදොම්මතුල් මුජ්තහිදීන් ලෙස හැඳින්වෙන ෆික්හ් හා සම්බන්ධ උලමාවරු ඇති වූහ. ඔවුන්ගේ ශිෂ්‍යයින් ෆික්හ් කලාව තවදුරටත් පෝෂණය කළහ. මෙහි කලීෆාවරුන්ගේ දායකත්වය ද දැකිය හැකි විය. (රාජ්‍ය මද්හබ් ලෙස ප්‍රකාශයට පත් කිරීම) මද්හබයන්ට ආවේණික තනි තනි මද්රසාවන් ද ආරම්භ කර තිබුණි.
- තෆ්සීර් තනි කලාවක් ලෙස වර්ධනය වූ අතර තෆ්සීර් මඃසූර්ට වඩා වැඩියෙන් තෆ්සීර් මඃකූල් ඇති විය. නොයෙකුත් විද්‍යා ක්ෂේත්‍රවලට සම්බන්ධ තෆ්සීර් ද, තෆ්සීර්හි ඉස්රාඊලියිය බලපෑම් ද මෙම කාලයේ දී ඇති විය. තසව්වුෆ් මෙම කාලයේ දී ප්‍රචලිත විය. සූෆිවරු ලෙස හැඳින්වෙන ආත්මාවබෝධය ලැබූවන් බිහි වූහ. තසව්වුෆ් ක්ෂේත්‍රයට පිවිසීමට කැමැත්ත දැක්වූවන්ට පුහුණු තරීකා ක්‍රමය ද මෙම කාලයේදී ම බිහි විය.
- අක්ලියියා කලාවන් හි ව්‍යාප්තිය මෙම කාලයේ දී සිදුවූ ඉතා වැදගත් වූ වාර්තාවක් විය. බයිතුල් හික්මා හි බිහිවීම, පරිවර්තනය, පර්යේෂණ උත්සාහයන් මධ්‍යකාලීන මුස්ලිම්වරුන්ව දැනුමෙහි උච්ච අවස්ථාවට ගෙනැවිත් තැබීය. මුස්ලිම්වරුන්ගේ පර්යේෂණ හා නිර්මාණයන් නවීන කාලයේ බිහිවීමට මඟපෙන්වීය.
- පර්සියානු බලපෑමේ හේතුවෙන් චිත්‍ර හා කැටයම් වැනි ක්ෂේත්‍රයන් වර්ධනය විය. අරාබි අක්ෂර ලිවීමේ කලාවේ නව අක්ෂර විලාසයන් ඇති විය. ඒවා නොයෙකුත් ද්‍රව්‍යවල (කඩදාසි, හම්, බිත්ති, ලී කුට්ටි, ලී, ලෝහ ද්‍රව්‍ය) වල සටහන් විය. අරබෙක්ස් නැමැති සුවිශේෂී අලංකාර ක්‍රමය හඳුන්වා දෙන ලදී. බග්දාද් නගරයත් සමඟම මහ්දියියා, සාමර්ර, මුස්තන් සිරියියා හා මුදස්සියියා වැනි නගරවල සැලසුම් සහගත ව අලංකාර ගොඩනැගිලි හා මෝස්තර බිහි වී වර්ධනය විය. සමකාලීනව බග්දාදය හා කෝර්ඩෝවාව අතර මෙම ක්ෂේත්‍රයේ ඇති වූ තරගය විද්‍යාව හා මෝස්තර නිර්මාණ කලාවන්හි වර්ධනයට හා ව්‍යාප්තියට ආධාරක ශක්තියක් ලෙස පැවතිනි. උමෙයා කාලයේ පැවති අරාබිවරුන් පමණක් යන තත්ත්වය වෙනස් වී සියලුම සමාජවල දායකත්වයෙන් ඉස්ලාමීය ශිෂ්ටාචාරය උච්ච අවස්ථාවට පත් විය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : අබ්බාසිය පාලනය පිළිබඳ කෙටියෙන් පහදන්න.

පියවර 2 : අබ්බාසිවරුන් පිළිබඳ තොරතුරු රැස්කිරීමට යොමු කරන්න.

පියවර 3 : පහත සඳහන් අබ්බාසිය කලීෆාවරුන් පිළිබඳ සාකච්ඡා කිරීමට කණ්ඩායම් 3කට සිසුන් වෙන් කරන්න.

i. කලීෆා මන්සූර්
ii. කලීෆා හාරූන්
iii. කලීෆා මඃමූන්

පියවර 4 : කණ්ඩායම් ගොනුකල කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 5 : මා කැමති අබ්බාසිය කලීෆා මයෙන් පන්ති සංගයේ කථා පැවැත්වීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**

1. සෙයියිද් ඉබ්රාහිම් - අබ්බාසිකල් කොටස I, කොටස II (දෙමළ බසින්),චෙන්නයි, වලර්මදි ප්‍රකාශකයෝ
2. අබූබක්කර් ඒ. එම්. (1998) ඉස්ලාමීය වරලාරු පාකම් 4 (දෙමළ බසින්), සායින්දමරුදු වි. ඉස්ලාමීය පර්යේෂණ සංගමය.

**නිපුණතාව 9.0 : උමයියා අබ්බාසිය පාලන කාල තුළ හා ඉන් පසු පැවති දේශපාලන, සමාජ අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රගතිය විවේචනාත්මක ව අවබෝධ කර ගනිමින් අගයයි.**

**නිපුණතා මට්ටම 9.3** : යුරෝපයට ඉස්ලාමය හඳුන්වා දුන් පසුබිම දැන තේරුම් ගනී.

**කාලය** : කාල පරිච්ඡේද 35

**ඉගෙනුම් ඵල** :

- යුරෝපයේ ඉස්ලාමය පැතිරීමේ පසුබිම සඳහන් කරයි.
- යුරෝපයේ ප්‍රබෝධයට ස්පාඤ්ඤ හා උස්මානීය මුස්ලිම් පාලනයන්ගේ දායකත්වය හඳුනා ප්‍රකාශ කරයි.
- යුරෝපීය පිබිදීමෙහිලා මෙම පාලනයේ දායකත්වය හේතු සහිතව ගෙනහැර දක්වයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

**ස්පාඤ්ඤයේ මුස්ලිම් පාලනය**

- ඉස්ලාමය උදා වී ආසියාව හා අප්‍රිකාව යන මහාද්වීපවල තම රැස් කිරණ විහිදුවා වසර 90 ක් ගත විය. එය ජාත්‍යන්තර ශිෂ්ටාචාරයක් හෙයින් යුරෝපීය මහාද්වීපයට ද රැස්කිරණ විහිදුවීමේ අවශ්‍යතාවයක් ඇති විය. මෙය ඉෂ්ට කරන්නා වූ වසර හිජ්රි 92 වසර වේ. එය යුරෝපයේ ඉස්ලාමය පය තැබූ වසර වේ.
- මුස්ලිම්වරුන්ගේ පාලනයෙන් උතුරු අප්‍රිකාව සාමය හා බලය ලැබ පැවතියේ ය. උතුරු අප්‍රිකාවට යාබදව පිහිටි ස්පාඤ්ඤයේ අරාජකත්වයක් පැවතුණි. විදිෂා නැමැති රජතුමාව කුමන්ත්‍රණයකින් ඝාතනය කරවූ පූජකයින් ගෝත් (Goths) ජාතියට අයත් රොඩ්රික් නැමැත්තාව පදවියට පත් කළහ. මොහුගේ දේශපාලන, සමාජයීය හා ආර්ථික ක්‍රියා පිළිවෙල පූජ්‍ය පක්ෂය හා ප්‍රභූන් හැර අන් අයට හානි ඇති කළේය.
- උතුරු අප්‍රිකානු තුඩුවෙහි පිහිටි සියුදා යන පලාත ස්පාඤ්ඤයේ පාලනයට නතුව පැවතුණි. එය ජූලියන් යන යුවරජු විසින් පාලනය විය. ඔහු මරාදමන ලද විදිෂා රජුගේ දියණිය විවාහ කරගෙන සිටියේය. එබැවින් තම මාමණ්ඩියගේ ඝාතනයට පළිගැනීමේ අදහසක් ඔහුට තිබිණි.
- තවද රජ මාලිගාවේ නතර වී අධ්‍යාපනය ලබමින් සිටි ඔහුගේ දියණිය රොඩ්රිග් විසින් බලහත්කාරකමට ලක් කරන ලදී. මෙය රොඩ්රිග් ගෙන් පළිගැනීමට අවශ්‍ය වූ තවත් එක් සිදුවීමක් විය. මොරොක්කෝවෙහි උතුරු අප්‍රිකාවේ ආණ්ඩුකාරවරයා වූ මූසා බින් නුසෛර්ව හමු වූ ජූලියන්, ස්පාඤ්ඤය ආක්‍රමණය කරන ලෙස ඉල්ලා සිටියේය.
- තවද, රජු හා පූජකයින් යුදෙව්වන්ව පිළිකුල් කළහ. ඔවුන්ට කතෝලිකයින් ලෙස ආගම මාරුකරන ලෙස බලකරමින් සිටියහ. අකමැති වූවන්ව මරා දමන ලදී. ඔවුන්ගේ දේපළ හා වස්තුව උදුරා ගන්නා ලදී. බේරී පලාගියවුන්ව අල්ලා ප්‍රභූන්ගේ වහලුන් ලෙස දෙන ලදී. මෙය ඉවසාගත නොහැකි වූ යුදෙව්වන් බෙබර්වරුන් සමඟ එක් ව කැරළි ගැසීමට සූදානම් වූහ. කුමන්ත්‍රණ උත්සාහය ප්‍රසිද්ධියට පත් වීම නිසා ඔවුන් උතුරු අප්‍රිකාවට බේරී පළා ගියහ.

- රොඩ්‍රිග්ගේ පාලනයෙන් මධ්‍යම පාන්තිකයින්ට කෘෘරකම් සිදුවිය. ඔවුන් මත අසාධාරණ බදු පනවන ලදී. ඔවුන්ගේ ඉඩම් උදුරාගන්නා ලදී. වේතන නොමැතිව වැඩ ගන්නා ලදී. මෙය ද දරාගත නොහැකි වූවන් උතුරු අප්‍රිකාවට පලාගියහ. යුදෙව්වන්, මධ්‍යම පන්තිකයින් හා ජූලියන්ගේ බලපෑම නිසා ආණ්ඩුකාර මූසා පෙළඹවීමට ලක් විය. කලීෆාගේ අනුමැතිය ඇති ව තාරික් බින් සියාද් යන තරුණ සෙන්පති ජූලියන්ගේ ආධාරක හමුදා ද සහිත ව ස්පාඤ්ඤයට යැව්වේය.

- තාරික්ගේ හමුදා ජිබ්රෝල්ටර් (ජබල් අල් තාරික් යන්නෙන් විකසනය වූ ආකාරය) සමුද්‍ර සන්ධිය තරණය කර ස්පාඤ්ඤයට ළඟාවිය. රොඩ්රික් උතුරෙහි සටන් මෙහෙයවමින් සිටි අවස්ථාව බලා හමුදාව මෙහෙයවීය. ජසීරා පළාත ඔහු අතට පත් විය. තෙලතෝ හා කෝර්ඩෝවා නගර යටත් විය. ආණ්ඩුකාරවරයා වන මූසා අනෙක් පසින් පැමිණ වෙලිලිය යටත් කර ගත්තේය. පෘතුගාලය ද මුස්ලිම්වරුන් යටතට පත් විය. මෙය, අඩ සඳ ඉදිරියේ කුරුසය බලරහිත වී සිටීමක් යැයි ඉතිහාසඥ ග්‍රාන්ට් සඳහන් කරයි.

- ස්පාඤ්ඤය හිජ්රී 92 සිට 132 දක්වා උමෙයා අධිරාජ්‍යයේ එක් පළාතක් ලෙස පැවතිය අතර 138 සිට උමෙයාවරුන්ගේ තනි (ඉමාරත්) පාලන ප්‍රදේශයක් ලෙස පැවතිණි. 317 හි දී උමෙයා පාලකයා තමාව අමීරුල් මුඃමිනීන් ලෙස ප්‍රකාශයට පත්කර ගත්තේ ය. 422 හි දී එම පාලනය බිඳවැටුණු අතර 898 දක්වා (ක්‍රි.ව.1492) කුඩා රාජ්‍ය පාලනය කළහ.

- ඉමාරත් පාලනය සිදුවූ කාලයේ දී අලුත් පරිසරයක අලුත් පාලකයකු මුහුණ දුන් අභියෝග අන්දලූස් පාලකයින් ද මුහුණ දුන්හ. හිෂාම්, හකම් වැන්නවුන්ගේ කාලයේ දී අරාබි භාෂාව ඉගැන්වීමෙහි අවධානය යොමු විය. මාලිකි මද්හබයේ නීතිරීති ක්‍රියාත්මක විය. දෙවන අබ්දුර් රහ්මාන්ගේ කාලයේ දී දැඩි ක්‍රිස්තියානි විරුද්ධවීම්වලට මුහුණ දුන්නේ ය. කෙසේ වෙතත් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උත්සාහයන් ආරම්භ කරන ලදී. මේ නිසා, කෝර්ඩෝවාව බග්දාදයට සමකළ හැකි නගරයක් ලෙස වර්ධනය විය. අය අගනගරය ලෙස ද කලාත්මක නගරය ලෙස ද දර්ශනය විය.

- කිලාෆත් යුගය ආරම්භ වූ විට එය තවදුරටත් වර්ධනය විය. අබ්බාසීය කලීෆා බෙලහීන වී පුවෙහිද්වරුන්ට බලය ලබාදුන් විට, ෆාත්තිම්වරු ඊජිප්තුව තම බලයට යටත් කරගත් විට තුන්වන අබ්දුර් රහ්මාන් තමාව අමීරුල් මුඃමිනීන් ලෙස ප්‍රකාශයට පත් කළේය. මෙම කාලයේදී දේශීය ආදායමින් තුනෙන් එක් පංගුවක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ලදී. දෙවන හකම් අන්දලූසියාවෙහි මාමූන් ලෙස ක්‍රියා කළේය. නොයෙකුත් රටවල්වල බුද්ධිමතුන්ව කෝර්ඩෝවාවට ගෙන්වීය. පාඨශාලා හා පුස්තකාල ඇති කළේය. තම සොහොයුරු මුන්සීර්ව එම පාසල් අධීක්ෂණයට පත් කළේය. තවත් සොහොයුරෙක් වූ අසීස් ව ප්‍රධාන පුස්තකාලයාධිපති ලෙස පත් කළේය. මොවුන්ගේ කාලයේ දී නිදහස් අධ්‍යාපනය ලබා දෙන ලදී. කෝර්ඩෝවාහි ආභරණ වෙළඳ සැල් හා රෙදි වෙළඳසැල්වලට වඩා වැඩියෙන් පොත් සාප්පු දක්නට ලැබිණි. පොත් සාප්පු 2000 හා පුස්තකාල 70 ක් එහි දක්නට ලැබිණි. මේවා අතර උමෙයා පුස්තකාලය ප්‍රධාන විය. හොඳ පොත් කුමන ප්‍රදේශයක ලියන ලද නමුත් ඒවා මිලයට ගැනීමට අමීරුල් මුඃමිනීන් ලෑස්ති ව සිටියේය. කිතාබුල් අකානි යන පෙරදිග දී ලියන ලද පොත එහි ප්‍රකාශයට පත්වීමට පෙර, ඩිනාර් දහයකට අමීරුල් මුඃමිනීන් මිලයට ගත්තේය. මෙලෙස අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පාලකයා ගත් උත්සාහයන් සමාජයේ පහත මට්ටම්වල ජීවත් වූවන්ව ද අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නියැලීමට පොළඹවමින් තිබිණ. සාමාන්‍ය කම්කරුවන් පවා ඔවුන්ගේම පුස්තකාල තබාගෙන සිටියහ.

- ක්‍රිස්තියානි යුරෝපයේ පූජකයින් හා ඉහළ පැළැන්තියේ අය පමණක් අධ්‍යාපනය ලැබූ මුත්, අන්දලූසියාහි සෑම පුරවැසියෙක් ම ලිවීමට හා කියවීමට ඉගෙනගෙන සිටියහ. කෝර්ඩෝවා විශ්ව විද්‍යාලය යුරෝපයට අධ්‍යාපන රැස් ලබා දුනි. වාග් විද්‍යාඥ අබූ අලි අල් ගාලි, ඉතිහාසඥ ඉබ්නු කූදියා, හදීස් ක්ෂේත්‍රයේ විශේෂඥ අබූ බක්කර් ඉබ්නු මුආවියා, ෆික්හ් ක්ෂේත්‍රයේ විශේෂඥ අබූ ඉබ්රාහිම් වැන්නවුන් මෙහි කථිකාචාර්යවරු ලෙස සේවය කළහ. අහසේ පියෑඹීමට ප්‍රථම වතාවට විද්‍යාත්මක ව උත්සාහ ගත් ඉබ්නු ෆිර්නාස්, ශල්‍ය වෛද්‍ය විශේෂඥ අල් සහ්රාවි, ස්වයං ක්‍රියාකාරී ඔරලෝසුව නිර්මාණය කළ අබීදත් වැන්නවුන් අන්දලූසියානු පර්යේෂකයින් වෙති.

- කෝර්ඩෝවා විශ්වවිද්‍යාලයයේ විශේෂත්වය දැනගත් යුරෝපීයයන් පිරනීස් කන්ද තරණය කර පැමිණීමට උත්සාහ ගත්හ. ඇල්ෆ්‍රඩ් නම් මුනිවරයා අරාබි ඇඳුම් ඇඳ පැමිණ අන් අයට ද මඟ පෙන්වීය. මොවුන් මෙහි අධ්‍යාපනය ලබා පිටව යන විට පොත් කිහිපයක් ද රැගෙන ගොස් ඒවා පරිවර්තනය කර ඉගෙන ගත්හ. පුනර්ජීවනය පිළිබඳ චින්තනය ඔවුන්ගේ සිත්හි සනිටුහන් වූයේ මෙවිටයි.

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොව ජීවිතයේ සියළුම ක්ෂේත්‍රවල ඔවුන් උසස් තත්ත්වයක සිටියහ. කෘෂිකාර්මික දියුණුව සඳහා ඇල හා වේලි බැන්දාහ. තෙල්මෝල් ඇති කළහ. හස්ත කර්මාන්තයෙහි අධික ලෙස අවධානය යොමු කළහ. හම් ඇතිරිලි, වර්ණවත් පලස්, උපකරණ, අස්තර්ලොප් වැනි උපකරණ හා පිඟන් භාජන නිෂ්පාදනය කෙරිණ. රෙදිවල අරාබි අකුරු සටහන් කරන ලදී. මේවා අලංකාර චිත්‍ර ලෙස යුරෝපීයයන් සිතූහ. මුස්ලිම්වරුන්ගේ ගෘහ නිර්මාණ කලාව එහි සුවිශේෂීව තිබිණ. මූරිස් ගෘහනිර්මාණ ශිල්පය ලෙස එය වර්ධනය විය. අල් හම්රා, අල් කස්ර් යන මාලිගා ඔවුන්ගේ ශිල්පීය කුසලතාව අදටත් ගෙනහැර පායි.

- සුල්තාන් දෙවන හකම්ට පසු බලවත් පාලකයින් නොමැති විය. ඔහුගේ පුත් බලයට පත්වන විට ඔහුට වයස 11 කි. එම අවස්ථාවේ ලේකම් ලෙස සේවය කළ තැනැත්තා මහ අමාත්‍යවරයා වී (හාජිබ්) අල් මන්සූර් යන නමින් පාලනය කිරීම ආරම්භ කළේය. මොහු පළපුරුද්ද ඇත්තෙකු වූ හෙයින් පාලනය හොඳින් ඉටුකළේය. මොහුට පසුව පුත් හාජිබ් ලෙස කටයුතු කළ විට ජනයා අප්‍රසාදයට පත් වූහ. මධ්‍යම පන්තිකයින්, කම්කරුවන් හා ව්‍යාපාරිකයින් යන සියලුදෙනා ම කැරලි ගැසීම ආරම්භ කළහ. මෙම අවස්ථාවේ දී උතුරු ප්‍රදේශයේ රටවල ක්‍රිස්තියානීන් මායිම් ප්‍රදේශ අත්පත් කිරීම ආරම්භ කළහ. හාජිබ් පවුලෙහි විනාශයත් සමඟම උමෙයා පාලනය ද අවසන් විය.

- මීට පසු මුලුක්කුත් තවාඉෆ් යැයි හැඳින්වෙන කුඩා රාජ්‍යවල කාලය ඇරඹිණි. කුඩා රාජ්‍යයන් 23 ක් ඇති වී නැති ව ගියේ ය. උතුරු අප්‍රිකාව හා සම්බන්ධතා පැවති මුරාබිදූන්වරු හා මුවහ්හිදීන්වරු මෙම කාලයේ දී අන්දලූසියාව සුළු කාලයකට පාලනය කළහ. අවසාන වශයෙන් ග්‍රනඩාව පමණක් ඉතිරිව තිබිණ. ඉබ්නු අහ්මර්ගේ කලාත්මක හැකියාවන් පෙන්නුම් කරන අල්හම්රා මෙම කාලයේ දී නිර්මාණය කරන ලදී. වටේ පිහිටි ක්‍රිස්තියානි රාජ්‍යවලින් නිතර ඇති වූ ආක්‍රමණ හා පෙළඹවීම් මගින් රට අභ්‍යන්තරයෙහි ඇති කළ කෝලාහල මගින් මුස්ලිම්වරුන්ට අන්දලූසියාවෙහි ජීවත් වීමට නොහැකි ලෙස කරදරවලට ලක් කරන ලදී. එබැවින් එක් පසකින් මුස්ලිම්වරුන් රටින් පිටව ගියහ. අනෙක් පසින් මුස්ලිම්වරුන්ව එළවා දමන ලදී. අවසාන වශයෙන් හිජ්රි 898 වසර වනවිට (ක්‍රි.ව.1492) අන්දලූසියාව හා මුස්ලිම්වරුන් අතර සම්බන්ධතාවය සම්පූර්ණයෙන් ම නැති ව ගියේ ය.

- පරිහානියට හේතු :
    * දෙවන හකම්ට පසුව පැමිණි පාලකයින්ගේ බෙලහීනකම
    * බලය මාරුවීම (හාජිබ් පවුලට)
    * උතුරු රටවල ක්‍රිස්තියානීන් දිගටම විරුද්ධව කටයුතු කිරීම
    * බේබර්වරු (උතුරු අප්‍රිකානු) සතුරන් බවට පත්වීම.
    * කුඩා රාජ්‍ය ඇතිවීම
    * බලවත් මුස්ලිම් පාලනයක් පසුබිම් ශක්තියක් ලෙස ඇති නොවී තිබීම

- වාර්තා
    * යුරෝපයේ ඉස්ලාමීය චින්තනය පැතිරවීම
    * මුස්ලිම්වරුන්ගේ විද්‍යාත්මක සොයාගැනීම් යුරෝපයට ලැබීම.
    * යුරෝපීය භාෂාවල අරාබි වචන හා භාෂා ව්‍යවහාරයන් ඇතුළු වීම.
    * මුරිෂ් ගෘහ නිර්මාණ ශිල්පය ඇති වී ව්‍යාප්ත වීම.
    * පෙරදිග ජීවන ක්‍රමය අපරදිගට හඳුන්වා දීම.
    * මධ්‍යම කාලය අවසන් වී නවීන කාලය ඇතිවීමට අඩිතාලම දැමීම. (ආගමික විප්ලවය, ප්‍රංශ විප්ලවය, දේශ ගවේෂණය)

**උස්මානීය පාලනය**

- අන්දලූසියා උමෙයා පාලනයට පසුව යුරෝපයේ පාලනය කළ තවත් ජාතියක් වනුයේ උස්මානීය තුර්කිවරු ය. නබි (සල්) තුමා ජීවතුන් අතර සිටි කාලයේ දී ම කොන්ස්තන්තිනෝපලය පිළිබඳ ව මතක් කළහ. එය මුස්ලිම්වරුන්ගේ පාලනයට ගෙනෙන්නාට ප්‍රශංසා කළේය. එබැවින් ඒ සඳහා දීර්ඝ කාලයක් උත්සාහ ගන්නා ලදී.

- තුර්කිවරුන් මධ්‍යම ආසියාවේ ජීවත් වූහ. හත්වන සියවසෙහි දී ඔවුන් ඉස්ලාමය වැළඳගත්හ. දසවන සියවසෙහි දී ඔවුන් ඉරාකය, ඉරානය වැනි ප්‍රදේශවල පදිංචි වූහ. තුර්කිවරුන්ගේ එක් කොට්ඨාසයක් වන සල්ජුකිවරු, 11 වැනි සියවසේ ඉතා බලසම්පන්න වූහ. අබ්බාසි කලීෆාව තම හස්තය යටතට ගෙන ආහ. බෙසන්තියානු අධිරාජ්‍යයට පහළින් තිබූ ඇනටෝලියාව ද අත්පත් කර ගත්හ. එම අවස්ථාවේ සිටි සුල්තාන් අල්ෆ් අර්සලාන් නැමැත්තා ඇනටෝලියාවට තුර්කිය යන නම තැබුවේය.

- තුර්කිවරුන්ගේ තවත් කොටසක් උස්මාන් නැමැත්තාගේ නායකත්වයෙන් බලසම්පන්න වූහ. එබැවින් මොවුන් උස්මානීය තුර්කිවරු ලෙස නම් ලැබූහ. පළමුවන උස්මාන් බෙසන්තියානුවන් සමඟ යුධ වැද ක්‍රි.ව. 1326 දී පූර්සාව ජයගෙන උස්මානීය පාලනය ස්ථාපනය කළහ. ඔහුගේ මාර්ගයේ පැමිණියවුන් ක්‍රම ක්‍රමයෙන් දේශසීමාව පුළුල් කර ගත්හ. දීර්ඝ කාලීනව කොන්ස්තන්තිනෝපලය තම යටතට ගෙන ඒමේ මුස්ලිම්වරුන්ගේ ආශාව ක්‍රි.ව.1453 දී ඉෂ්ට විය. දෙවන මුහම්මද් එය තම පාලනය යටතට ගෙන ආවේය. එබැවින් මුහම්මද් අල් ෆාත්තිහ් යැයි මුස්ලිම් ලොවෙහි ප්‍රශංසා ලැබීය. එදා සිට එම නගරය ඉස්ලාම්බූල් ලෙස හැඳින්විනි. මෙයම කාලයාගේ ඇවෑමෙන් වෙනස් වී ඉස්තාන්බූල් ලෙස හැඳින්වෙයි.

- උස්මාන්වරු කොන්ස්තාන්තිනෝපලය ජයගැනීම ඉතිහාසගත වාර්තාවක් වෙයි. කලීෆා මුආවිය (රළි) තුමාගේ කාලයේ පටන් ඒ සඳහා උත්සාහ ගැනිණි. සියවස් හතහමාරකට පසුව එය ඉෂ්ඨ විය. මෙය කුරුස යුද්ධයට පසුව මුස්ලිම්වරුන් ලැබූ ඉමහත් ජයග්‍රහයණයක් වෙයි.

මීට පසුව උස්මාන්වරු තම පාලනය ව්‍යාප්ත කර ගත්හ. පළමුවන සලීම් සුල්තාන් 1517 දී මම්ලූක්කිවරුන්ව ජයගෙන ඊජිප්තුව හා සිරියාව තමන් සතුකර ගත්තේය. ක්‍රි.ව. 16 වන සියවසෙහි දී උස්මාන් පාලනය උතුරු අප්‍රිකාව දක්වා ව්‍යාප්ත විය. ඊජිප්තුව, ලිබියාව, ටියුනීසියාව, ඇල්ජීරියාව වැනි ප්‍රදේශ හා එලප්පෝ, ඩමස්කස් වැනි ෂාම් ප්‍රදේශ ද, අරේබියාවෙහි හිජාස්, යෙමන් වැනි පළාත්ද, උස්මානීය පාලනයට නතු විය. එට්‍රියාට්ටික් සිට බෝල්කන් දක්වා එහි ආදිපත්‍යය පැතිරුණි. ග්‍රීසිය, ඇල්බේනියාව, මෙසිඩෝනියාව, සර්බියාව, බල්ගේරියාව, යුගෝස්ලාවියාව, බොස්නියාව වැනි යුරෝපීය රටවල් ද උස්මානීය පාලනය යටතට පත් විය. සමකාලීන අවධියෙහි ඉතාමත් ම පැතිරුණු බිම් ප්‍රදේශයක් පාලනය කිරීමේ ආඩම්බරය උස්මානිවරුන්ට ඇත. තුර්කි සුල්තාන් අධිරාජ්‍යයේ අධිරාජ්‍යයා පමණක් නොව මුස්ලිම්වරුන්ගේ අධ්‍යාත්මික නායකයා ලෙස ද සැලකිණි. 1492 හි දී යුරෝපයෙන් මුස්ලිම්වරුන්ව එළවා දැමූ විරුද්ධ බලවේගවලට මෙය මහත් හිසරදයක් විය.

- සුල්තාන් සුලෙමාන් (ක්‍රි.ව.1520-1566) උස්මානීය කලීෆාවරුන්ගෙන් සැලකිය යුතු කෙනෙකු වෙයි. ඔහු පාලනයෙහි නොයෙකුත් ප්‍රතිසංවිධාන ඇති කළේය. බහු වාර්ගිකයින් ජීවත්වන අධිරාජ්‍යයෙහි සියලුදෙනා ම හිස කෙලින් තබාගෙන ජීවත්වීමේ හැකියාව ඇති නීති කෙටුම්පතක් ඇති කළේය. එබැවින් ඔහු සුලෙමාන් අල් කානූනි යැයි හැඳින්විණි. ඇමරිකානු සෙනෙට් සභාවෙහි එල්ලා ඇති නීති සම්පාදන විශාරදයින්ගේ ලැයිස්තුවෙහි ඔහුගේ නම ද ඇතුළත් වෙයි.

- තුර්කි අධිරාජ්‍යයේ ඉස්ලාමීය ෂරීආව පදනම් කොටගත් පාලන ක්‍රමයක් පැවතිණ. එහෙත් අන්‍ය ආගමිකයින් තම අයිතීන් භුක්ති වින්දහ. ඔවුන්ගේ අයිතීන් මිල්ලත් යන්නට අනුකූලව ආරක්ෂා කරන ලදී. 1924 හි දී කිලාෆතය නැති කරන තුරු සුල්තාන්වරු 38 ක් පාලනය කළහ. සියවස් පහක් පසුකරන විට එය බිඳ වැටුණි.

- උස්මානීය පාලනය යුරෝපයට අභියෝගයක් වූ බැවින් එය නැතිකර දැමීමට උපායයන් යොදා ගත්හ. විරුද්ධවාදීන්ව පාලන ප්‍රදේශ තුළට ඇතුල් කළහ. මොළයට අලුත් දේ ඇතුළු කරන ලද බොහෝ දෙනෙක් ව ඇති කළහ. සෑම රටකම ජාතිකත්වය ගැන කථා කරන්නන් ඇති කළහ. ඔවුන් ස්වදේශිකයින් මධ්‍යයෙහි දේශීයත්වය වැපිරූහ. ඊජිප්තුවෙහි මුහම්මද් අලි බාච්චා උස්මාන්වරුන්ට විරුද්ධව ක්‍රියා කළේය. හිජාසයේ ඉබ්නු ශුහුද් ක්‍රියා කළේය. මෙවේලේ සුල්තාන් දෙවන අබ්දුල් හමීද් කිලාෆතයේ ඒකීයභාවයට මහත් උත්සාහයක් ගත්තේය. එහෙත් ජය නොලද්දේ ය. ජමාලුද්දීන් අෆ්ගානි, මුහම්මද් අබ්දුහු, ජානිඋස් සමාන් නූර්සි වැනි නැණවතුන් කිලාෆතයේ බිඳවැටීම නතර කිරීමට ගත් උත්සාහයන් එල නොවීය. හමුදා නිලධාරියකු ලෙස ක්‍රියාකළ මුස්තෆා කමාල් 1924 හි දී තුර්කියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය හඳුන්වා දුන්නේ ය. නිල වශයෙන් කිලාෆතය අවසන් කළ බව ප්‍රකාශයට පත් කළේය. නව තුර්කිය ආගම්වාදී නොවන රජයක් ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ කළේය. මුස්තෆා කමාල් තුර්කි දේශයේ පියා අතාතුර්ක් ලෙස විරුදාවලි ලැබීය.

- අඩුපාඩු කිහිපයක් තිබුණ ද තුර්කි උස්මානීය පාලනය ඉස්ලාමය නියෝජනය කරමින් පැවතිණ. උස්මාන්වරුන්ගේ පිබිදීමට ඉස්ලාමයට ආධාරක ශක්තිය විය. ඔවුන්ව තුර්කි ජාතිකවාදීන් යැයි හංවඩු ගැසුව ද එවැනි ප්‍රවණතාවයක් දක්නට නොලැබිණි. ශතවර්ෂ හයක් පාලනය කළ ද ඔවුන් අරාබි බසම පාසල්වල මාධ්‍යය ලෙස පවත්වා ගත්හ. තුර්කි භාෂාව ග්‍රාමීය භාෂාවක් ලෙසට පැවතුණි. තුර්කි භාෂාවෙහි ව්‍යාකරණ, නීතිරීති ග්‍රන්ථයක් ඉදිරිපත් කළේ ජෝන්ටන් නමැති ප්‍රංශ ජාතිකයා ය. තුර්කි ජාතිකයින් තමන්ව මුස්ලිම්වරුන් ලෙස පමණක් හඳුන්වා ගත්හ. ඔට්ටමන්, තුර්කිවරුන් වැනි වචන භාවිතාකර වෙන් කර පෙන්වූයේ යුරෝපීය

ජාතිකයින් ය. එහි ආගමික ඉවසීම ද සුහද ආකල්පයන් ද වර්ධනය වෙමින් තිබිණ. අවාසනාවකට යුරෝපීයයන් විසින් ජාතිවාදය ප්‍රාදේශීය වාදය පොළඹවන ලදී.

- මුස්තෆා කමාල් පාලන බලය ලබාගැනීමේ සිට ඉස්ලාමීය සංකේත ක්‍රම ක්‍රමයෙන් නැති කිරීමට උත්සුක විය. තුර්කි තොප්පිය වෙනුවට යුරෝපීය තොප්පිය පළඳින ලෙස අණ කළේය. කාන්තාවන් මුහුණ ආවරණයකිරීම තහනම් කළේය. ආගමික ආයතන විසුරුවා හැරියේ ය. ඒවායෙහි දේපළ රාජසන්තක කළේය. අරාබි අක්ෂරවලින් තුර්කි භාෂාව ලතින් අක්ෂරවලට මාරු කළේය. නම් අරාබි බස හැර තුර්කි භාෂාවෙන් තබන ලෙස අණ කළේය. ඔහුගේ මරණයට පෙර ම ඔහුගේ පිළිම තබන ලදී. 1938 හි දී ඔහුගේ මරණයට පසුව ද ඔහුගේ පිළිම තනා ඇත.

- උස්මාන්වරුන්ගේ බිඳවැටීමත් සමඟම මුස්ලිම්වරුන්ට නායකත්වයක් නැතිව ගියේ ය. අරාබි භාෂාව බල රහිත විය. ඉස්ලාමීය නීතිය වෙනස් කරන ලදී. (උදා : බහු භාර්යා විවාහයට තහනම, දික්කසාදයේ දී පුරුෂයාට හා ස්ත්‍රියට සම තත්ත්වය, සිකුරාදා වෙනුවට සෙනසුරාදා හා ඉරිදා නිවාඩු දින) මුස්ලිම්වරුන්ගේ එකමුතුකම බිඳ වැටිණි. සියවස් ගණනක් ආරක්ෂිතව තිබූ කිලාෆත් පාලන ව්‍යූහය නැති ව ගියේ ය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.

පියවර 2 : පහත සඳහන් මාතෘකා යටතේ කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවීමට යොමු කරන්න.

(අ) මුස්ලිම්වරු ස්පාඤ්ඤය අත්පත් කරගත් වාතාවරණය හා එහි අවශ්‍යතාව

(ආ) මුස්ලිම්වරුන්ට ස්පාඤ්ඤය අහිමි වීමට හේතු

(ඉ) තුර්කි හා උස්මානීය පාලනයෙහි සේවා

(ඊ) උස්මානිවරුන්ගේ පිරිහීමෙන් ඇති වූ බලපෑම්

පියවර 3 : කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 4 : වැදගත් දෑ සටහන් කර ගැනීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**


1. ඉබ්රාහිම් සයියිද් (1962) අයිරෝප්පාවිල් ඉස්ලාම් (දෙමළ බසින්), චෙන්නයි, වලර්මදි ප්‍රකාශකයෝ.
2. ඉබ්රාහිම් සයියිද් (1962) තුරුක්කි (දෙමළ බසින්), චෙන්නයි, වලර්මදි ප්‍රකාශකයෝ
3. අබූබක්ර් ඒ. එම්. (1996) ඉස්ලාමීය වරලාරු කොටස 3 (දෙමළ බසින්) , සායින්දමරුදු , ඉස්ලාමීය පර්යේෂණ සංගමය

**නිපුණතාව 9.0 : උමයියා අබ්බාසිය පාලන කාල තුළ හා ඉන් පසු පැවති දේශපාලන, සමාජ අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රගතිය විවේචනාත්මක ව අවබෝධ කර ගනිමින් අගයයි.**

**නිපුණතා මට්ටම 9.4** : ඉන්දියාවේ ඉස්ලාමය හඳුන්වා දෙන ලද පසුබිම දැන විස්තර කරයි.

**කාලය** : කාලපරිච්ඡේද 15

**ඉගෙනුම් ඵල** :
- ඉන්දියානු සංස්කෘතියට ඉස්ලාමය ලබාදුන් දායකත්වය තේරුම් ගෙන දේශන පවත්වයි.
- ඉස්ලාමීය සමාජයෙහිලා ඉන්දියාවේ බලපෑම විවේචනාත්මක ව ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- අරාබිවරුන් තම අග්නිදිග ආසියානු මුහුදු මාර්ග හරහා තිබූ ව්‍යාපාර කටයුතු මගින් ඉන්දියාව ගැන දැන සිටියහ. අරාබිවරුන්ගේ කථන ව්‍යවහාරයේ ඉන්දියාව පිළිබඳ ව සඳහන් කිරීම සම්ප්‍රදායක් ලෙස පැවතිණි. ජාහිලියියා කාලයේ කවියෙකු වූ ඉම්රුල් කෙයිස් ඉන්දියාවෙහි ප්‍රචලිත කස්තුරි පිළිබඳ ව ගායනා කර ඇත්තේය. පානත් සුආද් ගායනා කළ කඃප් ඉබ්නු සුහෙර්, "නිශ්චය වශයෙන් ම අල්ලාහ්ගේ දූතයා ඉන්දියාවෙහි නිෂ්පාදනය කළ දිළිසෙන්නා වූ කඩුවක් වැන්නෙකු" යැයි වර්ණනා කර ඇත.
- එබැවින්, අරාබියෙහි ඉස්ලාමය හඳුන්වා දෙන ලද විගසම ඉන්දියාවෙහි ද හඳුන්වා දෙන ලදී. අරාබි වෙළෙඳුන් අග්නිදිග ආසියානු මුහුදු මාර්ගයේ වෙළෙඳාමෙහි දී ලංකාව හා ඉන්දියාවේ දකුණු මුහුදු තීර අධික ලෙස භාවිතා කළහ. දකුණු ඉන්දීය මුහුදුබට ප්‍රදේශවල අරාබිවරුන්ගේ සැරිසැරීම අධික ව සිදුවුණි. නබි (සල්) තුමාගේ මිතුරන් වූ තමීම් අල් අන්සාරි (රළි) තුමාගේ සොහොන් චෙන්නෙයි අසල පිහිටි කෝවනම්හි ද, උක්කාසා (රළි) තුමාගේ සොහොන පරංගිප්පේට්ටෙ හි ද දක්නට හැකි බව මස්ඌද් නද්වි පවසයි. මෙය නබි (සල්) තුමාගේ කාලයේ ම ඉස්ලාමය ප්‍රචාරය සඳහා සහාබාවරුන් ඉන්දියාවට පැමිණ ඇති බව ගෙනහැර දක්වයි.
- ආදම් කන්ද දැකීම සඳහා පැමිණි අරාබි මුස්ලිම්වරු ෂේරමාන් පෙරුමාන් නැමැති ඉන්දීය රජුව හමුවී ඉස්ලාමය පිළිබඳ දේශනා කළ විට ඔහු ඉස්ලාමය වැළඳගෙන අබ්දුර් රහ්මාන් යන නම ද තබා ගත්තේය. අරාබියට ගොස් ඉස්ලාමය ඉගෙන නැවත පැමිණෙන අතරමඟ දී මරණයට පත් විය. ඔහු සමඟ පැමිණියවුන් ක්‍රි.ව. 642 දී මස්ජිදයක් නිර්මාණය කළහ. ඔහු සමඟ පැමිණි මාලික් බින් දීනාර් කොඩුංගලූර්හි ද, මාලික් බින් හබීබ් කොල්ලම් යන ස්ථානයේ දී නැවතී ඉස්ලාමීය ප්‍රචාරයේ යෙදුණු බව සටහනක් දක්නට ලැබේ.
- හිජ්රි 93 හි දී (ක්‍රි.ව. 712) මුහම්මද් බින් කාසීම් සින්දු රාජ්‍යය ආක්‍රමණය කර එය අත්පත් කර ගත්ත ද, එයට වසර කිහිපයකට පෙර දකුණු ඉන්දියාවේ මුස්ලිම් ජනාවාස ඇති වී තිබුණි. හජ්ජාජ්ගේ සාහසිකකම් විඳදරාගත නොහැකි වූ හාෂිම්වරු ලංකාවේ පමණක් නොව ඉන්දියාවේ දකුණු මුහුදුබඩ ප්‍රදේශයේ කොංගන් හා කන්නියාකුමරි ප්‍රදේශවල ද පදිංචි වූ බව සාක්ෂි ඇත.
- එහෙත්, දේශපාලනමය වශයෙන් ඉන්දියාවෙහි මුස්ලිම් පාලනයෙහි හිසපෙවීම් හිජ්රි 93 (ක්‍රි.ව.712) හි දී ආරම්භ විය. ඉන්දියානු මුස්ලිම් පාලනය පහත සඳහන් ලෙස වර්ග කළ හැක.

1. උමෙයා හා අබ්බාසිය වංශ පාලනයෙහි කිලාෆතයේ එක් පළාතක් ලෙස තිබූ කාල වකවානුව (ක්‍රි.ව.712-856)
2. හබ්බාරිවරුන්ගේ ස්වාධීන පාලනය පැවති කාලය (ක්‍රි.ව.856-1026)
3. කස්නවිය හා කෝරිය යන කුඩා රාජ්‍යවල කොටස් ලෙස තිබූ කාලය (ක්‍රි.ව.1027-1206)
4. දිල්ලි සුල්තාන් රාජ්‍යයක් ලෙස පැවතිය කාලය (ක්‍රි.ව.1206-1526)
5. මෝගල් රජවරුන්ගේ කාලය (ක්‍රි.ව.1526-1761)

**දිල්ලි සුල්තාන් රාජ්‍යය (සුල්තාන්වරු 34)**

- මුහම්මද් බින් කාසිම් සින්දු රාජ්‍යය යටත් කරගත් පසුව, උමෙයා කලීෆා සුලෛමාන් ඔහුව නැවත කැඳවීය. ඒ වෙනුවට තවත් කෙනෙකු රාජකාරි ඉටු කළේය. දෙවන උමර්ගේ කාලයේ දී ආණ්ඩුකාරයා ලෙස පත්කළ අම්ර් බින් මුස්ලිම් අල් ලාහිරි සාමකාමී ලෙස දෑවා කටයුත ඉටු කළේය. උමෙයා හා අබ්බාසි කාලවල දී තවදුරටත් සින්දු ප්‍රදේශය මුස්ලිම්වරුන්ගේ පාලනය යටතේ පැවතිණි. පසුකාලීන ව ඇෆ්ගනිස්ථානයේ ඇති වූ කස්නවිය හා කෝරිය කුඩා රාජ්‍යවල පාලනය යටතට ඒවා පැමිණියේ ය. කෝරි මුහම්මද් රාජ පුත්‍රයින්ව ජයගෙන ආපසු එමින් සිටින විට ඝාතනයට ලක්විය. එම අවස්ථාවෙහි ඔහුගේ වහලෙකුව සිටි කුත්බුද්දීන් අයිබෙක් දිල්ලිය තම පාලනයට යටතට ගෙන ආවේය.

- දිල්ලිය අගනුවර කරගෙන පාලනය ගෙනගිය හෙයින් එය දිල්ලි සුල්තාන් රාජ්‍යය ලෙස නම් කෙරිණි. එහි,
  1. අයිබෙක් පරම්පරාව (ක්‍රි.ව.1206-1290)
  2. කිල්ජි පරම්පරාව (ක්‍රි.ව.1290-1321)
  3. දුක්ලක් පරම්පරාව (ක්‍රි.ව.1321-1412)
  4. සයියිද් පරම්පරාව (ක්‍රි.ව.1412-1447)
  5. ලෝඩිග් පරම්පරාව (1447 - 1526) යන පරම්පරා පහක් පාලනය කළහ.

- මොවුන්, තමන්ගේ කාලවකවානු තුළ දී දිල්ලි සුල්තාන් රාජ්‍යය ක්‍රම ක්‍රමයෙන් දකුණු ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කරමින් සිටියහ. මෙම අවස්ථාවේ මධ්‍යම ආසියාවේ බලය අහිමි වූ සහීරුද්දීන් මුහම්මද් බාබර්, ඉන්දියාව ආක්‍රමණය කර ඔහුට විරුද්ධ වූ ඉබ්රාහීම් ලෝඩි ව ජය ගත්තේය. මේ හේතුවෙන් මෝගල් පාලනය ඇති විය.

**මෝගල් පාලනය (1526-1857)**

- ඉන්දියාවේ මෝගල් පාලනය වකවානු දෙකකට බෙදිය හැක.
  1. පිබිදුනු කාලය ක්‍රි.ව.1526 - 1707 (හිජ්රි 932-1117)
  2. පරිහානි කාලය ක්‍රි.ව.1707-1761

- මෝගල් පාලනය ස්ථාපනය කළ සහීරුද්දීන් බාබර් (ක්‍රි.ව.1526-1530) තුර්කි ජාතික පියෙකුට හා මොංගෝලීය ජාතික මවකට දාව ඉපදුණු කෙනෙකි. තුර්කි භාෂාවෙන් බාබර් යන්න කොටියා සංකේතවත් කරයි. මොහු මුලින් සමර්කන්ද් හි පාලකයාව සිට එය ගිලිහී ගිය විට කාබුල් හි රජ විය. එවිට ඉබ්‍රාහිම් ලෝඩිගේ පාලනයට අකමැති වූ ඉන්දු මුස්ලිම් පාලකයින් මොහුව කැඳවූහ. ඉබ්‍රාහිම් ලෝඩි ව 1526 දී ඇති වූ පළමු පර්පෙට් යුද්ධයේ දී පරාජයට පත් කොට ඉන්දියාවේ පාලකයා විය. අඛණ්ඩව ඇති වූ යුද්ධ කිහිපයකින් ම ජය ලැබ දේශීය

ආධිපත්‍යය ව්‍යාප්ත කර ගත්තේය. බටහිර ඉන්දු සිට නැගෙනහිට බිහාර් දක්වා ද, උතුරේ හිමාලයේ සිට දකුණේ කුවාලියූර් දක්වා ද මෝගල් රාජ්‍යය ව්‍යාප්ත විය.

- බාබර් ආත්ම විශ්වාසය ඇති නායකයකු ලෙස ද, ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයෙකු ද, සංගීත කලාවට ඇල්මක් දැක්වූවෙක් ද ඉතිහාසඥයකු ද වූයේ ය. අයෝධ්‍යා හි මොහුගේ සෙන්පති ඉදිකළ මස්ජිදය බාබර් මස්ජිදය ලෙස හැඳින්වේ. බාබ් නාමා ඔහුගේ කාලයේ ඉතිහාසය ගෙන හැර දක්වයි. ඔහුගේ කාලයේ දී පර්සියානු බස ව්‍යාප්ත විය. තුර්කි භාෂාවෙන් නිර්මාණයක් ඇති විය. පාසල් ආරම්භ කරන ලදී.

- බාබර් මරණයට පත්වූ පසු ඔහුගේ පුත් හුමායුන් (ක්‍රි.ව.1530-1556) පදවි ප්‍රාප්තවිය. කුඩා කාලයේ ම අරාබි, පාර්සි හා තුර්කි භාෂා ඉගෙන ගත් අතරම වෙනත් කලාවන් කිහිපයක් ම හදාරා ප්‍රවීණ විය. මොහුගේ කාලයේ දී පිබිදුනු ෂේර්කාන් මොහුගේ ප්‍රදේශ අත්පත් කර ගත් නිසා හා සහෝදරවරුන්ගේ අතපෙවීම් නිසා කෙටි කාලයක් පසුබෑමට ලක් විය. ක්‍රි.ව.1555 දී නැවතත් තමන් ව බලවත් කර ගත්තේය. ගිලිහුණු ප්‍රදේශ නැවතත් අත්පත් කර ගැනීම ආරම්භ කළේය. වයස 50 දී අනතුරකට ලක් ව මරණයට පත් විය.

- ඔහුට පසු පුත්‍රයා වූ ජලාලුද්දීන් මුහම්මද් අක්බර් (ක්‍රි.ව.1556-1605) පදවි ප්‍රාප්ත විය. ඔහුට වයස අවුරුදු 13 ක බාලයකු වූ හෙයින් පෛරම් කාන් නැමැත්තෙකු පරිපාලන කටයුතු ඉටු කරමින් සිටියේය. බාලයකු නිසා බොහෝ දෙනෙකු පාලනය අල්ලා ගැනීමට උත්සාහ කළහ. 1556 දී ඇතිවී ෂනිපෙට් යුද්ධයේ දී විරුද්ධවාදීන් පරාජයට පත් කරන ලදී. ගිලිහී ගිය ප්‍රදේශයන් ක්‍රම ක්‍රමයෙන් අත්පත් කර ගත්තේය. ඔහුට ජයග්‍රහණය අත්කර දුන් නගරය පතහ්පූර් ශික්රි ලෙස නම් කර අගනගරය ද කර ගත්තේ ය. මොහුගේ පාලනයේ දී කාබුල්, ලාහූර්, මුල්තාන්, දිල්ලි, අග්‍රා, අවද්, අලහබාද්, අජ්මීර්, ගුජරාත්, මාල්වා, බීහාර්, බංගලාදේශය, කාන්දේෂ්, බිරාර්, අහ්මාද් නගර්, ඔරිසා, කාෂ්මීර් හා සින්දු යන පළාත් 18 දක්නට ලැබිණ.

- මොහු හින්දු මුස්ලිම් සාමය ඇතිකිරීම සඳහා නව ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළේය. අමාත්‍ය මණ්ඩලයට හින්දූන් ද එක් කළේය. රාජපුත්‍ර කාන්තාවන් ව විවාහ කර ගත්තේය. රාජ පුත්‍රයින්ව සෙන්පතිවරු ලෙස පත් කළේය. ජිස්යා බද්ද නැති කළේය. හින්දු, බෞද්ධ, සමන, යුදෙව්, පාර්සි හා ඉස්ලාම් ධර්මයන්ට සම්බන්ධ නැණවතුන්ට ක්‍රි.ව.1582 දී කැඳවා පොදු ආගමක් ඇති කරන ලෙස ඉල්ලීමක් කළේය. ඔවුන් සතුටුදායක පිළිතුරක් ලබා නොදුන් නිසා, දීනේ ඉලාහි යන ධර්මය තමන් ම ඇති කළේය. එබැවින් උලමාවරුන්ගේ හා අන් අයගේ ද විරුද්ධත්වයට පාත්‍ර විය. හින්දූන් සති පූජාව පැවැත්වීම තහනම් කළේය. ළමා විවාහය තහනම් කර වැන්දඹු විවාහය දිරි ගැන්වීය.

- අක්බර්ගේ මරණයින් පසු පුත්‍රයා වූ ජහාංගීර් (ක්‍රි.ව.1605-1627) පදවි ප්‍රාප්ත විය. මුතුන් මිත්තන්ගේ පාලනය ආරක්ෂා කිරීමේ උත්සාහයේ යෙදුණු ජහාංගීර් ප්‍රතිසංවිධානයන් රැසක් ම ඇති කළේය. මිනීමැරුම්, කොල්ලකෑම්, මංපැහැරීම් සිදුවන ස්ථානවල මස්ජිදයන් හා පොදු ළිං වැනි දෑ නිර්මාණය කර ජනයාගේ ගැවසීම වැඩි කළේය. රේගු බදු, ආනයන බදු, වැනි බදු තහනම් කරන ලදී. තනි පුද්ගලයින් සකාත් එකතු කිරීම ද, තහනම් කළේය. සංගීතයේ හා කලාවන් හි ඇල්මක් තිබූ මොහු, සියලු කලාකරුවන්වම පිළිගත්තේය. අලංකාර ගොඩනැගිලි ඉදි කළේය. චිත්‍ර ඇන්දේව්වේය. වර්ණ ගැන්වීමේ කලාවේ හා පර්සියානු භාෂාවෙහි නිපුණත්වයක් ලබා සිටියේය. උරුමක්කරුවන් නොමැතිව මරණයට පත්වන ධනවතුන්ගේ දේපළ රාජසන්තක කර, ප්‍රාදේශිය අධ්‍යාපන මධ්‍යස්ථානවල සංවර්ධනයට ඒවා යොදා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දුන්නේය. දිල්ලි, ජාමිආ මස්ජිදය ආසන්නයේ මද්රසාවක් නිර්මාණය කළේය.

- මොහුගේ කාලයේ දී රෙදිපිළි කර්මාන්තය, ලෝහ කර්මාන්තය, නැව් බැඳීම, හම් පදම් කිරීම, කඩදාසි හා සීනි කර්මාන්තශාලා ඇති කළේය. ග්‍රාමීය කර්මාන්තවලට ද දිරි දෙන ලදී. කාර්කාන් නැමැති කර්මාන්තශාලාවල තෑගි භාණ්ඩ නිෂ්පාදනය කරන ලදී. ඒවා පිටරටවලට ද අපනයනය කරන ලදී. දකුණු අප්‍රිකාව, මැද පෙරදිග, බුරුමය, මැලේසියාව හා ජාවා වැනි රටවල් සමඟ ආනයන අපනයන වෙළෙඳ සබඳතා පැවතිණි.

- මොහුගේ කාලයේ දී ඉන්දියාවට ඉංග්‍රීසින් පැමිණියහ. ඔවුන්ට වාණිජ මධ්‍යස්ථාන ඇති කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. ඔවුන් ක්‍රම ක්‍රමයෙන් දේශපාලන පරිපාලනයෙහි ද අතපෙවීම ආරම්භ කළහ.

- ජහංගිර්ට පසුව ඔහුගේ පුත් ෂාජහාන් (ක්‍රි.ව.1627-1657) පාලනයට පත් විය. තම පෙම් භාර්යාව වෙනුවෙන් තජ්මහල නිර්මාණය කළේ ඔහුය. යමුනා ගඟ අසබඩ අග්‍රා හි එය නිර්මාණය විය. රටෙහි නොයෙක් ප්‍රදේශවල සිට හා පිටරට සිට ද ගෘහ නිර්මාණ ශිල්පීන් කැඳවන ලදී. වර්ණවත් ගල් ද, කිරිගරුඬ ද ආනයනය කරන ලදී, වසර 20 ක් රෑ දහවල් මහන්සි වී එම ගොඩනැගිල්ල ඉදිකරන ලදී. එහි දොරෙහි හා පිටත බිත්තිවල ද ඉන්දියානු හා විදේශීය මැණික් ඔබ්බවන ලදී. අමානත් කාන් නැමැති පර්සියානු චිත්‍ර ශිල්පියා විසින් අල්කුර්ආන් වාක්‍ය බිත්තිවල ලියන ලදී. ඉන්දියාවෙහි ව්‍යාපාර කටයුතු කළ ඉංග්‍රීසීන් හා පෘතුගීසීන් යුද්ධ කළහ. කෝපයට පත් කලීෆා ඔවුන්ට විරුද්ධව හමුදා මෙහෙයවීය. ඔවුන් සමාව ඉල්ලූහ. මොහුගේ කාලයේ දී රටෙහි සාමය පැවතිණි. ආදායම වර්ධනය විය. ආර්ථිකය ඉහළ තලයකට වර්ධනය විය. බදු බරක් නොමැතිවම ජනයා පාලනය වූහ. ඔහුගේ කාලයේ පුත්‍රයා වූ තාරා ෂෙයිකෝ භාෂා තුනකම (අරාබි, පාර්සි හා සංස්කෘත) පඬිවරයෙක් විය. හින්දු හා ඉස්ලාම් ආගම් සම්බන්ධ කර මජ්මඋල් බහ්රෙන් නැමැති ග්‍රන්ථය ලිව්වේය. අගනුවර අග්‍රා සිට වෙනස් කිරීමට සිතා ඉතා අධික වියදමක් දරා ෂාජහානාබාද් නගරය නිර්මාණය කළේය. මෙය අද නව දිල්ලිය වෙයි. ඉන්දියාවෙහි ඉතා විශාල වූ ජුම්ආ මස්ජිදය ද මොහුගේ කාලයේ දී බඳින ලදී.

- මොහුට පසුව ඖරංකෂීබ් (ක්‍රි.ව.1658-1707) පාලකයා විය. පදවිප්‍රාප්ත වූ දින පටන් සටන් කළයුතු තත්ත්වයකට මොහුට බල කෙරුණි. පළමු වසර 25 අක්බර්ගේ යෝජනාවෙන් ඇති කරන ලද වෙනස්කම් නිවැරදි කිරීමේ කාලය ලෙස ගත කළේය. ඉතිරි වසර 25 කලහ මෙල්ල කිරීමේ කාලය ලෙස ගත කළේය.

- මුලින් ම අක්බර් ඇති කළ දීනේ ඉලාහි ය තහනම් කළේය. ඉන්දියාව දාරුල් ඉස්ලාම් ලෙස ප්‍රකාශයට පත් කළේය. ඉන්දියාවෙහි මුස්ලිම් පාලනය ස්ථාපනය අමාරු වූ කරුණක් වුව ද ඔහු එම උත්සාහයෙහි නියුතු විය. ඔහු හින්දූන්ට විරුද්ධ වූයේ නැත. මත ගැටුම් වැළැක්වීම සඳහා යම් වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කළේය. කෝවිල් හා සම්බන්ධව මස්ජිදයන් නිර්මාණය වැලැක්වීය. සංගීතය හා මද්‍යසාරය භාවිතය ප්‍රසිද්ධියේම තහනම් කළේය. බාහිනි පාලනය ජයගත් විට තමන්ට අනතුරක් වේ යැයි මරාටිවරු බිය වූහ. ඔවුනගේ කැරැල්ල මෙල්ල කිරීම සඳහා නායකත්වය දුන් සිවාජි ව අත්අඩංගුවට ගත්තේය. ඔහු බේරී පලාගොස් ඖරංකෂීබ් හින්දූන්ගේ විරුද්ධවාදියා යැයි ප්‍රචාරය කළේය. සති පූජා චාරිත්‍රය තහනම් කිරීම මගින් රාජපුත්‍රයින් කැරලි ගැසූහ. තක්කනම් (ඩෙකෑන් ප්‍රදේශය) ජයගැනීම නිසා මහාරාෂ්ඨ ජනයා කලබල ඇති කළහ.

- මොහුගේ පාලනය කාබුල් සිට චිතගොං දක්වා ද හිමාලයේ සිට කාවේරි දක්වා ද පැතිරී තිබිණි. ඖරංකෂීබ් ඉතා ලස්සන අත් අකුරු ඇත්තෙකු වූයේය. ඔහු විසින් ම ලියන ලද අල්කුර්ආන් පිටපත් විකිණීම මගින් තම ජීවිකාව ගෙන ගියේය. පැතිරුණු අධිරාජ්‍යයක් පාලනය කළ ඔහු

සරල ජීවිතයක් ගත කළේය. මොහු විසින් ම පාර්සි භාෂාවෙන් ඔහුගේ ම අත්අකුරින් ලියන ලද ලිපි රාක්කත් ඉ ආලම්කීරි ලෙස හැඳින්වේ. මොහුගේ කාල වකවානුවේ සංස්කරණය කළ නීති සංග්‍රහය පතාවා ආලම්කීරි ලෙස හැඳින්වේ. මුස්ලිම් ඉතිහාසඥයින් මොහුගේ කාලය ප්‍රශංසා කරති.

- තමාට පසුව කවුරුන් විසින් පාලනය කළයුතු දැයි ඔහු අන්තිම කැමැති පත්‍රයක් ලියා තැබුව ද ඔහුගේ දරුවන් එය ඉෂ්ඨ කළේ නැත. 1707 දී බදුර්ෂා, 1712 දී මුහම්මද් ෂා, හා 1713 දී ෆාරුක් ෂා ලෙස කෙනෙකුට පසුව තව කෙනෙකු පාලනය කළ ද පෙර වූ කීර්තිය ලබාගත නොහැකි විය. 1739 දී ඉරානයේ නාදිර් ෂා දිල්ලිය ආක්‍රමණය කළේය. මුහුණදීමට නොහැකි වූ මෝගල් පාලකයන් සමාදාන වූහ. එහෙත්, ඉරාන ආක්‍රමණ දිගින් දිගටම සිදුවිය. අවසානයේ දී 1761 දී සිදු වූ පනිපෙට් යුද්ධයත් සමඟ මෝගල් පාලනය අවසන් විය.

- බාබර් හා ඔහුගේ සංහතිය වසර 325 ක් පමණ ඉන්දියාව පාලනය කළහ. ඔවුනගේ කාලයේ දී ෆාර්සි භාෂාව රාජ්‍ය භාෂාව විය. අධ්‍යාපන කටයුතු ද එම භාෂාවෙන් ම සිදුවිය. මුලින් සංස්කෘත භාෂාව ලැබ තිබූ ස්ථානය පාර්සි භාෂාව ලබා ගත්තේය. එබැවින් හින්දූන් ද මෙම භාෂාව ඉගෙන ගත්හ. සමහරුන් සංස්කෘත පොත්පත් ෆාර්සි භාෂාවට පරිවර්තනය කළහ. පොදුවේ අනෙකුත් භාෂා ද ව්‍යවහාරයේ පැවතිණ.

- ආරම්භ අධ්‍යාපනය මක්තබ්වල හා මද්රසාවල දී ලබාදෙන ලදී. මස්ජිදවල උසස් අධ්‍යාපනය ලබාදෙන ලදී. උසස් අධ්‍යාපනය සඳහා පාසල් ද තිබිණි. සින්දු, ලාහූර් හා දිල්ලි ප්‍රදේශවල ප්‍රසිද්ධ මද්රසා දක්නට ලැබිණ. අග්‍රාව උසස් අධ්‍යාපනය ලබාදෙන නගරය ලෙස පැවතිණි.

- බාබර් හා ඔහුගේ පුත් හුමායුන් සාහිත්‍යයට ලැදි වූහ. පර්සියානු, තුර්කි හා අරාබි භාෂාවල නිපුණත්වයක් ලැබ සිටියහ. හුමායුන් දිල්ලි හි පාසලක් හා පුස්තකාලයක් ස්ථාපනය කළේය. දිල්ලි, අලහබාද්, අහ්මදාබාද්, සූරත්, ඖරංගබාද් වැනි ස්ථානවල පෞද්ගලික පාසල් ද ස්ථාපනය කර තිබුණි. අක්බර්ගේ කාලයේ දී සියලුම භාෂාවලින් යුත් පොත්පත් 24000 සහිත පුස්තකාලයක් අරඹන ලදී. මෝගල්වරුන් අරාබි ජාතිකයින් නොවුණ ද අරාබි භාෂාවෙන් පොත්පත් ප්‍රකාශයට පත් විය. අල්බිරූනි නැමැති විද්වතා ඉන්දීය ඉතිහාසය පළමු වතාවට පර්යේෂණාත්මක ව ලියූ කිතාබුල් හින්ද් යන පොත අරාබි භාෂාවෙන් ම ලියන ලදී. තක්කනම් (ඩෙකෑන් ප්‍රදේශයේ) හි පිටරට සිට ගෙන්වා ගත් විද්වතුන් ගුරුවරුන් ලෙස සිටි අරාබි විදුහල් දක්නට ලැබිණි. එදා සංස්කෘත හා හින්දි භාෂා ද පෝෂණය විය.

- මෝගල් පාලන කාලය ඉන්දියාව කලා ආකෘතියක් ලෙස ගෙනහැර දැක්වීය. සෑම පාලකයෙක් ම කුමක් හෝ සෞන්දර්ය කලාවකට ඇල්මක් ඇත්තෙකු හෝ දක්ෂතා ඇත්තෙකු ලෙස දක්නට ලැබිණි. අග්‍රා, ගතන්පූර්, නව දිල්ලිය යන නගරවල කලාවන් පිරී ඉතිරී තිබිණ. ඉරාන සංගීතය හා ඉන්දීය සංගීතය එක් වී නව රාගයන් ඇති විය. පර්සියානු හා චීන චිත්‍ර කලාවන් ඉන්දීය චිත්‍ර කලාව හා එක් ව පරිණාමය විය. අක්බර් ස්වභාවික දර්ශන තමාම නිර්මාණය කළේය. කාබූල්, මල් උයන්, නෂීම් මල් උයන්, නිෂාද් මල් උයන්, වෙරිනා මල් උයන් ලෙස අලංකෘත හා පැතිරුණු මල් උයන් බොහෝමයක් ඇති කරන ලදී. මෝගල්වරු උයන් ඇතිකර නගරය නැමැති කයට හරිත වර්ණ පට රෙදි ඇන්දවූහ. අග්‍රා, දිල්ලි වැනි නගර අලංකාර ගොඩනැගිලිවලින් පිරී තිබිණ. සෑම පාලකයෙකුම තමාව මතකයේ රැඳෙන අයුරු ගොඩනැගිලි නිර්මාණය කළහ. රතුකොටුව, කුතුබ් මිනාර්, තාජ්මහාල්, දිල්ලි ජාමිආ මස්ජිද් වැනි ගොඩනැගිලි මෝගල් ගෘහ නිර්මාණ ශිල්පයේ සංකේත ලෙස දර්ශනය වේ.

- ඉන්දියාව සැලකුවහොත් උතුරු ඉන්දියාවෙහි ආක්‍රමණ මගින් ද, දකුණු ඉන්දියාවෙහි අරාබි වෙළෙඳ සම්බන්ධතා මගින් ද ඉස්ලාමය පැතිරුණි. ඉන්දියාවෙහි ඉස්ලාමය පැතිරීමට පාලකයින්ට වඩා සූෆිවරුන්ගේ උත්සාහයන් පළමු තැන ගනී. මොවුන්ගෙන් හාජා මුඊනුද්දීන් ජිස්ති (රහ්) (ක්‍රි.ව.12 වනසියවස) ශ්‍රේෂ්ඨය. මොහු ලාහූර්, දිල්ලි හා අජ්මීර් ප්‍රදේශවල ඉස්ලාමීය ප්‍රචාරයේ යෙදුණේය. සුල්තානුල් හින්ද් ලෙස ඔහුව ප්‍රශංසා කෙරුණි. ඊට අමතරව ෂෙයික් නිසාමුද්දීන් දිල්ලිය කේන්ද්‍ර කොටගෙන දඃවාවෙහි නිරත විය. ඔහුගේ ගෝලයින් ගුජරාත් හි හා බෙංගාලයේ ප්‍රචාරක කටයුතුවල නිරත වූහ. දකුණු ඉන්දියාවෙහි ද ඉස්ලාමයෙහි ව්‍යාප්තියට සූෆිවරුන්ගේ සේවාවන් හේතු වූ බව ප්‍රතික්ෂේප කළ නොහැක.

- ඉස්ලාමය හා වයඹ දිග ප්‍රදේශවලින් පැමිණි ආක්‍රමණිකයින් ඉන්දියාවෙහි ඇති කළ බලපෑම අතිමහත් ය. එය හින්දු සමාජයෙහි මුල්බැස තිබූ ජාතිවාදය, පහත් යැයි සම්මත කුලවල අය, වෙන්කර තැබීමේ සිරිත වැන්නෙහි හානිකර ප්‍රතිඵලයන් ජනයාට ඒත්තු ගැන්වීය. හින්දු සමාජයෙහි කිසිම සමාජයීය වරප්‍රසාදයක් නොමැතිව ජීවත් වූ ජනයාට ඉස්ලාමීය සහෝදරත්ව න්‍යාය ඉමහත් ලෙස සිත් ගත්තේය. මෙලෙස ජවහර්ලාල් නේරු තම Discovery of India යන ග්‍රන්ථයෙහි සඳහන් කරයි.

- ඉන්දියාවෙහි ආසන්න වශයෙන් සියවස් 8 ක් පමණ මුස්ලිම් පාලනය පැවතිය ද පාලකයින්ගෙන් ඉස්ලාමය පිළිබිඹු නොවීම ද, අරාබිවරුන්ගේ සම්බන්ධය (පැමිණියවුන් අජම්වරු) නොමැතිවී යාම මුස්ලිම් රාජ්‍යයක් ලෙස දිගටම පවත්වා ගැනීමට නොහැකි විය. ගැමි ප්‍රදේශය, පාලන බලය හා වස්තුව යන්න පමණක් පාලකයාගේ අරමුණ විය. මෙලෙස මස්ඌද් නද්වි සඳහන් කරයි.

- ඉන්දියාවට මුස්ලිම්වරු දායාද කළ ප්‍රධානම දෙය ඒකත්ව චින්තනය වේ. ඒ හරහා එය ඉදිරිපත් කළ සමානාත්මක සහෝදරත්ව චින්තනය කුල භේද චින්තනය කුල හීන කළේය.

- එබැවින් මුස්ලිම්වරුන්,
  * ඉන්දියාව එක් රාජ්‍යයක් යටතේ පාලනයට මඟ පෙන්වූහ.
  * බ්‍රාහ්මණයන්ගේ සම්ප්‍රදායයන් නැති කිරීමට උත්සාහ ගත්හ.
  * උරුදු භාෂාව ඇති වීමට හේතු වීම.
  * මෝගල් කලාව ලෙස කලාවක් හඳුන්වා දීම.
  * ඉන්දියානු සංස්කෘතියෙහි ඉස්ලාමීය හැදියාව ඇතුල් කිරීම.
  * පාකිස්ථානය, බංගලාදේශය හා කාෂ්මීරය වැනි රටවල් හා අති විශාල ඉන්දීය මුස්ලිම් පරම්පරාවක් ඇති කිරීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : ඉන්දියාවේ ඉස්ලාම් පිවිසි පසුබිම කෙටියෙන් දක්වන්න.

පියවර 2 : සිසුන් කණ්ඩායම් හතරකට බෙදා ඉගෙනුම් ද්‍රව්‍ය බෙදා දෙන්න.

පියවර 3 : පහත මාතෘකා යටතේ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීමට යොමු කරන්න.

(අ) ඉන්දියාවේ ඉස්ලාම් පිවිසි කාල වකවානුව හා පසුබිම

(ආ) ඉන්දියාවේ මුස්ලිම් පාලනය - මෝගල්වරුන්ගේ පරිහානිය දක්වා

(ඉ) ඉන්දියාවේ මුස්ලිම්වරුන්ගේ ජාතික මට්ටමේ දායකත්ව

(ඊ) ඉන්දීය මුස්ලිම්වරුන්ගේ හා ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ සංස්කෘති යා වීම

පියවර 4 : කණ්ඩායම් වාර්තා පන්තියේ ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

පියවර 5 : වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**


1. ඉබ්රාහිම් සෙයියිද් (1962) ඉන්දියාවිල් ඉස්ලාම් I, II (දෙමළ බසින්), චෙන්නයි, වලර්මදි ප්‍රකාශනය
2. ඉබ්රාහිම් සෙයියිද් (1961) ඉන්දියාවිල් මුස්ලිම් ආට්චි (දෙමළ බසින්), චෙන්නයි. වලර්මදි ප්‍රකාශනය.

**නිපුණතාව 10.0 : ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ පසුබිම හඳුනාගෙන මෙරට සංස්කෘතිය මුස්ලිම්වරුන්ගේ බලපෑම හඳුනාගෙන ඔවුන්ගේ දායකත්වය පහදා දෙයි.**

**නිපුණතා මට්ටම 10.1 :** ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ආකාරය හඳුනාගෙන පවසයි.

**කාලය :** කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල :**

- අරාබි වෙළෙන්දන් රටවල් ඇල්ලීමේ ආශාවෙන් නොව යහපත් වෙළෙඳ සම්බන්ධතාවය රැකීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි බව වටහා ගනියි.
- ශ්‍රී ලංකාව හා අරාබිය අතර සම්බන්ධතාවය ඉතිහාසගත පුරාණ සම්බන්ධතාවයක් බව වටහා ගනියි.
- මේ බන්දුතාවය නිසා කුමන ආකාරයේ ඵලයන් ඇතිවූවා දැයි දැන පවසයි.
- කුමන කාල වකවානුවේ දී ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුනා දෙනු ලැබුවේ ද යන්න ගණනය කර දැන ගනියි.
- මුස්ලිම්වරුන්ගේ මුල් කාලීන ජනපද ගැන දැනගනියි.
- සිංහල රජවරුන්ගේ කාලයේ ද, යුරෝපීයයන්ගේ කාලයේ ද, නිදහසෙන් පසුව ද, අප රටේ මුස්ලිව්වරු තම සංස්කෘතිය හා අනන්‍යතාවය රැකගත්තේ කෙසේ ද යන්න දැනගනියි.

## විෂය කරුණු පැහැදිළි කිරීමට අත්වැලක්

- ශ්‍රී ලංකාව හා අරාබිය අතර පැවති බන්දුතාව
- අරාබිවරු ලංකාවට පැමිණීමට හේතුව
- අරාබිවරුන්ගේ වෙළෙඳ මාර්ගයේ අතර මැද ශ්‍රී ලංකාව පිහිටා තිබීම
- ඔවුනට අවශ්‍ය වෙළෙඳ භාණ්ඩ ශ්‍රී ලංකාවේ සුලභවීම
- වෙළෙඳ සුළංවල යහපත් භාවය සහ නැව් අලුත්වැඩියා කර ගැනීමට වරායන් සුදුසු තැන් හි පැවැතීම.
- ආදම්ගේ කන්ද (සමනල කන්ද) වන්දනාමාන කිරීමට ඔවුන් තුළ පැවති ආශාව
- පර්සියානුවන් සමඟ පැවති අරාබිවරුන්ගේ දීර්ඝකාලීන මුහුදු මාර්ග වෙළෙඳ සම්බන්ධතාව නිසා ගිනිකොණ දිග ආසියානු රටවලට ගමන් කිරීමට හැකි වීම.
- පර්සියානුවරුන්ගේ පිරිහීමෙන් පසු (ක්‍රි.ව. 4 වන ශතවර්ෂයේ) අරාබිවරු නිතරඟයෙන් මුහුදු වෙළඳාමේ යෙදුනහ. ඒ අතර ඔවුන් අග්නිදිග ආසියානු රටවලට හා ශ්‍රී ලංකාවට ද පැමිණියහ.
- අප රටේ නිෂ්පාදනවලට විදේශයන් හි වෙළෙඳ අවස්ථාවන් ලබාදුන් ඔවුන් දේශීය අවශ්‍යතා සපුරාලීමට හැකි ආකාරයේ භාණ්ඩ සැපයූහ.
- මෙරැටියන් සමඟ සුහදව ඇසුරු කරමින් යහපත් සම්බන්ධතාවයක් ඇති කරගත් ඔවුන්ට මෙරට ස්ත්‍රීන් විවාහ කර ගත්හ.

- අප රටේ වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූ අරාබිවරු නැව් අලුත්වැඩියා කිරීම ආනයන අපනයන වෙළඳාමේ යෙදීම වැනි කාර්යවල ද යෙදුනහ.
- මෝසම් සුළං තම ගමනට වාසිදායක වනතෙක් මෙරට රැඳී සිටි කාලවල ස්වදේශීය ජනයා සමඟ තම සුහදත්වය වැඩිදියුණු ගරගත්හ.

**ඉස්ලාමය හඳුන්වා දෙනු ලැබීම**

- චීන රටේ රජතුමාට ඉස්ලාම් පිළිබඳ පණිවිඩ ගෙනගිය වහබ් බින් අබී හබ්සා යන නබි සහාබිවරයා ශ්‍රී ලංකාවේ රජතුමාට ද ඉස්ලාම් පිළිබඳ පණිවිඩය ගෙන ආවේය.
- දකුණු ඉන්දියාවේ කෝවලම් හි හා පරංගන් කෝට්ටෙට නබි සහාබිවරුන් වන තමීම් අන්සාරි සහ අක්කාසා වැනි අයගේ සොහොන් පිහිටයි.
- ඉබ්නු ෂහ්රයාර් යන ඉතිහාසඥයා අජාඉබුල් හින්ද් යන තම ග්‍රන්ථයේ අරාබියේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ තොරතුර දැනගත් ශ්‍රී ලංකාවේ රජතුමා ඒ පිළිබඳ ව දැනගැනීම සඳහා දූත කණ්ඩායමක් අරාබියට යවා තැබීය. දූතයින් කලීෆා උමර් (රළි) තුමන්ගේ කාලයේ මදීනාවට ගියහ. ඔවුන් තොරතුරු පිළිබඳ සත්‍යය දැනගෙන පැමිණියහ යැයි සඳහන් කරන සිද්ධිය ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ ආකාරය දැන ගැනීමට උදව් කරන්නේ ය.
- වෙළඳාම සඳහා පැමිණි අරාබිවරු වරාය අවට නගරවල පදිංචි වූහ. ඔවුන් ස්වදේශීය කාන්තාවන් විවාහ කර ගත්හ.
- ශ්‍රී ලංකාවට පැමිණි අරාබි වෙළෙඳුන්ගේ අවංක හා යහපත් ගතිගුණ ශ්‍රී ලංකාවේ ඉස්ලාම් පැතිරීමට හේතු විය.
- මෙසේ ශ්‍රී ලංකාවේ ඉස්ලාම් සමාජයක් බිහිවිය.
- අරාබි පිරිමින් හා කාන්තාවන්ගෙන් යුත් පවුල් ද ශ්‍රී ලංකාවේ පදිංචි ව සිටියහ.
- ඉන්දියාව මුස්ලිම්වරු විසින් යටපත් කිරීමට හේතු වූ සිද්ධියෙන් ද අරාබි පවුල් ශ්‍රී ලංකාවේ විසූ බව පෙන්වා දෙයි.
- උමෙයා කලීෆාවරු වන කලීෆා අබ්දුල් මලික් (686-705) වලීද් (705-715) යන අයගේ කාලවල දී ආණ්ඩුකාර හජ්ජාජ්ගේ තාඩන පීඩනවලට බිය වූ සමහර හාෂිමීන්වරු ශ්‍රී ලංකාවට පැමිණ පදිංචි වූ බව පැවසෙන පරම්පරානුගත තොරතුර අලක්සන්ඩර් ජෝස්ටන් විසින් සඳහන් කෙරේ.
- කිලාපත් කාලවල දී ඉස්ලාම් ප්‍රචාරය කිරීම සඳහා දේශකවරු යවා තබන ලදී.
- අබ්බාසිය කලීෆාවරයා වූ හාරූන් රෂීද් විසින් එවන ලද කාලිද් බින් බකායාගේ සොහොන් ගලක් කොළඹ දී හඳුනා ගන්නා ලදී.

**ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සංස්කෘතිය**

- ඉස්ලාම් බිහි වූ කාලයේ පටන් ම ශ්‍රී ලංකාවේ ද ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබ, වර්ධනය වූ නිසා ශ්‍රී ලංකාවේ ප්‍රධාන හා වෙරළබඩ නගරවල මුස්ලිම් ජනපද බිහි වී තිබුණි.
- මෙසේ ජනපද බිහි වූ කාලයේ පටන් ම ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු තම සංස්කෘතික දායාදයන් රැකගෙන ජීවත් වූහ.
- ඔවුන් තමන් පදිංචි වූ ප්‍රදේශවල මස්ජිද ඉදිකර, තම ආගමික වගකීම් ඉටු කරන එසේම තම පවුල්, සමාජයේ හා වෙළඳාම පදනම් කරගත් කටයුතු ඉස්ලාමීය නීතිරීත්වලට පටහැනි නොවන අයුරින් සකස් කර ගත්හ.

- එම නිසා මුස්ලිම් ජනපදවල ප්‍රදේශික පදනමින් සමාජය විස්තීර්ණ විය.
- මුස්ලිම්වරු තම සංස්කෘතිය හා අනන්‍යතාවය රැකගෙන ජීවත් වූ අතර, ස්වදේශීය ජනතාව සමඟ හිතවත් බවක් හා සුහදතාවයක් රැකගත්හ.
- මේ නිසා සිංහල පාලකයන්ගේ අනුග්‍රහය හා සහයෝගය මුස්ලිම්වරුනට ලැබුණි. රටේ රාජ්‍ය කටයුතුවල ද ආනයන අපනයන වෙළඳාමෙහි ද මුස්ලිම්වරු ප්‍රධාන දායකත්වයක් දැරූහ.
- යුරෝපීයයන්ගේ පැමිණීමෙන් පසු වෙරළබඩ පෙදෙස්වල ජීවත් වීමේ අයිතිය අහිමි වූ නිසා රටේ අභ්‍යන්තර ප්‍රදේශවල හා මහනුවර රජුගේ පාලන ප්‍රදේශවල පමණක් ජීවත් වූහ.
- මෙම වකවානුවේ දී පෘතුගීසින් හා ලන්දේසින් විසින් මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික මධ්‍යස්ථානයක්ව පැවති මස්ජිද හා මද්‍රසා, ඒවා ඔවුන් විසින් කඩාබිඳ දමන ලදී. ඔවුන් මුස්ලිම්වරුන්ගේ වෙළෙඳ කටයුතුවලට විවිධ ආකාරයේ තහංචි පනවමින් බාධා කළහ.
- මෙම තත්ත්වය ශතවර්ෂ 3 ක් එනම් වුරුදු 300ක් පමණ කාලයක් පැවැතුණි. ඒ නිසා මුස්ලිම් සමාජයේ සංස්කෘතික පාරම්පරික වර්ධනයට බාධා පැමිණියේ ය.
- පසුව පැමිණි ඉංග්‍රීසින්ගේ ලිහිල් ප්‍රතිපත්ති නිසා මුස්ලිම්වරු නැවතත් වෙරළබඩ පෙදෙස්වල පදිංචි වූහ.
- මේ නිසා රටේ අනෙකුත් ජාතීන් සමඟ එක් ව රටේ නිදහසට සටන් කිරීමේ අවස්ථාව ලැබූහ.
- රට නිදහස ලැබූ පසු ජාතික රජයට සහයෝගය දක්වමින් සිය අනන්‍යතාවය රැකගැනීම සඳහා සහන හා අවස්ථා ලදහ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 - ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ පසුබිම සැකෙවින් පවසන්න.

පියවර 2 - තොරතුරු ගොනු කිරීමට යොමු කරන්න.

පියවර 3 - පහත මාතෘකාව යටතේ විවාදයක් පවත්වන්න.
ශ්‍රී ලංකාවට ඉස්ලාම් පැමිණියේ අරාබියාවෙන් ද ඉන්දියාවෙන් ද

පියවර 4 - විවාදයේ ඉදිරිපත් වූ කරුණු ඌන පූරණය කරන්න.

පියවර 5 - ප්‍රධාන අදහස් ගොනුකර ලිවීමට යොමු කරන්න.

**අමතර කියවීම සඳහා**


1. ශ්‍රී ලංකාවේ ඉස්ලාම් - ඉස්ලාම් මොඩියුල 219314, ඉස්ලාම් ගුරු අධ්‍යාපන පාඨමාලාව, ජාතික අධ්‍යාපන ආයතනය.
2. අමීන් එම්. අයි. එම්.(2008) මුස්ලිම්වරු වර්ධනය කළ විද්‍යාත්මක, සෞන්දර්ය කලාවන්, හෙම්මාතගම, අල්හසනාත් ප්‍රකාශනය
3. අමීන් ඒ. එම්. ඒ. (2002) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා සංස්කෘතිය, හෙම්මාතගම, අල්හසනාත් ප්‍රකාශනය

**නිපුණතාව 10.0 : ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබූ පසුබිම හඳුනාගෙන මෙරට සංස්කෘතිය මුස්ලිම්වරුන්ගේ බලපෑම හඳුනාගෙන ඔවුන්ගේ දායකත්වය පහදා දෙයි.**

**නිපුණතා මට්ටම 10.2 :** ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් රට ජාතියට කළ දායකත්වය හඳුනාගෙන විස්තර කරයි.

**කාලය :** කාල පරිච්ඡේද 20

**ඉගෙනුම් ඵල :**
- ශ්‍රී ලාංකීය මුස්ලිම්වරු ස්වදේශීය වැසියන් බවත්, ඔවුන් පිටින් පැමිණි අය නොවන බවත් වටහාගෙන ප්‍රකාශ කරයි.
- නිදහසට පෙර හා පසු ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ ජාතික දායකත්වය හඳුනාගෙන ලියා දක්වයි.
- දකුණු ඉන්දියානු මුස්ලිම්වරුන්ගේ සම්බන්ධතා නිසා ඇති වූ දායකත්වය ගෙන හැර දක්වමින් කතා පවත්වයි.

## විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

### ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ ජාතික දායකත්වය

- අරාබි වෙළෙඳුන්ගේ පරම්පරාවෙන් පැවත එන බව සැලකෙන ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් ඔවුන් මෙහි පැමිණ පදිංචි වූ දා පටන් මෙම රටෙහි දේශපාලනයෙහි නොයෙක් පරිමාණයන්ගෙන් තම දායකත්වයන් ලබා දී ඇති බව දැකගත හැකි ය.
- ක්‍රි.ව. 12 වැනි සියවසට අයත් අරාබි දේශ ගවේෂකයෙක්, සිංහල රජ කෙනෙකු යටතේ මුස්ලිම් අමාත්‍යවරුන් සිවුදෙනෙකු සේවය කළැයි යන තොරතුරු ලබා දෙයි.
- ආරම්භ කාල මුස්ලිමුන්, මෙම රටෙහි මුස්ලිම් නොවන්නන් අතර ඇති වූ ආරවුල් සමථයකට පත් කරන්නන් ලෙසත්, වාණිජ කටයුතු සම්බන්ධයෙන් රජුන්ට උපදෙස් ලබා දෙන්නන් ලෙසත් ක්‍රියා කර ඇත.
- දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හානි ඇති වූ විට දේශීය ආනයන අපනයන වෙළඳාම ශක්තිමත් කිරීම සඳහා ලංකාවේ රජු මුස්ලිම් දූත පිරිස් පිටරටවලට ද යවා ඇත.
- විදේශීය ව්‍යාපාරික කටයුතුවල මුස්ලිමුන්ට තිබූ මෙවැනි බලපුළුවන්කාරකම් පෘතුගීසීන් පවා තැති ගැන්වීමට සමත් විය.
- පෘතුගීසීන් ව එළවා දැමීම සඳහා මායාදුන්නේ රජු කල්ලික්කෝට්ටේ රජුගෙන් හමුදාමය උදව් ලබා ගැනීම සඳහා මුස්ලිම්වරුන්ව පිටත් කර හරින ලදී.
- පෘතුගීසීන්ට විරුද්ධව ලන්දේසීන්ගේ උදව් ලබාගැනීම සඳහා නුවර රජු මුස්ලිම්වරුන්ව පිටත් කර හැරියේ ය.
- පෘතුගීසීන්ට එරෙහිව ක්‍රියා කිරීම සඳහා මුස්ලිම්වරුන්ගේ දායකත්වය වෙනුවෙන් නුවර රජු රාජසිංහ කෘතගුණ සැලකීම සඳහා අකුරණ ප්‍රදේශයේ පදිංචි කළහ.
- නුවර රජවරුන්ගේ දූතයින් ලෙස ද මුස්ලිම්වරු සේවය කර ඇත.

- ලන්දේසීන් පළවා හැරීම සඳහා (කර්ණාටක) නාවක නාවප් මුහම්මදලි වෙත උස්මාන් ලෙබ්බේ මෞලා මුහන්දිරම් නැමැත්තෙක් ව නුවර රජු දූතයෙකු ලෙස යැවීය.

- ඉංග්‍රීසින්ගේ ස්වාධීන වූ ප්‍රතිපත්තීන් මුස්ලිම්වරුන්ව දේශීය දේශපාලනයෙහි තවදුරටත් සම්බන්ධවීමට සැලසීය.

- 1833 දී හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක රාජ්‍ය සභාවෙහි 1839 පටන් මුස්ලිම්වරුන් ද සාමාජිකත්වය දැරූහ.

- 1865 දී හඳුන්වා දුන් මහනගර හා පළාත් පාලන සභාවල ද මුස්ලිම්වරුන්ට සහභාගීවීමට අවස්ථාව ලැබිණි.

- 1919 දී ජාතික කොංග්‍රසය ඇති කළ විට එහි එක් උප නායකයකු ලෙස තරුණ උපාධිධාරී ටී.බී.ජායා පත් වූ අතර මුස්ලිම්වරුන් ද නිදහස් අරගලයට සහභාගී වූහ.

- ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා පත් කරන ලද ඩොනමෝර්, සෝල්බරි කමිටුවලට ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනා මුස්ලිම්වරුන් ඉදිරිපත් කළහ.

- සෙනෙට් සභාවට පත්වන මුස්ලිම් සාමාජිකයින් තිදෙනාවම ආණ්ඩුකරවරයා විසින් පත් කළ යුතුය යන්නට විරුද්ධව, උගත් පැලැන්තියේ සමහරුන් එම තිදෙනා ම පොදු ජනයා විසින් තෝරාගත යුතු ය යන ඉල්ලීම කළ විට, එම ඉල්ලීම ආණ්ඩුකාරයා විසින් පිළිගත් නිසා ශ්‍රී ලංකාව පුරාම ඡන්දයක් පවත්වන ලදී.

- මෙම ඡන්දයේ දී මුහම්මද් මාක්කාන් මාකාර්, එන්. එච්. එම් අබ්දුල් කාදර් හා ටී. බී. ජායා යන තිදෙනා 1924 හි තේරී පත් වූහ.

- තමන්ට ස්වාධීනත්වය ලබාදෙන බව දී තිබූ පොරොන්දුව ඉටුකරන ලෙස රාජ්‍ය සභාව දෙවන ලෝක යුද්ධයට පසුව ඉල්ලීම් ඉදිරිපත් කළ විට මෙම මුස්ලිම් ජාතිකයින් තිදෙනා කිසිදු කොන්දේසියක් ඉදිරිපත් නොකර එයට සහයෝගය ලබා දුන්හ.

**දකුණු ඉන්දියානු හා ශ්‍රී ලාංකීය මුස්ලිම් සම්බන්ධය**

- ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් හා දකුණු ඉන්දියාව අතර සම්බන්ධය ඇතිවීමට නොයෙකුත් හේතු පිහිට වූ බව දක්නට හැකි ය.

- වෙළෙඳ කටයුතු සඳහා අග්නිදිග ආසියානු රටවලට ගිය අරාබි වෙළෙන්දන් ඉන්දියාවේ හා ලංකාවේ තම ජනාවාස ඇති කර තිබීම.

- භූගෝලීය වශයෙන් රටවල් දෙකම අසල්වාසි රටවල් ලෙස පැවතීම.

- දකුණු ඉන්දියානු මුස්ලිම්වරුන් වෙළෙඳ කටයුතු සඳහා හා වෙනත් හේතූන් නිසා ලංකාවෙහි පදිංචි ව ජීවත් වීම.

- ශ්‍රී ලංකාව 1505 දී අත්පත් කරගත් පෘතුගීසීන්, ඒ දක්වා අරාබිය හා ලංකාව අතර පැවැති සම්බන්ධතාවයට බාධක යෙදීම.

- මෙම තත්ත්වය ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ අධ්‍යාත්මික ක්ෂේත්‍රයෙහි අති මහත් බලපෑම් ඇති කළ අතර අධ්‍යාත්මික දියුණුව සැලකිල්ලට ගෙන ඉන්දීය මුස්ලිම්වරුන්ට තම අධ්‍යාත්මික මඟපෙන්වන්නන් ලෙස සැලකීම.

- මෙම කාලවකවානුවේ දී ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ මස්ජිදවල කතීබ්වරුන් ලෙස සේවය කිරීම සඳහා හා මස්ජිද හෝ මද්රසාවල හෝ සේවය කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් ආලිම්වරුන් ගෙන්වා ගැනීම.
- රටවල් දෙකෙහිම ජනයාගේ මව්බස දෙමළ වීම හා දෙරටෙහිම මුස්ලිම්වරුන්ගේ අධ්‍යාත්මික චින්තනය ලබාදෙන්නා වූ මාධ්‍යය ලෙස අරාබි දෙමළ පැවතීම.
- මෙම කාලවකවානුවේ දී ආගමික පොත්පත් බහුතරය අරාබි දෙමළින් දකුණු ඉන්දියාවෙහි ප්‍රකාශයට පත් කළ බැවින් අප රටෙහි මුස්ලිම්වරුන් ආගමික පොත්පත්, සඟරා හා අනෙකුත් කෘතීන් සඳහා දකුණු ඉන්දියාව බලාපොරොත්තු වීම.
- රටවල් දෙකෙහිම ජනයා අතර ඇති වූ විවාහ සම්බන්ධතා
- පෘතුගීසීන්ගේ පැමිණීමට පෙර ද දකුණු ඉන්දියානුවන් සමඟ සම්බන්ධතා පැවතුණ ද එම සම්බන්ධතාවය පෘතුගීසීන්ට පසුව තවදුරටත් ශක්තිමත් වීම.
- ස්පාඤ්ඤ මුස්ලිම් පාලනය විනාශ කිරීමත් සමඟම ලංකාවට පැමිණි පෘතුගීසීන් ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ව ද හතුරන් ලෙස සැලකූ නිසා ඔවුනගේ දියුණුව වැළැක්වීම සඳහා ඔවුනට හැකි සියළුම උපායයන් යෙදූහ.
- මේ මගින් ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනය හා ආර්ථිකය බිඳ දැමීමෙහි යොමු වූ පෘතුගීසීන්, මෙහි මුල් අදියර ලෙස ආගමික හා වෙළෙඳ කටයුතු සඳහා අරාබීන් ලංකාවට පැමිණීම තහනම් කළ අතර මෙහි සිටින්නන් අරාබියට ගොස් නැවත පැමිණීමට ද සීමා පැනවූහ.
- මෙම අවස්ථාවෙහි දී ආගමික චින්තනයන් හෝ අරක්ෂාකර ගත යුතුය යන අපේක්ෂාවෙන් දකුණු ඉන්දියානුවන් සමඟ සබඳතා තබාගත් බැවින් එහි ගොස් අධ්‍යාපනය ලැබීමට ආරම්භ කළාසේ ම එහි සිටම අධ්‍යාපනය ලබා දීමට හා ආගම් ප්‍රචාරයට ආලිම්වරුන් මෙහි පැමිණියහ.
- මෙම ද්විපාර්ශ්වික සබඳතාවයන් ශ්‍රී ලාංකීය මුස්ලිම් සමාජයෙහි ආගමික ශිෂ්ටාචාර හා සංස්කෘතික අංශයන් හි නොයෙකුත් බලපෑම් ඇති කළේය.
- මෙම බලපෑම් එක් පසකින් හිතකර ප්‍රතිඵල ඇති කළා සේ ම අනෙක් පසින් අහිතකර බලපෑම් ද ඇති කිරීමට හේතු වූවා නොවේ.

**ඵල**

- දකුණු ඉන්දීය සංස්කෘතික බලපෑම හේතුවෙන් අපේ සංස්කෘතික සාම්ප්‍රදායයන්ට සක්‍රිය කිරීමේ සමහර කටයුතු සඳහා ඉන්දීය වෙළෙන්දන් හා විද්වතුන් සහාය වී ඇත. විශේෂයෙන්, ඉන්දියාවෙහි සුප්‍රසිද්ධ අරාබි මද්රසාවල ශ්‍රී ලාංකීය සිසුන්ට ඉගෙනීමට අවස්ථාව ලබාදීම, ප්‍රධාන නගරවල මස්ජිද පිහිටුවීම.
- දකුණු ඉන්දියාවෙන් අප රටට පැමිණි ආගමික ප්‍රචාරකයින් රටෙහි නොයෙකුත් ප්‍රදේශවල මස්ජිදයන්, මද්රසාවන්, කුර්ආන් මද්රසා නොහොත් මක්තබයන් හා තරීකා මධ්‍යස්ථානයන් වැනි දෑ ස්ථාපනය කළහ. උදා : වැලිගම මාප්පිල්ලෙ ලෙබ්බෙ ආලිම් ස්ථාපනය කළ මද්රසතුල් බාරි
- ආගමික පදනමක් ඇති සාහිත්‍යයන් මුස්ලිම් සමාජයෙහි හඳුන්වා දෙන ලදී. මස්අලාවන්, මුනාජාතයන් හා කිස්සාවන් වැනි දෑ මේ හා සම්බන්ධ ව සඳහන් කළ හැකිය. මේවා හේතුවෙන් අරාබි දෙමළ වර්ධනය විය. කුත්බාවන් අරාබි දෙමළින් ලියා කියවන ලදී.

- මෙම පසුබිමෙහි ඉස්ලාමීය දෙමළ සාහිත්‍යය ද ඇතිවීම ආරම්භ වූ අතර ෂරීආ හා සම්බන්ධ කරුණු විස්තර කරන්නා වූ පොත් ද ලියන ලදී.

- ඉන්දියානු එනම් දකුණු ඉන්දියානු ගෘහනිර්මාණ ශිල්ප සම්ප්‍රදායයන් ලාංකීය මුස්ලිම් ගෘහ නිර්මාණවල බලපෑම් ඇති කළේය.

- රටවල් දෙකෙහි ජනයා අතර සිදු කරගත් විවාහ සම්බන්ධතා නිසා සමාජයීය සම්බන්ධතා ශක්තිමත් වූ අතර ඒ දක්වා පැවති පරම්පරා චාරිත්‍රය ඉවත දමන ලදී.

- දකුණු ඉන්දීය මුස්ලිම්වරුන් හා ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් අතර ඇති වූ වෙළෙඳ සබඳතා නිසා දේශීය ආර්ථිකය වර්ධනය වීමට විය.

- දකුණු ඉන්දියානු පරිසරයේ ජීවත් වූ මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික, සාම්ප්‍රදායික අංශ ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් කෙරෙහි ද පිවිසීම.

- නම් තැබීම, මල්වර වීම, විවාහය, මරණය ආදී සිද්ධිවල දී අරාබියෙහි දක්නට නොලැබූ විවිධ වත්පිළිවෙත් බිහිවුණි.

- ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් අතර කුර්ආන් මද්රසාවන් නොතිබීම හේතුවෙන් ඒවා පවත්වාගෙන යාම සඳහා ඉන්දියාවෙන් ලෙබ්බේවරුන් පැමිණියහ. ඔවුන් අතර සුදුසුකම් ඇති හා සුදුසුකම් නැති අය ද වූහ.

- අරාබිවරුන් හා තිබූ සබඳතා බිඳවැටුණු නිසා, මෙම අවස්ථාවේ දකුණු ඉන්දියාවෙන් ලැබුණු ආගමික චින්තනයන්, ප්‍රදේශ බද්ධ දකුණු ඉන්දියාවට අදාළ චින්තන ලෙස පැවැතුණි.

- මෙම කාලයේ දී ලැබුණු ආගමික ග්‍රන්ථ සැලකිය සමහර සුවිශේෂ කතුවරුන්ගේ හා එම ග්‍රන්ථ ප්‍රකාශයට පත් කළ මද්රසාවල චින්තනයන් හා අදහස් අඩංගු වූ ඒවා ලෙස දක්නට ලැබිණ.

- රටෙහි නොයෙකුත් ප්‍රදේශවල සුෆීවාද චින්තන සඳහා වූ සංවිධාන ඇති විය.

- කාලයත් සමඟම අරාබි භාෂාවෙහි වැදගත්කම හීන වී යෑම කණගාටුවට කරුණක් විය.

**මුස්ලිම් පුද්ගලික නීතිය නිර්වචනය**

- යම් රටක ආගමික, සංස්කෘතික හා ප්‍රාදේශීය පදනමින් ජීවත් වන්නා වූ එම ප්‍රදේශයටම ආවේණික වූ කණ්ඩායම්වල ආවේණිකත්වය රැකෙන අයුරින් ඔවුන් පිළිපදින්නා වූ ඔවුන්ටම අයත් වූ නීති රීති, ක්‍රියාදාමයන් හා චාරිත්‍රයන් යන්න ඔවුනටම උරුම කරන්නා වූ නීති, පුද්ගලික නීතිය ලෙස හැඳින්වේ.

- බහු වාර්ගික ජනකොටස් ඇත්තා වූ අප රටෙහි ක්‍රියාත්මක වන්නා වූ පුද්ගලික නීතීන් :

  1. උඩරට නීතිය
     මෙය උඩරට සිංහලයින්ට පමණක් වූ පුද්ගලික නීතියයි.
  2. ශ්‍රී ලාංකීය දෙමළ ජනයාගේ නීති සංග්‍රහය (දේශ වලමෙම නීතිය)
     මෙය යාපනයේ දමිළ ජනයාට පමණක් අයත් වන්නා වූ (මඩකලපු දමිළයින්ට මෙය අදාළ නොවේ)
  3. මුස්ලිම් පුද්ගලික නීතිය
     මෙය පුද්ගලික නීතියක් වුව ද, ඉස්ලාමයේ සියළු නීති රීතීන් අඩංගු වන්නා වූ නීති සංග්‍රහයක් නොවේ.

- මුස්ලිම් පුද්ගලික නීතියෙහි අඩංගු කරුණු :

  මෙය කොටස් දෙකකින් සමන්විත වේ.

  1. පුද්ගලික නීතිය (Personal law) මේ යටතේ අඩංගුවන කරුණු :
     * විවාහය හා බහු භාර්යා විවාහය
     * දික්කසාදය
     * නඩත්තුව
     * ප්‍රතිඵල - බලාපොරොත්තු නොවන (දෙන ලද දෙයට) ත්‍යාගයන්
     * වැඩිවියට පත්වීම/මල්වර වීම
     * දරුකමට හදාගැනීමට ගැනීම හෝ දරුකමට හදාගැනීමට දීම
     * දරුවන්ගේ ආරක්ෂාව
     * විවාහ වීමට තහනම් වූ අය
     * මහර් හා දෑවැද්ද
  2. දේපළ පිළිබඳ නීතිය (Law of Property) මෙම කොටසෙහි පහත විෂයයන් අඩංගු වේ.
     * අන්තිම කැමති පත්‍ර නොලියන ලද දේපළවල උරුම අයිතිය : අන්තිම කැමැති පත්‍රයක් නොලියා මරණයට පත්වන්නෙකුගේ මද්හබ් නීතියට අනුව උරුමකරුවන්ට දේපළ ලැබෙනු ඇත.
     * උපතින් ලද උරුම අයිතිය
     * උරුමයෙහි ආකාරයන් (වර්ගයන්)
     * වක්ෆු නොහොත් භාරකාරීත්ව වගකීම් ලබාදීම

**වක්ෆු නීතිය**

මර්හූම් ඒ. එම්. ඒ. අසීස්ගේ උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස 1956 දී වක්ෆු නීතිය ලංකාවෙහි හඳුන්වා දෙන ලදී.

වක්ෆ් හි ආකාරයන් (වර්ගයන්)

1. දුප්පත්කම දුරලීම සඳහා කරනු ලබන වක්ෆ්
2. පොදුවේ ඉස්ලාමයේ වර්ධනය (ව්‍යාප්තිය) සඳහා කරනු ලබන වක්ෆ්
3. මස්ජිදයන් ක්‍රමානුකූල කිරීම සඳහා කරනු ලබන වක්ෆ්
4. පුණ්‍ය චේතනාවෙන් කරන වක්ෆ්

මෙලෙස මුස්ලිම් පුද්ගලික නීතියෙන් එකඟ වූ/අනුමත කරන ලද සියල්ල මෙම කොටසට අඩංගු වේ.

**වක්ෆ් නීතියෙහි අරමුණු :**

1. මස්ජිදයන් හා වක්ෆ් දේපළ ලියාපදිංචිය
2. භාරකාරීත්ව වගකීම් නඩත්තු කරන්නන්ගේ වගකීම් සීමා කිරීම.
3. ජමාඅත් සාමාජිකයින් මගින් තෝරාගනු ලබන භාරකාරීත්වයන් වක්ෆ් සභාවෙහි ලියාපදිංචිය.
4. මුස්ලිම් භාරකාරීත්ව අරමුදලක් ඇති කිරීම.
5. කොමසාරිස්ව පත්කිරීම හා සාමාජිකයින් හත් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කිරීම.

6. 1982 වසරෙහි සංශෝධිත නීතියට අනුව මස්ජිදයනට අමතර ව දර්ගාවන් ද ලියාපදිංචිය
7. ලියාපදිංචි කරන ලද සෑම ආයතනයක් ම අරමුදල් ඇති කිරීමට දායකත්වය ලබා දීම.

**පුද්ගලික නීතිය ක්‍රියාත්මක කරන්නා වූ ආයතන**

1. ක්වාසි අධිකරණ : නීති සේවා කොමිසම මගින් ක්වාසිවරුන් පත් කරනු ලබයි.

   ක්වාසිවරුන්ගේ බලතල :

   * මහ්ර්‍ය ලබා දීම
   * ජීවන වියදම වැඩිකිරීම හෝ වැඩිකර දීම
   * දික්කසාද කිරීම සඳහා උපකාර කිරීම
   * දෑවැද්ද නැවත ලබා ගැනීමට උපකාර කිරීම
   * අවශ්‍යතාව නිමිතිකොට ගෙන වලී ලෙස ක්‍රියාකිරීම
   * අපක්ෂපාතී ව මැදිහත් වීම (බේරුම් කිරීම)

2. ක්වාසිවරුන්ගේ සභාව

   * ක්වාසි කෙනෙකුගේ තීරණය කෙරෙහි සෑහීමකට පත්විය නොහැකි කෙනෙකුට දින 10 ක් ඇතුළත මෙම සභාවට අභියාචනා ඉදිරිපත් කළ හැක.
   * මෙහි සාමාජිකයින් පස්දෙනෙකු සිටිති.

   යම් විනිශ්චයක් ලබා දෙන විට අඩුම තරමින් සාමාජිකයින් තිදෙනෙක් හෝ සිටිය යුතුය.

3. අභියාචනාධිකරණය
4. සුප්‍රිම් උසාවිය/ශ්‍රේෂ්ඨාධිකරණය
   අභියාචනාධිකරණ තීන්දුවෙන් සෑහීමකට පත් නොවූවන්ට මෙම උසාවියෙහි නඩු ගොනුකළ හැකිය.
5. වක්ෆ් සභාව
   7 දෙනෙකු සාමාජිකයින් ලෙස සිටිති.

   * මෙහි ගන්නා ලද තීරණවලින් සෑහීමකට පත් නොවන්නේ නම් වක්ෆ් නීති සභාවට දින 30 ක් ඇතුළත අභියාචනා ඉදිරිපත් කළ හැක.
   * වක්ෆ් සභාව තෝරා පත්කිරීම නීති සේවා කොමිසම මගින් කෙරෙනු ඇත.
   * භාරකරුවන් පත්කිරීම, ඔවුන්ව ඉවත් කිරීම, ඔවුන්ව අත්හිටුවීම, ඔවුන් ඉදිරිපත් කරන ගණන් හිලව් සෝදිසි කිරීම, වක්ෆ් සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම

- මුස්ලිම් පුද්ගලික නීතියෙහි ඉතිහාසය

  මෙය මාතෘකා තුනක් යටතේ සැලකිය හැකි ය.

1. සිංහල රජවරුන්ගේ කාලය

   * ඉස්ලාමයේ පහළවීමට පෙර සිටම අරාබිවරුන් අප රට සමඟ සබඳතා පැවැත්වූහ.
   * ඉස්ලාමයේ පහළවීමට පසුව අරාබි මුස්ලිම් වෙළෙඳුන් ලෙස පැමිණි අරාබියානුවන් ලංකාවෙහි ඉස්ලාමය හඳුන්වා දුන්හ.
   * ස්වදේශිකයින් සමඟ කුළුපග ව ආශ්‍රය කළ මුස්ලිම්වරුන්ට සිංහල රජවරුන්ගේ සහයෝගය ද ලැබිණි.

* රජවරුන්ගේ උපදේශකයින් ලෙසත්, වෛද්‍යවරුන් ලෙසත්, විදේශීය වෙළෙඳාම් සඳහා වගකිවයුත්තන් ලෙසත් මුස්ලිම්වරුන් පත් කළහ.
* ව්‍යාපාරික කටයුතු හා හජ් වෙනුවෙන් අරාබියට ගොස් පැමිණි ඔවුන්, එහි ඔවුන් ඉගෙන ගත් දෙය ලංකාවෙහි ද හඳුන්වා දුන්හ.
* ෂරීඅතය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමයන් ද ඇති කළහ.
* මෙලෙස ෂරීඅතය ඉදිරිපත් කළවුන්ගෙන් අබ්දුර් රහ්මාන් බින් අබී හාෂිම් සෙයිලානි නැමැත්තා සුවිශේෂී ය.
* මොහු ඉස්ලාමීය නීති දෙමළ බසින් ලියා ප්‍රකාශයට පත් කළ විට එයට කිසිවෙකුත් බාධා ඇති නොකළෝය.

2. පෘතුගීසි හා ලන්දේසි කාලය
   * පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟම ඒ දක්වා ලංකාව හා අරාබිය අතර පැවති සම්බන්ධතා බිඳ වැටුණි.
   * ඔවුන්ගේ තර්ජනවලට බිය වී මුස්ලිම්වරුන් පසෙකට වී ජීවත් වූහ.
   * පසුව පැමිණි ලන්දේසීන් ද තම ආගම ප්‍රචාරය කිරීමෙහි වේගවත් බවක් නොවූ බැවින් මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන මට්ටම අඩු වී බොහෝ ක්ෂේත්‍රවල පසුගාමී වූහ.
   * ලන්දේසි ආණ්ඩුකාර විල්ලියම් ෆෝක් (1765-1783) ලංකාවට නීති මාලාවක් හඳුන්වා දුන් විට, මෙහි සිටි මුස්ලිම්වරුන්ට විශේෂ වූ නීති සම්පාදනයට මඟ පෑදීය.
   * මෙයට මුස්ලිම්වරුන් සහයෝගය දීමට බිය වූ හෙයින් බදාවියාහි සිටි මුස්ලිම්වරු පිළිපැද්ද නීති සංග්‍රහයම ගෙන්වා ලංකාවට හඳුන්වා දුන්නේ ය.

     මෙහි කොටස් දෙකකි.

     1. උරුම අයිති නීතිය
     2. විවාහ හා දික්කසාද සම්බන්ධ නීතිය

3. ඉංග්‍රීසින්ගේ කාලය (1796-1948)
   * මොවුන් ලන්දේසීන් හඳුන්වා දුන් නීතීන් ක්‍රියාත්මක කළ ද එහි මාතෘකාව පමණක් මුහම්මදිවරුන්ගේ නැතහොත් යෝනකයින් සම්බන්ධ වූ සුවිශේෂී නීතීන් ලෙස වෙනස් කළහ.
   * 1806 හි දී අග්‍රවිනිශ්චයකාර ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් එකල ආණ්ඩුකාරවරයාට ඉදිරිපත් කළ පුද්ගලික නීතිය හා සම්බන්ධ යම් සංශෝධන ද සහිත නීති සංග්‍රහය ක්‍රියාත්මක වීම ඇරඹිනි.
   * මෙය මුල දී නුවර රජුගේ පාලනයට යටත් මුස්ලිම්වරුන්ට පමණක් යැයි පැවතිනි. පසුව මුළු මුස්ලිම් සමාජයට බලපැවැත්විණි.
   * මෙම කාලයේ දී මෙම නීති සංග්‍රහයෙන් පිටතට ගොස් විනිශ්චයන් ලබා දිය හැකියැයි ගාලු දිස්ත්‍රික් නීතිඥ ගිල්මන් විනිශ්චයක් ලබා දුන් නිසා ඒ සම්බන්ධව නොයෙකුත් විමර්ශනයන් පැනනැඟුණි.
   * මෙම වාතාවරණය නිසා, පුද්ගලික නීතිය ක්‍රියාවට නැංවීමට මුස්ලිම්වරුන්ට පූර්ණ බලතල ලබාදිය හැකි නීතියක් සම්පාදනය කළයුතු බව යෝජනාව එන්. එච්. අබ්දුල් කාදර් ගෙන ආවේය.

1. විවාහ හා දික්කසාද සම්බන්ධ නීතිය
2. මෙම දෙකම ලියාපදිංචි විය යුතුයි යන නීතිය

* මෙම කාලයේ දී ඊට පෙර වූ මුහම්මදිවරුන්ගේ නීතිය යන්නෙහි වූ මුහම්මදිවරුන්ගේ යන වචනය ඉවත් කර ඉස්ලාමීය නීතිය ලෙස හඳුන්වා දෙන ලදී.
* 1939 දී මෙම නීතිය ද වෙනස්විය යුතුය යන ඉල්ලීමට එකඟ ව, රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමාගේ සභාපතිත්වය යටතේ පත්කළ කමිටුවක් 1951 හි දී 13 වන අංකය දරණ නව නීති සංශෝධනයක් හඳුන්වා දෙන ලදී.
* මෙම කමිටුවෙහි එම්. ඩී. අක්බර්, ටී.බී. ජායා හා සම්සුදීන් වැන්නන් සාමාජිකත්වය දැරූහ.
* 1954 දී ක්‍රියාවට නැංවුණු මෙම නීතිය අද වනතුරු භාවිතයේ පවතී.

**ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ ප්‍රබෝධයෙහි/පුනර්ජීවනයෙහි පුරෝගාමීන්**

- සිංහල රජවරුන්ගේ කාලයේ දී ලංකාවෙහි දේශපාලන හා ආර්ථික කටයුතුවලට දායකත්වයක් දුන් මුස්ලිම්වරු යුරෝපීයයන්ගේ කාලයේ දී මෙම රටෙහි අන් ජන කොටස් බලපෑමට ලක් වූ ආකාරයට ම මහත් බලපෑමකට ලක්වූහ.
- එබැවින් මුස්ලිම්වරුන් අරාබි ලොව හා තිබූ වෙළෙඳ, ආර්ථික, අධ්‍යාපන හා සංස්කෘතික සම්බන්ධතාවලට ද බලපෑම් ඇති වූවා පමණක් නොව අධ්‍යාපන වර්ධනයටද බාධා විය.
- යුරෝපයේ නව පරිසරයට සරිලන සේ අන් සමූහයන් තමන්ව වෙනස් කරගෙන දියුණු වූ ආකාරයට මුස්ලිම්වරුන්ට නොහැකි විය.
- යුරෝපීයයින්ගේ කාලයේ දී ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ට ආගමික අධ්‍යාපනය ලබා ගැනීමට තිබූ අවස්ථාව නැති වී ගියේ ය.
- ඉස්ලාමයේ මූලික සංකල්පයන් පවා හරියාකාර ව තේරුම් ගැනීමට නොහැකි වූවන් ලෙස ඔවුන් සිටියහ.
- ආගමික ක්ෂේත්‍රයෙහි දැනීම හා හැකියාව තිබූ බුද්ධිමතුන් එම කාලයේ දී නොසිටියහ.
- මුස්ලිම්වරුන්ගේ සියළුම ක්ෂේත්‍රවල විශේෂයෙන් ම ජාතික සංවර්ධනයට මෙය බාධකයක් වූ හෙයින් සමාජීය හා දේශීය අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන මෙම ජනයා ප්‍රබෝධමත් කරවීමේ අවශ්‍යතාවය හා උවමනාවක් 19 වන සියවසෙහි අවසන් සමයේ දී ඇති විය.
- මෙම කාල වකවානුවේ දී අනෙකුත් සමූහවල ජාතික වර්ධනය යන්නෙන් ආගමික ප්‍රතිසංවිධානයට හා සමාජයීය ප්‍රබෝධයට යොමුවීම් සිදුවිය.
- මෙම කාලයේ විසූ අප මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය ද මෙම ලක්ෂණයම ගෙන තිබුණි.
- අනගාරික ධර්මපාල හා ආරුමුග නාවලර් වැන්නවුන් තම තමනගේ සමාජයේ පිබිදීම වෙනුවෙන් උත්සාහ ගත්තා සේ ම මෙම කාලයේ ජීවත් වූ සිද්දි ලෙබ්බෙ, මාප්පිල්ලෙ ලෙබ්බෙ ආලිම්, අයි.එල්.එම්. අබ්දුල් අසීස් හා ටී. බී. ජායා වැනි මුස්ලිම් ප්‍රභූන් තම සමූහයාගේ දේශීය, සමාජයීය, අධ්‍යාපන හා ආගමික ප්‍රතිසංවිධානයට මහන්සි වූහ.

● එම්. සී. සිද්දිලෙබ්බෙ

* ක්‍රි.ව.1838 වසර නුවර දී උපත ලැබීය.

* ශ්‍රී ලංකාවෙහි මුල් මුස්ලිම් නීතීඥවරයා ලෙස සැලකෙන මොහුගේ පියා වූ මුහම්මදු ලෙබ්බෙ සිද්දි ලෙබ්බෙ මොහුට දෙන ලද නම මුහම්මදු කාසිම් යන්නයි.

* සිද්දි ලෙබ්බෙගේ පියාට දරුවන් පස්දෙනෙකු සිටියහ. මෙම පස්දෙනාම අරාබි භාෂාව ඉගෙනගත් අය වූහ. වැඩිමහල් සොහොයුරු ආලිම් කෙනෙකු ලෙස ද ක්වාසි කෙනෙකු ලෙස ද සිටියේ ය.

* මුහම්මදු ලෙබ්බෙ වූ මොහුගෙන් සිද්දි ලෙබ්බෙ දෙමළ, සිංහල හා අරාබි යන දෑ ඉගෙන ගත්තේය.

* අරුල් වාක්කි අබ්දුල් කාදර්ගෙන් දෙමළ සාහිත්‍යය හැදෑරූ මොහු කසාවත්ත ආලිම් අප්පාගෙන් අවශ්‍ය වූ දැනුම ලබාගත්තේ ය.

* නුවර තිබූ ජනාල් පාසලට ඇතුළු වී ඉංග්‍රීසි ඉගෙන ගත්තේ ය.

* 1871 දී නුවර ජීවත් වූ ඉන්දියානුවකු වූ අබ්දුල් කාදර් නැමැත්තාගේ දියණිය වූ සෙයියිද් උම්මා නැමැත්තියව සිද්දි ලෙබ්බෙ විවාහ කර ගත්තේ ය. බිරිඳ ද මොහුට දෙවැනි වූයේ නැත.

* කුර්ආනය කියවා අවසන් කර සිටි ඇය, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ඉගෙන ගෙන සිටි අතර සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව ද ලැබ සිටියාය.

* කුර්ආනය සමඟ නවීන අධ්‍යාපනය ද මැය ලැබ සිටි නිසා සැමියාගේ චින්තන විලාසය හා ගැලපී යාමට ඇයට හැකි විය.

* 1862 හි දී නීතීඥයකු ලෙස පත් කරන ලද සිද්දි ලෙබ්බෙ ක්‍රි.ව. 1874-78 කාලවකවානුව තුළ මුනිසිපල් උසාවියෙහි විනිශ්චයකරු ලෙස සේවය කළේය.

* නීතීඥ පදවියෙහි තෘප්තිමත් නොවූ ඔහු, සමාජ සුබසිද්ධිය තකා සේවය කිරීමේ අදිටනින් 1884 දී කොළඹට පැමිණ පදිංචි විය. කොළඹ ජනයාගේ පිළිගැනීමත් සමඟම විරුද්ධත්වයන් ද තිබුණි.

* සමාජ සේවාවෙහි කැමැත්ත දැක්වූ ඔහු, තමාම මිලයට ගත් මුද්‍රණ යන්ත්‍රයක් මගින් සමාජයීය ප්‍රතිසංවිධාන අදහස් ප්‍රකාශයට පත්කිරීම සඳහා මුස්ලිම් නේෂන් නැමැති පුවත්පත 1882 දී ආරම්භ කළේය.

* ඥානදීපම්, අස්රාරුල් ආලම් හා සුරතුස් සලාත් වැනි දාර්ශනික පොත් ද, අසන්බේ ඉතිහාසය, ග්‍රීක හා තුර්කි ඉතිහාසය වැනි ඉතිහාස පොත් ද ප්‍රකාශයට පත් කළේය. මේවායින් අසන්බේ ඉතිහාසය ශ්‍රී ලංකාවේ පළමු දෙමළ නවකථාව ලෙස සැලකේ.

* සිද්ධි ලෙබ්බේගේ චින්තන විලාසයෙහි සන්ධිස්ථානයක් ඇති කළ ඉස්ලාමීය දර්ශනය හා දර්ශන විද්‍යාව ඔහුගේ අධ්‍යාත්මික හා ලෞකික ක්ෂේත්‍රවල ද බලපෑම් ඇති කළේය.

* ඊජිප්තු සටන් වීරයෙකු වූ ඔරාබි පාෂා හා ලෝක මුස්ලිම්වරුන්ගේ ඒකියත්වය සඳහා හඬනැඟූ ජමාලුද්දීන් ආෆ්ගානි වැන්නවුන්ගේ චින්තන බලපෑම සිද්දිලෙබ්බෙව ප්‍රතිගාමී චින්තකයෙකු ලෙස වෙනස් කළේය.

* අනෙක් පසින්, ආලිම් කෙනෙකු වූ ඔහුගේ වැඩිමහල් සොහුරාගේ මඟපෙන්වීම, කසාවත්තෙ ආලිම් කවියා හා යෙමන් ජාතිකයකු වූ අබ්දුල්ලාහ් බින් ෆාත්හ් වැන්නවුන්ගේ සම්බන්ධතාවය හා මිතුදම අධ්‍යාත්මික පැතිකඩ ඔපවත් කළේය.

* තම කාලයේ දී අනෙකුත් ජන සමූහයන් දෙක අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධියක් ලැබූ අතර මුස්ලිම් සමාජය අධ්‍යාපනය නොසලකාහැරීම දැක කණගාටුවට පත් ඔහු, මෙම තත්ත්වයෙන් මුස්ලිම් සමාජය ආරක්ෂා කිරීම සඳහා මද්රසතුස් සාහිරාව ස්ථාපනය කළේය.

* ඒ සමඟම මහනුවර, හැටන් හා බදුල්ල වැනි ස්ථානවල ද පාසල් ආරම්භ කෙරිණි.

* ඔහු මහනුවර ඇතිකළ පළමු මුස්ලිම් බාලිකා විදුහලෙහි තම සහෝදරියව විදුහල්පතිනිය කළ අතර සිසුන්ට අවශ්‍ය වූ පෙළ පොත්පත් ද ලියා ප්‍රකාශයට පත් කළේය.

* එම්. සී. අබ්දුර් රහ්මාන් ව සෙනෙට් සභාවට යැවීමට මඟ පෑදීය.

* සිද්දි ලෙබ්බෙගේ චින්තනයන් හා ක්‍රියාකලාපයන් ඔහුට දේශීය මට්ටමේ සහයෝගය ලබාදුන්නා සේ ම විරුද්ධත්වයන් ද ඇති කළේය.

* මේ කිසිත් සැලකිල්ලට නොගෙන ඔහුගේ සේවාවන් දිගටම කරගෙන ගිය ඔහු, තම 60 වන වියේ දී 1898 වන වසරේ දී ඇදුම රෝගයෙන් පීඩාවට පත් ව මරණයට පත් විය.

- ආචාර්ය ටී. බී. ජායා

  * අප රටෙහි ඉතා ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයින්ගෙන් කෙනෙකු වූ ආචාර්ය ජායා, නුවර පිහිටි ගලගෙදර නම් ප්‍රදේශයේ මැලේ ජාතික පවුලක 1890 වසරේ දී උපත ලැබීය.

  * තම කුඩා කාලයේ දී ආලිම්වරුන්ගෙන් ආගමික අධ්‍යාපනය ලැබූ ඔහු ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම සඳහා කොටහේන බී.ජී. පාසලට ඇතුළුවිය.

  * පසුව ශාන්ත තෝමස් විදුහලට ඇතුළු වී විශිෂ්ඨත්වයන් කිහිපයක් ලැබීය. පාසලේ ද පන්තියේ ද අති විශිෂ්ඨම සිසුවා යන තත්ත්වය ඔහු ලබාගත්තේ ය.

  * පාසල් ජීවිතය අවසන් කරගත් ජායා ට නුවර ධර්මරාජ විද්‍යාලයයේ හා මොරටු වේල්ස් කුමර විදුහල්වල බටහිර සාහිත්‍ය ගුරු පත්වීම ලැබුණි.

  * 1916 හි දී කලා උපාධි විභාගය සමත් වූ ඔහු 1917 දී කොළඹ ආනන්ද විදුහලෙහි සාහිත්‍යය හා ඉතිහාසය ඉගැන්වීම සඳහා පත්වීම් ලැබීය. මෙම කාල වකවානුව තුළ දී ජායාට මුස්ලිම් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අවධානය ඇති විය.

  * ඉතා සුවිශේෂී වූ අධ්‍යාපනයේ ප්‍රරෝගාමීන්ගේ හා සර් සෙයියිද් අහ්මද් කාන් වැනි ජාත්‍යන්තර අධ්‍යාපනඥයින්ගේ චින්තනයන්ගේ බලපෑම්වලට ආකර්ශනය විය.

  * ඉස්ලාමීය ඉතිහාසයට ගැඹුරු ඇල්මක් ද මධ්‍යකාලීන මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය සම්බන්ධ වූ දැනුම ද ලැබ සිටි ඔහුට ඔහුගේ කාලයේ මුස්ලිම් සමාජයේ අධ්‍යාපන පසුබෑස්ම මහත් කනස්සල්ලක් ලබා දුන්නේ ය.

  * අධ්‍යාපනයෙහි පසුබැස සංස්කෘතියෙහි ආවේණිකත්වය නැති වී දේශපාලනයෙහි කොන්කර දමා තිබූ අවාසනාවන්ත තත්ත්වයක සිටි මුස්ලිම් සමාජය ඉන් මුදාගත යුතු යැයි සිහින දැක්කේ ය.

  * තම සිහිනය සැබෑ කිරීම සඳහා ලේඛනය හා කථනය උපයෝගී කරගත්තේ ය.

  * ශ්‍රී ලංකා මුස්ලිම් සංගමයෙහි 1913 දී ජායා කළ කථාව, සමාජයේ ප්‍රතිසංවිධාන ක්ෂේත්‍රයෙහි ඔහුට තිබූ උනන්දුව ගෙනහැර දක්වයි.

* අපගේ ජයග්‍රහණ/වාර්තා මොනවා ද ?
    - සහෝදර සමාජයන් නොයෙකුත් ක්ෂේත්‍රවල නොයෙකුත් නිපුණතා ඇත්තන් බිහිකර ඇත්තා සේ අපි කී දෙනෙක්ව බිහිකර ඇත්තෙමු ද ?
    - උගතුන් නැති සේ ම දේශපාලන ක්ෂේත්‍රයේ ද අවශ්‍ය තරම් සාමාජිකයින් අප තවම බිහිකළේ නැත.
    - අපගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා පවා පාසල් අපට නොමැති වීම කණගාටුව ඇති කරවන කරුණකි.
* එදා තිබූ වාතාවරණය අනුව සමාජයෙහි වර්ධනයක් ලැබීම ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමෙන් පමණක් ළඟාකර ගත හැකිය යන්නෙහි ස්ථිරවම සිටියේ ය.
* 1916 දී ඔහු ප්‍රකාශ කළ පහත සඳහන් අදහස් ඔහුගේ ස්ථාවරය සනාථ කළේය.
    - ඉංග්‍රීසි අධ්‍යාපනයේ ස්ථිරව බල සම්පන්න වීම මගින් පමණක් බුද්ධියත්, සමාජයේ හැකියාවත්, දේශපාලන බලයත් ලැබූ උසස් සමාජයක් බවට මුස්ලිම් සමාජයට වෙනස්විය හැකියි.
* 1921 හි දී කොළඹ සාහිරා හි විදුහල්පති පදවිය බාරගත් විට, සහිරාව ඉතා පිරිහුණු තත්ත්වයක පැවතිණි.
* ඉදිරි වසර 20 තුළ අනෙකුත් ප්‍රසිද්ධ පාසල් වන රාජකීය හා ආනන්දය වැනි පාසල්වල තත්ත්වයට පත් විය.
* 1939 දී දෙවන ලෝක යුද්ධ සමයේ දී කොළඹ ජීවත් වූ ජනතාව එහි සිට ඉවත් කරන ලද අතර සහිරා විදුහල හමුදාවෙහි නවාතැන් පොළක් බවට පත් කරන ලදී.
* මෙම අර්බුදකාරී තත්ත්වය පිට පළාත්වල අධ්‍යාපන පුනර්ජීවනය ඇතිකිරීම සඳහා වූ අවස්ථාවක් කර ගත්තේ ය.
* මෙහි ප්‍රතිඵලයක් ලෙස වෑකන්ද (කොළඹ), ගම්පොල, අළුත්ගම, බණ්ඩාරවෙල, මාතලේ හා පුත්තලම වැනි ප්‍රදේශවල සාහිරා හි ශාඛා ඇති කිරීමට හැකි විය.
* අධ්‍යාපන ප්‍රතිසංවිධානයන් හි අධික ව නියැළුණු ඔහු, 1946 දී ප්‍රකාශයට පත්කළ The Crescent සඟරාවෙහි කතුවදන මගින් ලංකාවෙහි සර් සෙයියිද් අහ්මද්කාන් ලෙස හඳුන්වා දීම සඳහන් කළ යුතු කරුණකි.
* මිනිස් හැදියාව ඇති කිරීමෙහි ආගමේ කාර්යභාරය ඉතා අධිකයයි දැඩි විශ්වාසයක් තිබූ කෙනෙකු වූ ජායා ළමුන්ගේ අධ්‍යාපන සැලැස්මක ආගමික අධ්‍යාපනයෙහි හා පරිසරයෙහි අවශ්‍යතාවය නිතරම අවධාරණය කරමින් සිටියේය.
* ජායාගේ අධ්‍යාපන චින්තනය දූරදර්ශී හා ජාතික සුබසිද්ධිය ද කැටි වූ පැතිරුණු වේදිකාවක් ඇත්තක් ද වූවේය.
* මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනය දේශප්‍රේමය ඇත්තා වූ ද පොදුජන සුබසිද්ධිය කැටිවූ ද අවස්ථාවන් නොමැත්තන්ගේ සුබසිද්ධියෙහි සැලකිල්ල ඇතිකළ යුතුව ද පැවතිය යුතු බව අවධාරණය කළේය.
* දේශපාලන කරළියෙහි පය තැබූ ජායා 1924 හි දී ව්‍යවස්ථා සම්පාදන සභාවට තේරී පත්වූ දා පටන් ව්‍යවස්ථා සංශෝධනවල මුස්ලිම් සමාජයේ සුභසිද්ධිය තකා වාද කළේය.

* පොන්. ඉරාමනාදන් හා ජේම්ස් පීරිස් වැනි දමිළ නායකයින් සමඟ ළඟ ආශ්‍රයක් තිබූ ඔහු, පසුව ජාතික කොංග්‍රසයට සම්බන්ධ වී සිංහල නායකයන් හා එක් වී ජාතික නිදහස වෙනුවෙන් සටහන් කළේය.
* මුස්ලිම් සමාජයට බලපෑම් ඇතිකරන කරුණුවල දී ඔවුන්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීම වෙනුවෙන් කවදත් විමසිල්ලෙන් සිටියේය.
* මුස්ලිම්වරුන්ට ජුම්ආ නැමදුම වෙනුවෙන් සිකුරාදා දින නිවාඩු ලබාදිය යුතු යැයි යන කරුණ සම්බන්ධව 1925 දී ව්‍යවස්ථාදායක රාජ්‍ය සභාවෙහි දී වාද කළේය.
* 1931 හි දී මුස්ලිම්වරුන් වෙනුවෙන් ඩොනමෝර් වාර්තාව පිළිබඳ ව "මුස්ලිම්වරුන් හා යෝජිත දේශපාලන වෙනස්කම්" යන ශීර්ෂය යටතේ පෙත්සමක් ඉදිරිපත් කළේය.
* සමස්ත ලංකා මුස්ලිම් ලීගය සමඟ ද ඔහුට කිට්ටු සම්බන්ධතා තිබිණි.
* නිදහසට පසුව ඇතිකළ පළමුවන පාර්ලිමේන්තුවෙහි කම්කරු ඇමති ලෙස ජායා පත්වීම් ලැබීය.
* 1950 දී පාකිස්ථානයේ තානාපති ලෙස තෝරාගන්නා ලද ඔහු, එහි රජයේ හා ජනයාගේ හොඳසිත දිනාගත් හෙයින් ඔහුගේ සේවාවන් සැලකිල්ලට ගෙන කරාච්චි විශ්වවිද්‍යාලය මගින් ඔහුට ආචාර්ය උපාධියක් පිරිනමා ගෞරව කළේය.
* 1960 දී ලංකාවේ හාජිවරුන්ට නවාතැනක් ලබාගැනීමේ අදහසින් සවුදි අරාබියාවට ගිය ඔහු, එම වසරේ ම මැයි 31 දින මදීනාහි දී අභාවප්‍රාප්ත විය.

- මාප්පිල්ලෙ ලෙබ්බෙ ආලිම්
  * සෙයද් මුහම්මද් යන නියම නම ඇති මොහු, ක්‍රි.ව.1817 (හිජ්රි 1232) වැනි වසරේ දී දකුණු ඉන්දියාවෙහි පිහිටි කායල්පට්ටිනම් හි දී උපත ලැබීය.
  * පියාගේ නම වෙල්ලෙ අහ්මද් ලෙබ්බෙ ආලිම් හා මව ආමිනා, කායල් සදකතුල්ලාහ් අප්පාගේ පරම්පරාවෙන් පැමිණි තැනැත්තියකි.
  * මොහු වසර දෙකක බිළිඳෙකුව සිටි අවධියේ මොහුගේ දෙමාපියන් කීලක්කරෙ හි පදිංචි වූහ.
  * වයස අවුරුදු 10 වන විට අල්කුර්ආනය සම්පූර්ණයෙන් ම කටපාඩම් කර සිටියේ ය.
  * මුල දී මොහු ආගමික කලාවන් හා අරාබි, උර්දු, පාර්සි හා දෙමළ යන භාෂා තෙක්කා සාහිබු වලියුල්ලාහ් නැමැති විද්වතාගෙන් ඉගෙන ගත්තේ ය.
  * තම සිසුවාගේ විශිෂ්ඨත්වය තේරුම් ගත් තෙක්කා සාහිබු, තම සිව්වැනි දියණිය වූ සාරා උම්මා ව විවාහ කර දී ඔහුට ලෙබ්බෙ ආලිම් සාහිබු යන නම තැබීය.
  * ඔයුගේ නියම නමට වඩා මෙම නම ප්‍රචලිත විය.
  * මෙම නම අරාබි භාෂාවෙන් අල් ආලිමුල් අරූස් ලෙස පරිවර්තනය කර ජනයා විසින් ආමන්ත්‍රණය කරන ලදී.
  * මේ හේතුවෙන් මොහු පවත්වාගෙන ගිය මද්රසාවට, අල් මද්රසතුල් අරූසියියා යන නම ලැබිණ.
  * හිජ්රි 1267 දී මොහුගේ ගුරු තෙක්කා යාහිබු වලියුල්ලාහ් අභාවප්‍රාප්ත වූ විට ඔහු විසින් පවත්වාගෙන ගිය තෙක්කාවට හා තරීකාවට නායකත්වය දීමට මොහුට සිදුවිය.

* මිනිසුන් අතර පැවති අශීලාචාර ගති පැවතුම් නැතිකර ඔවුන් ව ඉස්ලාමීය ධර්ම මාර්ගයට හැරවූ ප්‍රශංසාව මොහුට අයත් ය.
* මොහුගේ අත් අල්ලා බෙඅත් ලැබූවන් බොහෝයි.
* මොහු සිකුරාදා ජුම්ආ කුත්බාව දෙමළින් ද පාරායණය කළ හැකිය යන විනිශ්චය ලබාදුන් අතර කුත්බාව දෙමළට පරිවර්තනය කර ඉදිරිපත් කළේය.
* මොහු අරාබි භාෂාවෙන් ද, අරාබි දෙමළින් ද ග්‍රන්ථ බොහෝමයක් ලියා ඇත්තේය. තම පොත්පත් මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීම සඳහා ම කීලක්කරෙහි හිජ්රි 1304 දී මුද්‍රණාලයක් ආරම්භ කළේය.
* ආගමික නීති සම්බන්ධව සංක්ෂිප්තව ෆත්හුල් මත්තීන්, ෆත්හුල් සලාම් හා ෆත්හුද් දෙයියාන් වැනි ග්‍රන්ථ අරාබි දෙමළින් ලියූ මොහු, පසුව මඃකාහි යන නමින් ෆික්හ් සම්බන්ධ විස්තරාත්මක ග්‍රන්ථයක් ද ලිව්වේ ය.
* නබි (සල්) තුමාගේ නමින් මින්හතුස් සරන්දීප් යන නමින් ස්තුති ගීත ගැයූ මොහු තලෙෆාත්තිහා යන නමින් ෆාත්තිමා (රළි) තුමියගේ ගුණ ද ගායනා කළේය. ඒ සමඟම නොයෙකුත් විද්වතුන්ගේ නමින් ගුණ ගායනා හා ශෝක ගීත ද අරාබි භාෂාවෙන් ගායනය කර ඇත්තේ ය.
* අරාබි බසින් මොහු නිර්මාණය කරදුන් රාතිබුල් ජලාලියියා ප්‍රසිද්ධියක් උසුලයි.
* ව්‍යාපාරික කටයුතු සඳහා මාප්පිල්ලෙ ලෙබ්බෙ ආලිම් හිජ්රි 1232 හි දී ලංකාවට ආවේය.
* ලාංකික මුස්ලිම්වරුන්ගේ පුනර්ජීවනයේ පුරෝගාමීන් වූ සිද්දි ලෙබ්බෙ හා ඔරාබි පාෂා වැන්නවුන්ගේ සමකාලීනයෙකු වූ මොහු, ලංකාවෙහි කාදිරිය්යා තරීකාව හඳුන්වා දුන් තිදෙනාගෙන් කෙනෙකි.
* කාදිරියියා තරීකාව ලංකාවෙහි ප්‍රචලිත කිරීම සඳහා තම 18 වැනි වියේ පටන් කීලක්කරෙ සිට ලංකාවට පැමිණ ගොස් ඇත.
* මොහු ලංකාවෙහි ප්‍රදේශ කිහිපයක තම තරීකාවට සම්බන්ධ තෙක්කාවන් ඇති කළේය.

  උදා : කොළඹ පරණ යෝනක වීදිය 1881 (මධ්‍යස්ථානය මඃනමුෂ් ෂුඅදා)
  මරදාන - 1883
  වැලිගම - 1884
  වැලිපිටිය - 1885
  කොටුවේගොඩ, මාතර - 1886
  මිලිද්දුව, ගාල්ල - 1887
  කඩවීදිය, මාතර - 1888

* මොහු පිහිටවූ තක්කියාවල කාදිරියියා තරීකාවට සම්බන්ධ රාතිබු දිගටම ගායනා කරන ලදී.
* මේ මගින් ජනයා මධ්‍යයෙහි කාදිරියියා තරීකාව ප්‍රසිද්ධ වී වර්ධනය විය. මොහු ද සිද්දි ලෙබ්බෙ ලෙස ම ප්‍රතිසංවිධානය යන නමින් මද්රසාවන් ඇතිකර පොත්පත් ප්‍රකාශයට පත් කර එම ආකාරයටම කළ ද තම අභිලාෂයන් මුදුන්පත් කර ගැනීම සඳහා දෙදෙනාම වෙනස් වූ චින්තනාකල්පයන් ගෙන සිටියහ.
* අරාබි භාෂාවෙන් අධ්‍යාපනය ලබාදෙන්නා වූ, මද්රසා මගින් ගැඹුරු ආගමික ඥානයක් හා චින්තනයක් ලබාදිය හැකි බැවින් එවැනි මද්රසාවන්ගෙන් පමණක් ආගමික හා සමාජයීය පුනර්ජීවනයක් ඇති කළ හැකි යැයි මාප්පිලෙ ලෙබ්බෙ ආලිම් සිතුවේය.

* එම ඉලක්කය සපුරා ගැනීම සඳහා මද්රසතුල් බාරි යන මද්රසාව 1884 දී මොහු විසින් වැලිගම දී ඇති කරන ලදී.
* සිද්දි ලෙබ්බෙ වැන්නවුන් පොත්පත් හා පුවත්පත් ප්‍රකාශයට පත්කිරීම මගින් ජනයා අතර පුනර්ජීවනයක් ඇතිකළා සේ ම මොහු ද තම උරුමයෙන් ලද චින්තන ආර ව්‍යාප්ත කිරීම වෙනුවෙන් පොත්පත් ලියා ප්‍රකාශයට පත් කළේය.
* ෂරීආ නීතිරීතීන් ආරක්ෂා කිරීම සඳහා අරාබි දෙමළින් ඉතා සරල ආකාරයකට ෂරීආ සම්බන්ධ නීතිරීතීන් සම්පාදනය කර දුන්නේය.
* ෆත්හුල් මතීන් යන ග්‍රන්ථය මෙම ආකාරයට ප්‍රකාශයට පත් වූ මුල්ම ග්‍රන්ථය වේ. මෙය පසුව ෆත්හුස් සලෆ් යන නමින් ප්‍රසාරණය කරන ලදී. මෙය ද තවදුරටත් ප්‍රසාරණය කර 1873 දී ෆත්හුද්දෙයාන් යන නමින් ප්‍රකාශයට පත් කළේය. මෙය 1886 දී මකානි යන නමින් තවදුරටත් විස්තරාත්මක කර ප්‍රකාශයට පත් කරන ලදී.
* මෙම ග්‍රන්ථයට දේව විශ්වාසය, දේව වන්දනය, විවාහය, වෙළෙඳාම හා දණ්ඩ නීතිය යන කරුණු ඇතුළත් කර ඇත.
* සාමාන්‍ය ජනයාට ද තේරුම් ගත හැකි අයුරු ලියන ලද මෙම ග්‍රන්ථයට සමකළ හැකි ග්‍රන්ථයක් මේ දක්වා දෙමළ බසින් හෝ අරාබි දෙමළින් හෝ ලබාගත නොහැකි වී තිබීම මෙම ග්‍රන්ථයෙහි විශේෂත්වය වේ.
* මේ මගින් ඔහු බලාපොරොත්තු වූයේ බටහිර අධ්‍යාපනය ලැබූ මුස්ලිම්වරුන් ද ආගමික පසුබිමෙහි වර්ධනයක් ලබාගත යුතු ය යන්නයි.
* ජනයාගේ ජීවන ක්‍රමය ප්‍රතිසංවිධානය කළයුතු ය යන අධිෂ්ඨානය ඔහුට තිබුණු නිසා උම්මහාතුල් මුඃමිනීන්වරුන්, සහාභාවරුන් හා වලිවරුන් වැන්නවුන්ගේ ජීවිතාපදානයන් ගද්‍ය ශෛලියෙන් හා කාව්‍යමය ලෙස සම්පිණ්ඩනය කර දුන්නේ ය.
* ඔහු ජීවත්වූ කාලයේ විසූ ජනයා අතර හඳුන්වා දෙනු ලැබ තිබූ දානමය (කන්දූරි) අවස්ථාවල කියැවිය හැකි ආකාරයට මෞලිද්, තලෛෆාතිහා වැනි පොත් ද ලියා ප්‍රකාශයට පත් කළේය.
* කුත්බාවන් සම්පිණ්ඩනය කර කුත්බාත් යන නමින් ද ලබාදුන්නේ ය.
* මෙලෙස මුල් අවධියේ මුස්ලිම්වරුන්ගේ ආදර්ශමත් වූ ජීවන රටාවන් හා ඔවුනගේ ඉගැන්වීම් ජනයා අතර ප්‍රචලිත කිරීම සඳහා උත්සාහ ගත්තේ ය.

● අයි. එල්. එම්. අබ්දුල් අසීස්
  * කොළඹ ප්‍රසිද්ධ වූ මුස්ලිම් පවුලක අයිදෘස් ලෙබ්බෙ මරික්කාර් නැමැත්තාගේ පුතා ලෙස මොහු 1867 දී උපත ලැබීය.
  * මොහුගේ පියා කැෂියර් කෙනෙකු ලෙස සේවය කළේය.
  * මොහු කෙරෙහි විශ්වාසය ඇති වූ එකළ ඉංග්‍රීසි පාලනය 1879 දී ඔහුට කුප්පියාවත්ත මුස්ලිම් සුසාන භූමියෙහි භාරකරු ලෙස පත් කළේය.
  * අල්කුර්ආනය හා දෙමළ භාෂාව තම පියාගෙන් ඉගෙන ගත් මොහු ඉංග්‍රීසි අධ්‍යාපනය කොටුවෙහි තිබූ රජයේ පිරිමි විදුහලෙන් ලැබීය.
  * ආගම හා සම්බන්ධ ඥානය අවශ්‍ය තරමට ලබාගත් මොහු, දෙමළ භාෂාවෙහි ද නිපුණත්වය ලබාගෙන බොහෝ ඉංග්‍රීසි පොත්පත් ද කියෙව්වේය.

* වෛද්‍ය ශාලාවල මරණයට පත් වූ මුස්ලිම්වරුන්ගේ මෛයතයන් (මෘතදේහ) අපහසුතාවයකින් තොරව ලබා ගැනීමේ අරමුණ ඇති ව ඇති කරන ලද අල්ජාමිඅතුල් ඉස්ලාමියියා යන සංගමයෙහි ලේකම් ලෙස 1888 දී තෝරාපත් කරගනු ලැබීය.
* 1889 දී සිද්දි ලෙබ්බෙ ආරම්භ කළ මුස්ලිම් නේෂන් පුවත්පතෙහි ප්‍රකාශක පදවිය භාරගත්තේය.
* වාප්පිච්චි මරික්කාර්ගේ උදව් ඇතිව සිද්දි ලෙබ්බෙ ආරම්භ කළ අධ්‍යාපන ව්‍යාපාරය මොහුගේ මුළු උපකාරයක් ම ලබාදුන්නේ ය.
* මෙම ව්‍යාපාරය කොළඹ මුස්ලිම් අධ්‍යාපන සංගමය ඇතිකර ඒ හරහා සාහිරා විදුහල පිහිටු වූවේය. මෙහි ලේකම් ලෙස මොහු සිටියේ ය.
* සහිරාවේ වර්ධනයට වෙහෙස නොබලා මහන්සි වී සේවය කළ අයි. එල්. එම්. ඒ. අසීස් ගේ සේවාවන් ප්‍රශංසා කර එකළ සිටි නීතීඥයකු වන ඒ. සී. මුහම්මද් නැමැත්තා කථා කිරීමේ දී එක් ස්ථානයක දී මෙම අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි ලීවරය මොහු යයි පැවසීය.
* මොහුගේ සමාජ ප්‍රතිසංවිධාන සේවය වනාහි සැලකිය යුතු එක් ක්ෂේත්‍රයක පමණක් නොව නොයෙකුත් ක්ෂේත්‍රවල ව්‍යාප්ත ව තිබූ බව දැකිය හැකිය.
* ක්‍රි.ව. 1950 දී ඇතිකරන ලද යෝනක සංගමයේ සභාපති ලෙස මොහු තේරී පත් විය.
* පළමු මුස්ලිම් අද්වකාද් වූ (අධිනීතිඥ) ලෙස සැලකෙන අබ්දුල් කාදර් නැමැත්තාට අසීස් සුබපැතුමක් ඉදිරිපත් කළේය. තුර්කි රාජ්‍ය කෞන්සිලර් අතාවුල්ලා බේ නැමැත්තා කොළඹ හරහා සිංගප්පූර්වට යන අතරතුර, ඔහුට ද සුබපැතුමක් කියවා ඉදිරිපත් කළේය. වික්ටෝරියා රැජිනගේ හා හත්වන එඩ්වඩ් රජුගේ වියෝවන් වෙනුවෙන් ශෝක ප්‍රකාශ ද යැවීය.
* ඩබ්ලිව්. එම්. අබ්දුර් රහ්මාන් නැමැත්තාව ව්‍යවස්ථා සම්පාදන සභාවට පත් කිරීම වෙනුවෙන් ආණ්ඩුකාර වෙස්ට් රිජ්වේට ස්තුති යෝජනාවක් සම්මත කර ගත්තේය.
* ආගමික ක්ෂේත්‍රයෙහි ඔහුට තිබූ දක්ෂතාවය ගෙනහැර පෑමක් ලෙස සැලකෙන්නේ : මරණයෙන් මතු ජීවිතය පිළිබඳ ව මුස්ලිම්වරුන්ගේ මතය යන තේමාව යටතේ අබ්දුල් අසීස් කළ කථාවයි. මෙම කථාවෙහි අන්තර්ගතයෙහි ඉමාම් ගස්සාලිගේ චින්තනවල බලපෑම් දැකගත හැකි යැයි පවසති.
* අබ්දුල් අසීස් 1898 පමණ වන විට අස්සවාබ් යන නමින් අරාබි දෙමළ පුවත්පත ප්‍රකාශයට පත් කළේය.
* මුස්ලිම් ගාඩියන් (මුස්ලිම්වරුන්ගේ ආරක්ෂකයා) යන නමින් තවත් දෙමළ පුවත්පතක් 1901 හි දී ප්‍රකාශයට පත් කළේය.
* මෙම පුවත්පත මගින් මුස්ලිම්වරුන්ගේ විවාහයන් ලියාපදිංචි කිරීම සඳහා නීති සම්පාදනය කළයුතු බව රජයට බලපෑම් කළේය.
* මෙම කාල වකවානුවේ ප්‍රකාශයට පත් වූ ක්‍රිස්මස් (නත්තල්) ප්‍රකාශයක එවකට ජනපද රාජ්‍ය ලේකම් ක්ලිෆඩ් නැමැත්තා ඉස්ලාමයට විරුද්ධව පළකල අදහස්වලට අබ්දුල් අසීස් විසින් සර්ලන වූ ප්‍රතිඋත්තර ලබා දෙන ලදී.
* 1907 හි දී ඔහු අල් මුස්ලිම් යන නමින් ඉංග්‍රීසි - දෙමළ පුවත්පතක් ප්‍රකාශයට පත් කළේය.
* ව්‍යවස්ථා සම්පාදන සභාවෙහි ජාතීන් පාදක වූ නියෝජනය ගැන ද, මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන මට්ටම් පිළිබඳව ද ඔහු මෙරටෙහි පුවත්පත්වලට ලබාදුන් අදහස් පොදු ජනයා විසින් මහත් සේ පිළිගන්නා ලදී.

* පළමු මුස්ලිම් අද්වකාද් (අධිනීතිඥතුමා) වූ අබ්දුල් කාදර් තුර්කි තොප්පිය පැළඳීම නීතිපති වැළැක්වූ විට, දූතයින් පිරිසක් සමඟ නීතිපතිගේ නිවසට ගොස් තම පැමිණිල්ල ඉදිරිපත් කළේය. මෙමඟින් කිසිදු ඵලක් නොවූ හෙයින් 1905 දී මරදාන මස්ජිදය ඉදිරිපිට මෙම කණ්ඩායම මහා සෙනඟක් එක්රැස් කර නීතිපතිගේ මෙම ක්‍රියාවට ප්‍රතිකර්මයක් ඉල්ලා අබ්දුල් අසීස් විසින් රජතුමාට යෝජනාවක් යැවීය.
* මොහුගේ ප්‍රතිසංවිධාන උත්සාහයන් හා දේශපාලන උත්සාහයන් ඉතා වැදගත් වේ.
* ව්‍යවස්ථා සම්පාදන සභාවෙහි පොදුවේ දෙමළ කථාකරන ජනයාට දෙමළ පුද්ගලයකු නියෝජනය කිරීම වැරදි සහගතය. මුස්ලිම්වරුන් දෙමළ කථා කළද ඔවුන් ඔවුන්ටම ආවේණික වූ ජන කොටසක් බැවින් ඔවුන්ට නියෝජනය කිරීම සඳහා මුස්ලිම් නියෝජිතයෙකු අවශ්‍ය වන බව දිගින් දිගටම අවධාරණය කළේය.
* යෝනකයින් දෙමළ කථාකරන ජන කොටසක් ලෙසත්, ඔවුන් දෙමළ ජනයාගෙන් ඉස්ලාම් ආගමට හරවන ලද්දවුන් ලෙසත් යන පදනම ඇති ව පොන්. රාමනාදන් පළකළ අදහස් මොහු එකහෙලා ප්‍රතික්ෂේප කළේය.
* මුස්ලිම්වරුන්ටම කියා ව්‍යවස්ථා සභාවෙහි නියෝජිතයෙකු සිටිය යුතුය යන සිද්දි ලෙබ්බෙ මූලික ව කළ සටන අබ්දුල් අසීස් ඉදිරියට ම ගෙන ගියේය.
* මුස්ලිම්වරුන්ගේ මෙම ඉල්ලීමට ව්‍යවස්ථා සභාවෙහි දී රාමනාදන් විරුද්ධ වූවා පමණක් නොව, රාජ්‍ය ආසියානු සංගමයෙහි රැස්වීමක Ethnology of the Moors of Ceylon යන පර්යේෂණ ලිපිය ද කියවීය.
* මෙම ලිපියෙහි තිබූ වැරදීන් පෙන්නුම් කර දී එම ලිපියට එළිදරව් ලිපියක් එළිදැක්වී ය. මෙය යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථානය මගින් පොතක් ලෙස ප්‍රකාශයට පත් කළේය.
* 1903 දී මරදාන මස්ජිදයෙහි කළමනාකරණ භාරකරු ලෙස ද පත් කරනු ලැබීය.
* මාකාන් මාකාර් තුර්කියේ කවුන්සලර් ලෙස පත් කරනු ලැබූ විට දෙන ලද රාත්‍රී භෝජන සංග්‍රහයට මූලාසනය හෙබවූයේ අබ්දුල් අසීස් ය.
* 1911 ජන සංඛ්‍යා වාර්තාවට මුස්ලිම්වරුන් දරු ප්‍රසූතියේදී සැලකිල්ලට ගනු ලබන සිරිත් විරිත් හා ඔවුන්ගේ මල්වරවීමේ චාරිත්‍ර යන තේමාව යටතේ කථාවක් ඉදිරිපත් කළේය.
* 1905 දී ව්‍යවස්ථා සම්පාදන සභාවෙහි අබ්දුල් රහ්මාන්ගේ නියෝජන කාලය අවසන් වූ විට එම ස්ථානයට මොහුව පත්කළ යුතු යැයි මුස්ලිම්වරුන් විසින් රජයට ඉල්ලීමක් ඉදිරිපත් කළහ.
* 1906 දී මොහු මුහම්මද්වරුන්ගේ විවාහ ලියාපදිංචි කිරීමේ නියෝග නීතියට ගොනුකළ සංශෝධන ඉස්ලාමීය නීතිවලින් දුරස් නොවී මුස්ලිම් කාන්තාවන් සමාජයීය, විද්‍යාත්මක හා අධ්‍යාත්මික ක්ෂේත්‍රවල වර්ධනයට ෆර්දා විෂයෙහි සංශෝධන අවශ්‍ය යැයි අවධාරණය කළේය.
* අබ්දුල් අසීස්ගේ ආගමික ක්ෂේත්‍රයේ ප්‍රතිසංවිධානයන් හි එම කාලයේ පරිසරයට අනුව ප්‍රතිගාමීත්වයක් දක්නට ලැබිණි.
* හදීස් හා මව්ලිද් යන්න හුදෙක් ම අරාබි භාෂාවෙන් කියවීමට පින් ලැබෙනු ඇතැයි යනුවෙන් උලමාවරුන් පවසන ලද්දට විරුද්ධ වූ ඔහු, සත්‍ය වශයෙන් ම අවශ්‍ය වනුයේ ආගම සම්බන්ධ ග්‍රන්ථවල පරිවර්තන හා පැහැදිළි කිරීම් යැයි පැවසී ය.

* 1912 දී යාපනයට ගිය ඔහු, එහි ජුම්ආ දේශනාවට පසුව කළ කථාව මගින් කුත්බා දේශනාවන් දෙමළට පරිවර්තනය කළ යුතු යැයි ඉල්ලා සිටියේ ය. එදා පටන් අරාබියෙන් හා දෙමළින් කුත්බා කියන්නා වූ පුරුද්ද ඇති විය.
* මොහු පොත්පත් කිහිපයක් ම සම්පාදනය කර දුන්නේ ය. ඒවායින් "ශක්තියින් ඥානාර්වම්" යන ග්‍රන්ථය සුවිශේෂී ය. මෙම ග්‍රන්ථයෙහි අදේවවාදයට විරුද්ධ වූ සිද්දි ලෙබ්බෙගේ තර්කය ඔහුගේ අභාවයෙන් පසු ඉදිරියට ගෙන ගියේ ය.
* කුරුසය හා අඩ සඳ අතර ගැටුම් සම්බන්ධව අබ්දුල් අසීස් කළ කථාව ද පොතක් ලෙස ප්‍රකාශයට පත් විය.
* 1915 සැප්තැම්බර් 11 දින අභාවප්‍රාප්ත විය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 - ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ ජාතික දායකත්වයන් පිළිබඳ ව සරල ව ගෙනහැර දක්වයි.

පියවර 2 - සිසුන් කණ්ඩායම්වලට බෙදා කරුණු සෙවීම සඳහා යොමු කරන්න.

පියවර 3 - පහත සඳහන් මාතෘකා යටතේ රචනා ලිවීමට එම කණ්ඩායම් යොමු කරන්න.

(අ) ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ දේශීය දායකත්වයන්
(ආ) ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික දායකත්වයන්
(ඉ) ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් හා පුද්ගල නීතිය
(ඊ) මුස්ලිම් නායකයින්ගේ දායකත්වයන් (සිද්දි ලෙබ්බෙ, අයි. එල්. අබ්දුල් අසීස් හා ටී.බී. ජායා)

පියවර 4 - මේවා සම්පිණ්ඩනය කර පොත් පිංචක් සාදන්න.

**අමතර කියවීම සඳහා**


1. රහීම් අබ්දුල් (2006) ඉස්ලාමීය කලෛක් කලංජියම්, කාණ්ඩය 1, 2, 3 හා 4, චෙන්නයි, යුනිවර්ස් ප්‍රකාශකයෝ, (දෙමළ බසින්)
2. අමීන් එම්.අයි.එම්. (2000) ඉලංගෛ මුස්ලිම්ගලින් වරලාරුම් කලාචාරමුම් (1870-1915), හෙම්මාතගම අල්හසනාත් පතිප්පකම්
3. කමාල්දීන් එස්. එම්. (1994)කලානිදි බුර්හානුදීන් රූසා, ජාතික අධ්‍යාපන ආයතනය (1990)
4. අසීස් ඒ. එම්. ඒ. (2007) ඉලංගෙයිල් ඉස්ලාම්, චෙන්නයි, කුමරන් පුත්තක ඉල්ලම් වෙලියීඩු,
5. අමීන් එම්. අයි. එම්.(1997) ඉලංගෙයි මුස්ලිම්ගලින් වරලාට්රිල් අරිඥර් සිද්දි ලෙබ්බෙ, හෙම්මාතගම අල්හසනාත් වෙලියීඩු
6. සාහිර් (සායිර්) ඒ. සී. එම්. (1979) නම් මුන්නෝර්, යෝනක ඉස්ලාමීය කලාසාර නිලෛයම්,
7. අසීස් එම්. ඒ. ඉලංගයි චොනකර් ඉන් වරලාරු
8. අමින් එම්. අයි. එම්. (2010). ඉලංගයි මුස්ලිම්ගලින් මරුමලර්චමික්කු වින්තිට්ට මුන්නෝඩිහල්, හෙම්මාතගම, අල්හසනාත් පදිප්පහම්.
9. ඉස්ලාම් (1994), අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මඟ පෙන්වීම, ජාතික අධ්‍යාපන ආයතනය.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයෙකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීමට සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර, සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණ සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත්, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය :

01. පැවරුම්
02. ව්‍යාපෘති
03. සමීක්ෂණ
04. ගවේෂණ
05. නිරීක්ෂණ
06. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම්
07. ක්ෂේත්‍ර චාරිකා
08. කෙටි ලිඛිත පරීක්ෂණ
09. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නලය
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණාත්, මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 7.0

**නිපුණතා මට්ටම** : 7.1

**උපකරණයේ ස්වභාවය** : පැවරුම්

ඉස්ලාමයට පෙර සටනේ අරාබි සමාජයේ පහත අංශ පිළිබඳ කණ්ඩායම් සාකච්ඡාවක් පවත්වා වාර්තාවක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

* සමාජ ආර්ථික තත්ත්වය
* භාෂාව හා සාහිත්‍යය
* ආගම හා සදාචාරය

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. පැවරුමේ අරමුණ පහදා දීම, අරමුණුවලට හා මාතෘකා අතර සම්බන්ධහ පහදා දීම | 4 | 3 | 2 | 1 |
| 2. දත්ත, තොරතුරු රැස්කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමයේ අදාළ බව. | 4 | 3 | 2 | 1 |
| 3. දත්ත, තොරතුරු රැස්කිරීම හා ඒවා සටහන් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. යොදාගත් ක්‍රමවේදයන්ගේ අදාළත්වය හා තර්කානුකූල ස්වභාවය | 4 | 3 | 2 | 1 |
| 5. තීරණයට එළඹීම, ඒවාට හේතු දැක්වීම හා නිර්මාණය ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ $= \frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.1

**උපකරණයේ ස්වභාවය** : ව්‍යුහගත රචනා ප්‍රශ්න

නබි (සල්) තුමා කළ හිජ්රතය ලබාදෙන පාඩම් පහත මාතෘකා යටතේ විස්තර කරන්න.

* හිජ්රතය සඳහා සූදානම් වීම
* හිජ්රත් සිදුවීම
* මුහාජිර්වරුන්ගේ කැපවීම
* අන්සාර්වරුන්ගේ සහයෝගය

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. මාතෘකාව හඳුන්වා දීම | 4 | 3 | 2 | 1 |
| 2. පාඩම්වල වැදගත්කම මාතෘකාවට අදාළ වීම | 4 | 3 | 2 | 1 |
| 3. සංවිධානය, ඡේද බෙදීම, විධිමත් විවිධ ක්‍රමවේද භාවිතය | 4 | 3 | 2 | 1 |
| 4. භාෂාවේ නිරවද්‍යතාවය, ව්‍යාකරණවල නිරවද්‍යතාවය, නැවතීමේ ලකුණු, භාෂාමය භාවිතයත්, පැහැදිළි බව, නිර්මාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 5. තීරණ ගැනීම සාධාරණීකරණය, කරුණු තර්කානුකූලව ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# පළමු වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 8.9

**නිපුණතා මට්ටම** : 8.2, 8.4, 9.1

**උපකරණයේ ස්වභාවය** : සිතියමක් ඇඳීම

නබි (සල්) තුමාගේ කාලයේ සිට අබ්බාසිවරුන්ගේ පිබිදීම තෙක් වූ කාල වකවානුවේ (ක්‍රි.ව.622 - 710) ඉස්ලාමීය කිලාෆතයේ වර්ධනය ඒ ඒ කාල වකවානු අනුව වර්ග කර දක්වා සිතියමක ඇඳ පාසල් බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. මාතෘකාවට අදාළ බව හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. සිතියම් ඇඳීමේ ක්‍රමවේද | 4 | 3 | 2 | 1 |
| 3. යොදාගත් උපක්‍රමවල අදාළ බව | 4 | 3 | 2 | 1 |
| 4. ක්‍රමවත් බව හා පිළිවෙළ | 4 | 3 | 2 | 1 |
| 5. අවසාන ඵලය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ $= \frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.2

**උපකරණයේ ස්වභාවය** : ක්ෂණික කථාවක් පැවැත්වීම

නබි (සල්) තුමා ඇතිකර ගත් ගිවිසුම් මුස්ලිම් සමාජය ස්ථාවර කිරීමෙහිලා වැදගත් දායකත්වයක් ඇති කළේය නම් මාතෘකාව යටතේ කථාවක් පැවැත්වීමට සිසුන් යොමු කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. යොමුවීම හා මාතෘකාව පැහැදිළි ව ඉදිරිපත් කිරීම, එහි අදාළත්වය | 4 | 3 | 2 | 1 |
| 2. සැකැස්ම, මාතෘකාවට අදාළ පරිදි කරුණු ඉදිරිපත් කිරීම, භාෂාවේ නිරවද්‍යතාවය | 4 | 3 | 2 | 1 |
| 3. මනා භාෂා යෙදීම්, උපමා යනාදිය යොදා ගැනීම නිර්මාණාත්මක බව | 4 | 3 | 2 | 1 |
| 4. පැහැදිළි බව, ශබ්දය පාලනය කර ගැනීම, මුහුණුවර, අංග චලනය, කාලය කළමනාකරණය, නිවැරදි උච්ඡාරණය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශ කිරීම, නිගමනවලට හේතු දැක්වීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 8.0

**නිපුණතා මට්ටම** : 8.3

**උපකරණයේ ස්වභාවය** : විවාදය

කුලශාඋර් රාෂියිදුන්වරුන් අතර වැදගත් වන්නේ මුල් කලීෆාවරුන් දෙදෙනාගේ දායකත්වය ද ? පසු කලීෆාවරුන් දෙදෙනාගේ දායකත්වයද?

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉදිරිපත් කරන ආකාරය, මාතෘකාව පැහැදිළිව හඳුන්වා දීම | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට ගැලපෙන සේ කරුණු සංවිධානය හා ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 3. තර්කානුකූලව හා නිර්මාණාත්මක තොරතුරු ඉදිරිපත් කර තිබීම | 4 | 3 | 2 | 1 |
| 4. සුදුසු පරිදි හැඟීම් හා අංග චලනය, කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සංක්ෂිප්ත කිරීම, තීරණ හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# දෙවන වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.2, 9.3

**උපකරණයේ ස්වභාවය** : කණ්ඩායම් සාකච්ඡා

අභ්‍යාසිය පාලනයේ හා ස්පාඤ්ඤ පාලනයේ විද්‍යා ක්ෂේත්‍රයේ දායකත්වය.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන වලංගුතාවය හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. කණ්ඩායම් සාකච්ඡාව සංවිධානය, සංස්කරණය, මාතෘකා වෙන් කිරීම, උපදෙස් පිළිපැදීම | 4 | 3 | 2 | 1 |
| 3. සාකච්ඡාව ඉදිරියට ගෙන යා හැකි අයුරින්, සංවර්ධනාත්මකව අදහස් ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණාත්මක, තර්කානුකූල, ප්‍රමාණාත්මක භාවය | 4 | 3 | 2 | 1. |
| 5. සාරාංශකරණය, තීරණය හා තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 01

**නිපුණතාවය** : 9.0

**නිපුණතා මට්ටම** : 9.1, 9.2

**උපකරණයේ ස්වභාවය** : ප්‍රදර්ශනය

ඉස්ලාමීය ඉතිහාසයේ දී උමයියා, අබ්බාසිය කාලවල බිහි වූ, අනිත්‍ය වූ කලාවන්, අක්ෂර කලාව, විද්‍යාවන් ආදිය ඇතුළත් ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට සිසුන් යොමු කිරීම.

එහි පොත්පත්වලින් හා අන්තර්ජාලයෙන් ලබාගත් රූප සටහන් ආදිය ප්‍රදර්ශනය කරන්න.

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම | | නිපුණතා මට්ටම | |
| | ළඟාවී ඇත | | ළඟා වීනැත | |
| 1. ප්‍රදර්ශනයේ මාතෘකාවට අදාළ වළංගුතාවය හා සම්බන්ධය | 4 | 3 | 2 | 1 |
| 2. ප්‍රදර්ශනය සංවිධානය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමයන් | 4 | 3 | 2 | 1 |
| 3. ප්‍රදර්ශනය සංවිධානය | 4 | 3 | 2 | 1 |
| 4. භාවිත කරන උපාය මාර්ග හා ඒවායේ වලංගුතාවය | 4 | 3 | 2 | 1 |
| 5. ප්‍රතිඵලය හා නිගමනය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 02

**නිපුණතාවය** : 10.0

**නිපුණතා මට්ටම** : 10.2

**උපකරණයේ ස්වභාවය** : බිත්ති පුවත්පත

දකුණු ඉන්දියානු හා ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ගේ සම්බන්ධතාව, ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන් අතර ඇති කළ යහපත් හා අයහපත් ප්‍රතිඵල

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ දක්වන සම්බන්ධතාවය හා වලංගුතාවය | 4 | 3 | 2 | 1 |
| 2. සංවිධානය යනු එකක් වීම | 4 | 3 | 2 | 1 |
| 3. අලංකරණය සඳහා යොදාගන්නා ලද ක්‍රමවේදයන් හා ඒවායේ වලංගුතාවය | 4 | 3 | 2 | 1 |
| 4. අන්තර්ගත නිර්මාණාත්මක ස්වභාවය හා තර්කානුකූල ස්වභාවය | 4 | 3 | 2 | 1 |
| 5. බිත්ති පුවත්පතක් ලෙස නිර්මාණයේ සාර්ථකත්වය | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ $= \frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |

## පාසල් පාදක තක්සේරුවට යෝජිත උපකරණ

# තෙවන වාරය

**උපකරණ අංකය** : 03

**නිපුණතාවය** : 10.0

**නිපුණතා මට්ටම** : 10.2

**උපකරණයේ ස්වභාවය** : විවාදය

ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ දායකත්වය අතුරෙන් වැදගත් වන්නේ,

නිදහසට පෙර දායකත්වය ද ?
නිදහසෙන් පසු දායකත්වය ද ?

පහත නිර්ණායක පදනම් කරගෙන ලකුණු දෙන්න.

| නිර්ණායක | ලකුණු ලබාදීම | | | |
|---|---|---|---|---|
| | නිපුණතා මට්ටම ළඟාවී ඇත | | නිපුණතා මට්ටම ළඟා වීනැත | |
| 1. මාතෘකාව පැහැදිලිව හඳුන්වා දීමේ ප්‍රවණතාවය | 4 | 3 | 2 | 1 |
| 2. මාතෘකාවට අදාළ වන පරිදි කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානය | 4 | 3 | 2 | 1 |
| 3. තොරතුරු නිර්මාණාත්මකව ද, තර්කානුකූලව ද ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| 4. අදාළ මුහුණුවර, අංග චලනයන් හා කාල කළමනාකරණය | 4 | 3 | 2 | 1 |
| 5. සාරාංශකරණය, තීරණ හා එම තීරණවලට හේතු ඉදිරිපත් කිරීම | 4 | 3 | 2 | 1 |
| ලැබූ ලකුණුවල එකතුව | | | | 20 |
| ලැබූ මුළු අවසන් ලකුණ = $\frac{\text{ලකුණු}}{2}$ | | | | 10 |